# වාර්ෂික වාර්තාව

# ஆண்டு அறிக்கை

# Annual Report

# 2012



ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

இலங்கை அரச மருந்தகக் கூட்டுத்தாபனம்

State Pharmaceuticals Corporation of Sri Lanka

## අන්තර්ගතය


- අපගේ දර්ශනය, මෙහෙවර, පරමාර්ථ සහ අපගේ පාඨය 01
- ප්‍රතිඵල සාරාංශය 02
- ආයතනික සමාජමය වගකීම 03
- අධ්‍යක්ෂ මණ්ඩලය හා ආයතනික තොරතුරු 04-05
- සභාපතිතුමාගේ ප්‍රකාශය 06
- කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ ප්‍රකාශය 07-08
- අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශය 09-10
- විගණන කමිටුවේ ප්‍රකාශය 11
- ශේෂ පත්‍රය 12
- ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය 13
- ආදායම් ප්‍රකාශය 14
- ඔසුසල ආදායම් ප්‍රකාශය 15-16
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය 17
- ගිණුම්කරණ ප්‍රතිපත්ති 18-26
- ගිණුම් සඳහා සටහන් 27-53
- විගණකාධිපතිගේ වාර්තාව 54-72
- විගණකාධිපතිගේ වාර්තාවට සභාපතිතුමා අර්ථ නිරූපණය කිරීම 73-80
- මානව සම්පත් විශ්ලේෂණය 81
- වසර දහයක සංඛ්‍යාත්මක තොරතුරු 82
- විකුණුම් ජාලය 83


**ඔබේ සුවසෙත අපේ පැතුමයි**

## අපගේ දර්ශනය

නීරෝගී උද්යෝගීමත් ජාතියක් ගොඩනැගීමට
දායක වීම

## අපගේ මෙහෙවර

“උසස් තත්ත්වය සහතික කල ආරක්ෂාකාරී හා ප්‍රතිඵලදායක ඖෂධ හා සනීපාරක්ෂක උපකරණ සාධාරණ මිලට සපයා ජනතාවට සේවා සපයන ප්‍රධාන ආයතනය බවට පත්වෙමින් ඖෂධීය නාමයෙන් යුතු ඖෂධ භාවිතය ප්‍රවර්ධනය කිරීම”

## අපගේ පරමාර්ථ

ජනතා සේවයට ප්‍රමුඛතාවය

ගුණාත්ත්ව බව ආරක්ෂා කිරීම

අසමසම අවංකභාවය

විශ්වාසදායක හවුල්කරු සහ ක්‍රියාකාරී සාමාජික

විශිෂ්ඨ කාර්යසාධනය සඳහා බැඳීම

අවශ්‍යතා හඳුනාගැනීම

## අපගේ පාඨය

ඔබේ සුවසෙත අපේ පැතුමයි

# රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

**ප්‍රතිඵල සාරාංශය**

| විස්තරය | 2012<br>රු: ' 000 ' | විචලනය<br>(%) | 2011<br>රු: ' 000 ' | 2010<br>රු: ' 000 ' |
|---|---|---|---|---|
| රාජ්‍ය ඖෂධ සංස්ථාවේ විකුණුම් | 5,001,673 | 4.07 | 4,806,170 | 4,197,759 |
| රාජ්‍ය බෙහෙත් ගබඩාවට කල සැපයුම් | 16,608,492 | 32.14 | 12,569,290 | 10,968,571 |
| **මුළු ආදායම** | **21,610,165** | **24.37** | **17,375,460** | **15,166,330** |
| දළ වෙළඳ ලාභය - රා.ඖ.සං | 991,541 | **(4.98)** | 1,043,453 | 995,371 |
| දළ අතිරික්තය - රා.බෙ.ග | 1,193,214 | 52.83 | 780,735 | 688,145 |
| දළ අතිරික්තය | **2,184,756** | **19.77** | **1,824,188** | **1,683,516** |
| වෙනත් ආදායම් | 15,105 | **(34.98)** | 23,231 | 20,414 |
| පරිපාලන වියදම් | (654,910) | (6.66) | (614,019) | (605,475) |
| වෙනත් මෙහෙයුම් වියදම් | (745,230) | (51.28) | (492,631) | (285777) |
| මූල්‍ය පිරිවැය | (17) | 99.54 | (3,661) | (17734) |
| බැංකු අයිරා මත පොළී | (339,035) | 19.13 | (419,235) | (315070) |
| මූල්‍ය ආදායම් | 3,944 | (3.85) | 4,102 | 3,900 |
| **බදු ගෙවීමට පෙර ලාභය** | **464,612** | **44.30** | **321,975** | **483,774** |
| භාණ්ඩාගාර අයබදු | - | - | 15,000 | 60,000 |
| බදුගෙවීම් | 205,282 | (10.15) | 228,473 | 0 |
| **එකතු විස්තිරණ ආදායම** | **245,048** | **172.80** | **89,827** | **179,867** |
| රඳවාගත් ලාභ | 3,622,539 | 7.26 | 3,377,491 | 3,287,664 |
| කොටස් ප්‍රාග්ධනය හා සංචිත | 125,117 | - | 125,117 | 125,116 |
| ජංගම නොවන වත්කම් | 1,709,018 | 6.45 | 1,605,438 | 1,561,496 |
| ජංගම වත්කම් | 13,269,595 | 52.13 | 8,722,712 | 7,881,607 |
| ජංගම නොවන වගකීම් | 124,558 | 18.53 | 105,082 | 113,350 |
| ජංගම වගකීම් | 11,106,399 | 65.26 | 6,720,460 | 5,916,973 |
| ශුද්ධ ජංගම වත්කම් | 2,163,196 | 8.04 | 2,002,252 | 1,964,634 |
| **මූලික අනුපාත** | | | | |
| දළ ලාභ අනුපාතය (%) රා.ඖ.සං | 19.82% | | 21.71% | 23.71% |
| දළ ලාභ අනුපාතය (%) රා.බෙ.ග | 7.18% | | 6.21% | 6.27% |
| දළ අතිරික්තයට විකුණුම් අනුපාතය (%) | 10.1% | | 10.5% | 11.1% |
| යෙදවූ ප්‍රාග්ධනයට ප්‍රතිලාභ (%) | 21.3% | | 21.1% | 23.8% |
| පොළී ආවරණය (වාර) | 2.4 | | 1.8 | 2.4 |
| ස්කන්ධයට මුළු වත්කම් අනුපාතය (%) | 1:4 | | 1:2.9 | 1:2.8 |
| යෙදවූ ප්‍රාග්ධනයට විකුණුම් (වාර) | 5.7:1 | | 4.9:1 | 4.4:1 |
| ජංගම අනුපාතය (වාර) | 1.19:1 | | 1.31:1 | 1.33:1 |
| ද්‍රවශීලතා අනුපාතය (වාර) | 1.02:1 | | 0.86:1 | 0.7:1 |
| තොග පිරිවැටුම් අනුපාතය (වාර) | 3.57 | | 3.79 | 3.65 |
| **වෙනත් තොරතුරු** | | | | |
| සේවක සංඛ්‍යාව | 785 | | 755 | 747 |
| සේවකයෙකුගේ ඉපයීම (රු) | 591.9 | | 426.5 | 647.6 |
| සේවකයෙකුට විකුණුම් (රු) | 27,529 | | 23,014 | 20,303 |

## සාංගමික සමාජමය වගකීම



නීරෝගී උද්යෝගිමත් ජාතියක් ගොඩනැඟීමට දායකවීම රාජ්‍ය ඖෂධ සංස්ථාවේ පරමාර්ථයයි.

සෞඛ්‍ය පහසුකම් අත්‍යාවශ්‍ය ජනකොටස් වෙතට ලබාදීම සඳහා පසුගිය දශක හතර තුළ නව මං සොයමින් රාජ්‍ය ඖෂධ සංස්ථාව දිගු ගමනක් පැමිණ ඇත. සේවා වනිතා ඒකකය මඟින් 2012 සැප්තැම්බර් 29 වන දින මන්නාරම සිලාවතුර සවරියපුරම් විද්‍යාලයේදී ප්‍රදේශවාසීන් දෙදාහක පමණ පිරිසක් වෙනුවෙන් සංවිධානය කල සෞඛ්‍ය කඳවුර සඳහා සංස්ථාව අනුග්‍රහය දැක්විය.



රු 252,750 ක් වටිනා සීනි, පරිප්පු, පාන් පිටි සැමන් වැනි වියළි ආහාර මලු සෞඛ්‍ය කඳවුර සඳහා පැමිණි ප්‍රදේශයේ දුප්පත් ජනතාව අතර බෙදා හරින ලදී. අත්‍යවශ්‍ය ඖෂධ වර්ගද ජනතාවට ප්‍රදානය කරන ලදී.



2012 වසරේදී, රටපුරා පැවැත්වූ සෞඛ්‍ය කඳවුරු වලදී රු 957,683 ක් වටිනා බෙහෙත් ද්‍රව්‍ය දුප්පත් ජනතාව අතර බෙදා දෙන ලදී.



"ඵලදායි ඖෂධ භාවිතය" බටහිර ඖෂධ භාවිතය පිළිබඳ වැඩිහිටියන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. එක් වැඩසටහනක් යුධහමුදා රෝහලේදීත් අනෙක කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගුරුවරුන් දැනුවත් කිරීම සඳහාද පවත්වන ලදී. මෙම වැඩසටහන් වලදී ඖෂධ ක්ශේත්‍රයේ වෘත්තිකයන් ගෙන් කරුණු විමසා දැනගැනීමේ දුර්ලභ අවස්ථාවක් සහභාගි වුවන් සඳහා ලබාදී තිබුණි.

## අධ්‍යක්ෂ මණ්ඩලය හා ආයතනික තොරතුරු
## අධ්‍යක්ෂ මණ්ඩලය

**මහාචාර්ය එස්.ඩී. ජයරත්න - සභාපති**

මහාචාර්ය එස්.ඩී ජයරත්න මහතා වෛද්‍ය විද්‍යාව පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා අංශයේ වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය වරයෙකු වන අතර දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ ගරු සේවයෙහි නියුතු උපදේශකවරයෙක් ලෙසත් කොළඹ පොලිස් රෝහලේ බාහිර උපදේශකවරයෙක් වශයෙනුත් කටයුතු කරයි.

මහාචාර්ය එස්.ඩී ජයරත්න මහතා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙක් ලෙස 2005 වසරේ සිට 2010 මැයි මස 13 දින දක්වා කටයුතු කර ඇත. 2010 මැයි මස 14 දින සිට ඔහුව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපතිවරයා ලෙස තෝරාපත් කරන ලදි. මෙයට අමතරව මහාචාර්ය එස්.ඩී ජයරත්න මහතා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙසද කටයුතු කරනු ලබයි.

**ආර්.එල්. ධර්මතිලක මහතා- කළමනාකාර අධ්‍යක්ෂ**

ආර්.එල් ධර්මතිලක මහතා වසර 26 කට වැඩි කාලයක් දේශීය හා විදේශීය හෝටල් කළමනාකරණය හා සංචාරක ක්ෂේත්‍රය පිළිබඳ හසල දැනුමක් ඇති ප්‍රවීනයෙකි. ඔහු ක්ලෙයාර් මවුන්ට් හෝටල් පාසලේ හෝටල් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරියෙකු වන අතර 2010 මැයි මසට පෙර වසරක කාලයක් ඔහු රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා වශයෙන් කටයුතු කර ඇති අතර ඉන් පසුව මේ දක්වා සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරයි. එසේම ඔහු රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේද අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකි. ධර්මතිලක මහතා මුළු දිවයිනටම සාම විනිසුරුවරයෙක් ලෙසද කටයුතු කරයි.

**මර්වින් ගුණසේන මහතා - අධ්‍යක්ෂ**

මර්වින් ගුණසේන මහතා නීතිය පිළිබඳ උපාධිධාරියෙකු වන අතර සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපතියෙකි. ඔහු කොළඹ සහ මාතර ප්‍රදේශයේ සේවයේ නියුතු පළපුරුදු නීතිවේදියෙකි.
මර්වින් ගුණසේන මහතා මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යංශයේ විධායක අධ්‍යක්ෂවරයෙක් ලෙසත්, සමාජ ආරක්ෂණ මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරයෙක් ලෙසත්, මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හැටියටත් කටයුතු කර ඇත. එසේම කෘෂිකර්ම සහ ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා හැටියටද කටයුතු කර ඇත.

**එස්.එම්.එන්. ලලිත් සේනානායක මහතා - අධ්‍යක්ෂ**

ලලිත් සේනානායක මහතා වරලත් ගණකාධිකාරී වරයෙකි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ රාජ්‍ය පරිපාලනය පිළිබඳ උපාධිධාරියෙකු වන අතර විවෘත විශ්ව විද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාධාරියෙකි.

සේනානායක මහතා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙක් ලෙස 2010 මැයි මස සිට කටයුතු කරයි. වර්තමානයේ ඔහු ෆයිනැන්සල් කන්සල්ටන්ට් ඇන්ඩ් එලයිඩ් සර්විසස් ආයතනයේ සහ මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යංශයේ අධ්‍යක්ෂවරයෙකි. ඔහු ටියුඩර් ඩී පෙරේරා සමාගම (වරලත් ගණකාධිකාරිවරු) ආයතනයේ ජ්‍යෙෂ්ඨ හවුල්කරුවෙකි. සේනානායක මහතා කිහිප වතාවක්ම රාජ්‍ය දැව සංස්ථාව, සිලෝන් ෆර්ටිලයිසර් කම්පැනි සහ වී අලෙවි මණ්ඩලය ඇතුළු සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ගණනාවකම අධ්‍යක්ෂ මණ්ඩලවල කටයුතු කර ඇත.

**මහාචාර්ය රංජනී ගමගේ මහත්මිය - අධ්‍යක්ෂ**

ශ්‍රී ලංකා ජාතික රෝහලේ බාහිර මහාචාර්යවරයෙක් වශයෙනුත් ස්නායුවේදය සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරිය වශයෙනුත් කටයුතු කරන අතර ජාතික රෝහලේ ස්නායු වෛද්‍ය ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධාරිනිය වශයෙන්ද කටයුතු කරයි. කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි පීඨයේ බාහිර මහාචාර්යවරියක් වන ඇය අපස්මාර මර්ධන ව්‍යාපාරයේ සභාපතිනිය වශයෙන්ද කටයුතු කරයි. එසේම අපස්මාරයට එරෙහි ශ්‍රී ලංකා එක්සත් මණ්ඩලයේ සභාපතිත්වයද ඇය විසින් දරණු ලබයි. ශ්‍රී ලංකා ස්නායු වෛද්‍ය සංගමයේ හිටපු සභාපතිනිය වන ඇය කොළඹ විශ්ව විද්‍යාලයේ සනාතන සභාවේ සාමාජිකාවකි.

**එච්.එම්. අජිත් චන්ද්‍රා මහතා -අධ්‍යක්ෂ**

එච්.එම්.අජිත් චන්ද්‍රා මහතා වසර 27 ක පළපුරුද්දක් ඇති ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකි. වර්තමානයේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවේ විදේශ ආධාර කළමනාකරණ අධ්‍යක්ෂ ලෙස කටයුතු කරයි. අජිත් චන්ද්‍රා මහතා PERC ආයතනයේ මූල්‍ය හා පරිපාලන අධ්‍යක්ෂ ලෙස කටයුතු කරන අතර ලෝක බැංකු අරමුදල මඟින් පිහිටුවන ලද උපාධිධාරීන්ගේ අධ්‍යාපන කටයුතු දියුණු කිරීමේ සහ තත්ත්වය පවත්වාගෙන යාමේ ව්‍යාපෘතියේ 2003 වසරේ සිට 2006 වසර දක්වා මූල්‍ය කළමනාකාරවරයා ලෙස කටයුතු කරන ලදි. ඔහු ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිවරයා ලෙසද කටයුතු කර ඇත. අජිත් චන්ද්‍රා මහතා රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, ප්‍රසම්පාදන කළමනාකරණය සහ පළාත් පාලන මූල්‍ය කළමනාකරණය පිළිබඳව මනා පළපුරුද්දක් ඇත්තෙකි.

අජිත් චන්ද්‍රා මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උපාධිධාරියෙකි. එසේම කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිධාරියෙකි. ඔහු UNDP, SAARC සහ ADB සංවිධාන මඟින් මෙහෙයවන මූල්‍ය ව්‍යාපෘති, භාණ්ඩාගාර කළමනාකරණය සහ ණය කළමනාකරණය වෙනුවෙන් පවත්වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කර ඇත. අජිත් චන්ද්‍රා මහතා SLIDA, PGIM හා ශ්‍රී ලංකා පදනම් ආයතන වල මූල්‍ය කළමනාකරණය, ප්‍රසම්පාදන කළමනාකරණය සහ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ බාහිර උපදේශක වරයෙක් ලෙසට කටයුතු කරයි. එසේම රාජ්‍ය මූල්‍ය සංවර්ධන ගණකාධිකරණ ආයතනයේ සහ AAT ආයතනයේ සාමාජිකයෙකි.

**වෛද්‍ය පාලිත මහීපාල - අධ්‍යක්ෂ**

වෛද්‍ය පී. මහීපාල මහතා සෞඛ්‍ය අමාත්‍යංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් ලෙසට කටයුතු කරනු ලබයි. ඔහු වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ වෛද්‍ය පරිපාලනය පිළිබඳ විශේෂඥයෙකි. ඒ මහතා ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපතියෙකි. ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපතියෙකු වන අතර වෛද්‍ය පරිපාලනය පිළිබඳ ආචාර්යවරයෙකි. තවද ආර්ථික සංවර්ධන හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරියෙකි.

ජල සැපයුම් හා ජලාපවාහන මණ්ඩලය, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව, විජය කුමාරතුංග රෝහල, ශ්‍රී ජයවර්ධනපුර රෝහල, ශ්‍රී ලංකා ප්‍රවාහන වෛද්‍ය මණ්ඩලය සහ ජාතික දුම්කොළ සහ මධ්‍යසාර අධිකාරියේ අධ්‍යක්ෂවරයෙක් ලෙසද කටයුතු කරයි.

**ආයතනික තොරතුරු**

**අධ්‍යක්ෂ මණ්ඩලය**

| | | |
|---|---|---|
| මහාචාර්ය එස්.ඩී. ජයරත්න | - | සභාපති |
| ආර්.එල්.ධර්මතිලක මහතා | - | කළමනාකාර අධ්‍යක්ෂ |
| වෛද්‍ය පී.පී . මහිපාල | - | අධ්‍යක්ෂ |
| මහාචාර්ය රංජනී ගමගේ මහත්මිය | - | අධ්‍යක්ෂ |
| මර්වින් ගුණසේන මහතා | - | අධ්‍යක්ෂ |
| ලලිත් සේනානායක මහතා | - | අධ්‍යක්ෂ |
| එච්.එම්. අජිත් චන්ද්‍රා මහතා | - | අධ්‍යක්ෂ |

**කළමනාකරණ මණ්ඩලය**

| | |
|---|---|
| කේ.එම්.ඩී.ආර්. දසනායක මහතා | සාමාන්‍යාධිකාරි |
| එම්.පී. කුරුප්පු මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අලෙවි) |
| එන්.පී. මහින්ද මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය) |
| ඩබ්ලිව්.ඒ.එස්.ඩී.කේ. පෙරේරා මහත්මිය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (තාක්ෂණ,රසායනාගාර හා නිෂ්පාදන) |
| එච්.පී.ඩබ්ලිව්. ධර්මසේන මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් සහ පරිපාලන) |
| පී.කේ.එස්.එස්. කුලසූරිය මහත්මිය | වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (ප්‍රසම්පාදන හා ආනයන) |

**ජ්‍යෙෂ්ඨ කළමනාකරණය**

| | | |
|---|---|---|
| එස්.එම්.ඒ.ඩී.එස්.එච්. සමන්දප්පෙරුම මහත්මිය | කළමණාකරණ ගණකාධිකාරිණී | |
| පී. ඩී. ගුණසේකර මහත්මිය | ගණකාධිකාරිණී | |
| පී. දසනායක මහත්මිය | ආනයන කළමනාකාරිණී | |
| කේ.පී.සී. ශාන්තිමාලා මහත්මිය | තාක්ෂණ කළමනාකාරිණී | |
| යූ. ලොකුසූරිය මහතා | අභ්‍යන්තර විගණක | |
| පී.කේ. විජේරත්න මහත්මිය | තත්ත්ව ආරක්ෂණ රසායනාගාර කළමනාකාරිණී | |
| ඩී.පී. අජිත් ලියනගේ මහතා | කළමනාකරු - තොරතුරු පද්ධති | |
| සී.කේ. ජයවර්ධන මහත්මිය | ආනයන කළමනාකාරිණී | |
| එම්.ඒ.වී.අයි. කුමාරසිරි මහතා | ක්ෂේත්‍ර කළමනාකරු - බෙදාහැරීම් පද්ධති සමාලෝචන | |
| ඩබ්. යූ. සමරනායක මහතා | කළමනාකරු - ඔසුසල කොළඹ 07 | |
| පී.කේ.ආර්. ප්‍රනාන්දු මහතා | වාප්පු කළමනාකරු | |
| සී.එස්. විතානගේ මෙනවිය | අලෙවි කළමනාකාරිණී | |
| එච්.එච්. පියදිගම මහත්මිය | ගණකාධිකාරිණී | |
| ඩී.එන්. දේවසුරේන්ද්‍ර මහත්මිය | ගණකාධිකාරිණී | |
| පී.ඒ.යූ. විජේවර්ධන මහත්මිය | නීති නිළධාරිණී සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | |
| පී.එම්.බී.ආර්. සෝමතිලක මහතා | නිෂ්පාදන කළමනාකරු | |
| එම්.ඩබ්ලිව්. පුෂ්පා ජෙනට් මහත්මිය | කළමනාකාරිණී - මානව සම්පත් | |
| ඒ.එච්. අල්විස් මහත්මිය | කළමනාකාරිණී - පසු බෙදාහැරීම් මෙහෙයුම් | |
| එස්.එල්.ඩී.එස්. ජීවකරත්න | විකුණුම් කළමනාකරු | |
| එන්.කේ.ඒ.පී ගුණතිලක | කළමනාකාරිණී - ප්‍රවර්ධන හා ප්‍රචාරක | ( 2012.05.08 සිට) |
| ජී.ඩී.ජේ. පුෂ්පකුමාර මහතා | කළමනාකරු - ගබඩා හා තොග පාලන | ( 2012.05.10 සිට) |
| ඩබ්ලිව්.ඒ.එස්. වික්‍රමාරච්චි මහතා | කළමනාකරු - පර්යේෂණ හා නව ව්‍යාපෘති | ( 2012.12.03 සිට) |
| ඒ.පී. හපන්ගම මහතා | ගණකාධිකාරි | ( 2012.04.10 සිට) |
| එම්.බී ජයවර්ධන මහතා | කළමනාකරු -ගබඩා හා තොග පාලන | ( 2012.04.10 සිට) |
| එච්.ඩී.එන්.ආර්.ගුණසේකර මහතා | කළමනාකරු - ඔසුසල කොළඹ 04 | ( 2012.08.02 සිට) |
| ඩී.ජේ.පීරිස් මහතා | කළමනාකරු - ඔසුසල පානදුර | ( 2012.08.02 සිට) |
| ඩී.ආර්.කුරුප්පුමුල්ලගේ | කළමනාකරු - ඔසුසල කොළඹ 01 | ( 2012.08.02 සිට) |

**විගනන කමිටුව**

| | |
|---|---|
| එච්.එම්. අජිත් චන්ද්‍රා මහතා | සභාපති |
| මහාචාර්ය රංජනී ගමගේ මහත්මිය | අධ්‍යක්ෂ |
| මර්වින් ගුණසේන මහතා | අධ්‍යක්ෂ |
| ලලිත් සේනානායක මහතා | අධ්‍යක්ෂ |

**විගණකවරු** — විගණකාධිපතිතුමා, විගණකාධිපති දෙපාර්තමේන්තුව, අංක. 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.

**බැංකු කරුවෝ**

| | |
|---|---|
| ලංකා බැංකුව | ආයතනික ශාඛාව, ලංකා බැංකු මාවත, කොළඹ 01. |
| මහජන බැංකුව | ජාත්‍යන්තර අංශය, තැ.පෙ. 437 ඒ.එන්.සී.එල්. ගොඩනැගිල්ල, ඩී.ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10. |
| ස්ටෑන්ඩර්ඩ් චාටඩ් බැංකුව | තැ.පෙ. 112, 37 යෝර්ක් වීදිය, කොළඹ 01. |
| කොමර්ෂල් බැංකුව | නගර ශාඛාව, 98 යෝර්ක් වීදිය, කොළඹ 01. |

**ලියාපදිංචි කාර්යාලය** — නො 75 ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01.

**සංස්ථාපනය කල දිනය** — 1971 සැප්තැම්බර් 21.



## සභාපතිතුමාගේ ප්‍රකාශය

ඖෂධ හා ශල්‍ය උපකරණ සඳහා වූ ඉල්ලුම දිගින් දිගටම වර්ධනය වූ බැවින් 2012 වර්ෂය රාජ්‍ය ඖෂධ සංස්ථාවට ප්‍රතිඵලදායක එමෙන්ම කාර්ය බහුල වර්ෂයක් විය. රජයේ බෙහෙත් ගබඩාවට කල සැපයුම් රු. බිලියන 16 ඉක්මවා ගිය අතර එය 2011 වසර හා සැසඳීමේදී රු බිලියන 4 ක වර්ධනයක්වේ. රාජ්‍ය ඖෂධ සංස්ථාවේ විවෘත වෙළඳ පල සඳහා කරන ලද විකුණුම් ද රු බිලියන 4.8 සිට රු බිලියන 5.1 දක්වා වර්ධනය විය. 2012 වර්ෂයේ දී නව රාජ්‍ය ඔසුසැල් 3 ක් නව බෙදාහරින්නන් 4 ක් හා වරලත් ඔසුසැල් 8 ක් විවෘත කරන ලදී.

ඖෂධ ප්‍රසම්පාදනයේ දි ඒවායේ ආරක්ෂාකාරිබව, ප්‍රතිඵලදායකබව, තත්ත්වාරක්ෂණය ප්‍රමුඛතම අවශ්‍යතාව වන බැවින්, ඖෂධ හා ශල්‍ය උපකරණ ප්‍රසම්පාදනය සංකීර්ණ ක්‍රියාවලියක් වේ, මෙම ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වඩා වර්ධනය කිරීම අපගේ ප්‍රධාන උත්සාහයයි. ප්‍රථම වතාවට රාජ්‍ය ඖෂධ සංස්ථාව සැපයුම් කරුවන්ගේ ඖෂධ වල යෝග්‍යතාවය සැපයීමට පෙර සොයාබැලීමට කටයුතු යොදා ඇත. මෙය නිසැකයෙන්ම සංස්ථාවේ ඖෂධ වල ගුණාත්වය වර්ධනය වීමට හේතුවක් වේ. ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යංශයේ හා රාජ්‍ය ඖෂධ සංස්ථාවේ නිලධාරීන් ඉන්දියාවට ගොස් ඉන්දිය රජයේ සෞඛ්‍ය ඇමතිතුමා හා එරට ඉහල නිලධාරීන් මුණගැසී දෙරටේ ඖෂධ අධිකාරීන් අතර සහයෝගීතාව වර්ධනය කරගැනීමට කටයුතු කිරීම නිසා ඉන්දිය ඖෂධ අධිකාරිය හා රාජ්‍ය ඖෂධ සංස්ථාව අතර නව සහයෝගීතාවයක් වර්ධනයවී ඇත. මෙම කටයුත්තට මුල පිරීම සම්බන්ධව ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාට මම කෘතඥ වෙමි.

2012 වසර තුලදී අපහට ලබාදුන් සහයෝගය හා මාර්ගෝපදේශකත්වය වෙනුවෙන් ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාටත්, සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමාටත්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් තුමා ඇතුළු නිළධාරීන්ට මාගේ ස්තුතිය පිරිනමමි. තවද සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමා ඇතුළු නිළධාරී මණ්ඩලයට අපගේ කෘතඥතාවය පුද කරමු. අපගේ අරමුණු සහ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා කැපවීමෙන් සහ වගකීමෙන් යුතුව ලබාදුන් දායකත්වය වෙනුවෙන් අපගේ අධ්‍යක්ෂ මණ්ඩලයටත්, කළමනාකරණයට සහ සංස්ථාවේ සියළුම සේවකයන් හට පෞද්ගලිකවම මාගේ ස්තුතිය පුද කරමි. තවද සැපයුම් කරුවන්ටත්, බෙදාහරින්නන්ට හා නියෝජිතයින්ට හා “SPC” නිෂ්පාදන කෙරෙහි විශ්වාසය තැබූ මහ ජනතාවටත් මාගේ ස්තුතිය පරිනමමි. ගුණාත්මක, ප්‍රත්‍යක්ෂ හා ලාභදායි ඖෂධ සහ සෞඛ්‍යාරක්ෂිත අයිතම සපයන ප්‍රධානතම ආයතනය ලෙස SPC නාමය ශ්‍රී ලංකාවේ වෙසෙන සෑම ජනතාවකගේම හදවතේ සහ මතකයේ රැඳෙනු ඇතැයි කියා මා උනන්දුවෙන් යුතුව බලාපොරොත්තු වෙමි.



**මහාචාර්ය එස්.ඩී. ජයරත්න**
**සභාපති**



## කළමනාකාර අධ්‍යක්‍ෂතුමාගේ මූල්‍ය සමාලෝචනය

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ 2012 වසරේ කාර්යසාධනය පිළිබඳ කළමනාකරණ අධ්‍යක්ෂ තුමාගේ වාර්තාව මම සතුටින් ඉදිරිපත් කරමි. සලකා බලන වර්ෂයේදී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මෙතෙක් වාර්තා කරගත් ඉහළම පිරිවැටුමවූ රු 21,610 ක පිරිවැටුමක් සටහන් කරගෙන ඇති අතර එය පෙර වසරට වඩා 24% වර්ධනයක් වේ. සෞඛ්‍ය අමාත්‍යංශයේ වෛද්‍ය සැපයුම් අංශයට කළ ඖෂධ සැපයුම් වල සීඝ්‍ර වර්ධනය මෙයට හේතු විය.

රජයේ රෝහල් වලට ඖෂධ හා උපකරණ අඛණ්ඩව බෙදාහැරීම සඳහා රජයේ බෙහෙත් ගබඩාවට තත්ත්ව ආරක්ෂිත ඖෂධ හා උපකරණ සපයන එකම ආනයනකරු වන්නේ රාජ්‍ය ඖෂධ සංස්ථාවයි. ඒ හැරුනු විට ඖෂධ සංස්ථාව උතුරු නැගෙනහිර ද ඇතුළුව දිවයින පුරා විසිරී ඇති තම පුළුල් හා ශක්තිමත් බෙදාහැරීමේ ජාලය හරහා ඖෂධ ආනයනය කර විවෘත වෙළඳපලට බෙදාහරියි.

### මූල්‍ය කාර්යසාධනය




විවෘත වෙළඳපොල මෙහෙයුම් තුලින් රුපියල් මිලියන 5,002 ක පිරිවැටුමක් 2012 වර්ෂය තුලදී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වාර්තා කරගෙන ඇත. එය පසුගිය වසරේ පිරිවැටුම වූ රුපියල් මිලියන 4,806 හා සංසන්දනය කිරීමේදී 4% ක වැඩි වීමකි. මෙම විකුණුම් වර්ධනයට ප්‍රධානම හේතුව වන්නේ ප්‍රතිඵල සහිත ප්‍රවර්ධන ක්‍රියාකාරකම් වල නියැලෙමින් 2012 වසරේ ඖෂධ සංස්ථාවේ බෙදාහැරීමේ ජාලය පුළුල් කිරීමයි. රාජ්‍ය ඖෂධ සංස්ථාවේ විකුණුම් ජාලය ශක්තිමත් කිරීමේ අරමුණෙන් සංස්ථාව දැනට ක්‍රියාත්මක නොවන ප්‍රදේශ ආවරණය වන පරිදි 2012 වසරේදී නව බලයලත් ඔසුසැල් 8ක් හා නව බෙදාහරින්නන් 4 ක් පත්කරන ලදි. 2012 වසරේදී රාගම හා තංගල්ල නගරවල නව රාජ්‍ය ඔසුසැල් පිහිටුවීය. මෙම ඔසුසැල් ද සමඟ වසර අවසානයේදී නව රාජ්‍ය ඔසුසැල් 28 ක් නියෝජිත ඔසුසැල් 188 ක් බෙදාහරින්නන් 52 ක් හා බලයලත් වෙළඳුන් 12 ක් විවෘත වෙළඳ පොලේ ක්‍රියාත්මක විය.

2012 වර්ෂය තුලදී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව බදු පෙර ලාභය ලෙස රුපියල් මිලියන 464.6 ක් වාර්තා කරගෙන ඇත. මෙය පසුගිය වසරේ බදු පෙර ලාභය වූ රුපියල් මිලියන 321.9 හා සංසන්දනය කිරීමේ දී 44% ක වර්ධනයකි. ලාභයේ මෙම වර්ධනයට ප්‍රධාන හේතුව වන්නේ වියදම් පාලනය කරමින් විකුණුම් වර්ධනය කර ගැනීම හා රාජ්‍ය භාණ්ඩාගාරය විසින් බැංකු අයිරා පොලිය සංස්ථාව වෙත ප්‍රතිපූරණය කිරීමයි..

ප්‍රවර්ථන වර්ෂය තුලදී රුපියල් මිලියන 16,608 ක සෞඛ්‍යාරක්ෂිත අයිතම වෛද්‍ය සැපයුම් අංශය වෙත සපයා ඇත. එය 2011 වසරේ වාර්තාවු රු 12,569 හා සංසන්දනය කර බලනකල 14% ක වර්ධනයකි.

රජයේ බෙහෙත් ගබඩාවට කල සැපයුම් වෙනුවෙන් 2012 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා සංස්ථාව විසින් ගෙවන ලද බැංකු අයිරා පොලියවූ රු මිලියන 248 ක් රාජ්‍ය භාණ්ඩාගාරය විසින් ප්‍රතිපූරණය කරන ලදි. මේ හේතුවෙන් බැංකු අයිරා පොලිය රු මිලියන 339 දක්වා අඩුවිය. මෙය 2011 වසර හා සසඳන කල 20% ක අඩුවීමකි.

**බදු පෙර ලාභය**




### විකුණුම් සහ වෙළඳ ප්‍රවර්ධනය

2012 වර්ෂය තුලදී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව රටපුරා වෛද්‍ය ක්ෂේත්‍රය ආශ්‍රිත සිදුවීම් ආවරණය වන පරිදි SPC ඖෂධ භාවිතය පිළිබඳව වෛද්‍ය වෘත්තිකයන් සහ මහ ජනතාව දැනුවත් කරන ලදි.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ නිර්මාතෘ මෙන්ම ආරම්භක සභාපතිවරයා වූ මහාචාර්ය සේනක බිබිලේ මහතාට ගෞරව කිරීමක් වශයෙන් අප විසින් “මහාචාර්ය සේනක බිබිලේ ගුණානුස්මරණ ශිෂ්‍යත්ව” වැඩසටහන තවදුරටත් පවත්වාගෙන යමින් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයන්හි වෛද්‍ය පීඨ 6 ක ඖෂධ විද්‍යාව (Pharmacology) පිළිබඳව ඉහල දැනුමක් ඇති සිසුන් හට ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදි. SPC ඖෂධ පිළිබඳව පාසල් සිසුන්ව දැනුවත් කිරීමේ අරමුණින් “මහාචාර්ය සේනක බිබිලේ අභියෝගතා ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන” සංවිධානය කරන ලදි. එම ප්‍රවර්ධන ක්‍රියාමාලාවේම කොටසක් ලෙස “සුව පියස”. “සුභාරති” වැනි විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍යයෙන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

### තාක්ෂණ හා රසායනාගාරය

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව තමන් සතු තත්ත්ව රසායනාගාරයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට හා පවත්වාගෙන යාම සඳහා කැපවීමෙන් යුතුව කටයුතු කරන ලදි. ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මඟින් ගෙන්වා බෙදාහරින සියළුම ඖෂධ වල ගුණාත්මක භාවය සැමවිටම ආරක්‍ෂා කරගැනීම සඳහා අදියර හතරක් යටතේ පරීක්‍ෂාවට ලක් කරනු ලබයි. එනම් “ටෙන්ඩර් නියැදි පරීක්‍ෂාව”, “නැව්ගත කිරීමට පෙර ලබාගත් නියැදි පරීක්‍ෂාව”, “බෙදාහැරීමට පෙර නියැදි පරීක්ෂාව” සහ “වෙළඳපොල පැමිණිලි මත නියැදි පරීක්‍ෂාව” යි. මෙයට අමතරව වෛද්‍ය සැපයුම් අංශයේ ටෙන්ඩර් සාම්පල් පරීක්ෂාවටද රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථා රසායනාගාරය සම්බන්ධවේ.

### මානව සම්පත් සංවර්ධනය

වර්ෂය අවසන් වනවිට සංස්ථාවේ මුළු ශ්‍රම බලකාය 941 කි. එයින් 785 ක් ස්ථිර සේවකයන් වන අතර ඉතිරි පිරිස පුහුණු ශ්‍රමිකයන්වේ. කැපවීමෙන් සහ අභිප්‍රේරණයෙන් යුතු ශ්‍රම බලකායක් සිටීම සංස්ථාවේ දියුණුවට බලපාන ලද ප්‍රධානම සාධකයයි. ආයතනය තුල ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කර ගැනීම සඳහා සේවකයන් 172 දෙනෙකු දේශීය පුහුණු වැඩසටහන් සඳහාත්, සේවකයන් 04 දෙනෙකු විදේශීය පුහුණු වැඩසටහන් සඳහාත් යොමු කරන ලදි. පසුගිය වසර තුලදී සේවකයන් හට ලබාදෙන ලද සියළුම ප්‍රතිලාභ ඒ ආකාරයෙන්ම 2012 වසර තුලදීත් ලබාදෙන ලදි.

### ස්තුතිය පුද කිරීම

මෙම වර්ධනය සහ ලාභදායකත්වය ලබා ගැනීම සඳහා කැපවීමෙන් කටයුතු කල සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලයටත්, සේවකයන්ටත් මාගේ අවංක ස්තුතිය පුදකරමි.




ආර්. එල්. ධර්මතිලක

කළමනාකාර අධ්‍යක්‍ෂ

## අධ්‍යක්‍ෂ මණ්ඩල වාර්තාව

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙනුවෙන් මේ සමඟ ඉදිරිපත් කරමි.

මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ ජනරාල් විසින් 2003 ජූනි මස 5 වනදා නිකුත් කල චක්‍රලේඛ අංක PED/11 ට අනුව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන 2013 පෙබරවාරි 29 දින විගණකාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදි.

**ආරම්භය**

1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 2 වගන්තිය යටතේ අංක 14976/8 දරණ ගැසට් නිවේදනය මඟින් 1971 සැප්තැම්බර් 22 දින ශ්‍රී ලංකා රජයේ අනුමැතිය හා එවකට කාර්මික හා විද්‍යා කටයුතු අමාත්‍යතුමාගේ නියෝගය මත රුපියල් මිලියනයක මූලික ප්‍රාග්ධනයකින් යුක්තව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව පිහිටුවන ලදි.

### ගණකාධිකරණ ප්‍රතිපත්ති

ප්‍රවර්ථන වර්ෂයේ දි, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව ශ්‍රී ලංකා ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද නව ගිණුම්කරණ ප්‍රමිතයන්ට ( SLFRS/ LKAS) අනුගත විය. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව නව ගිණුම්කරණ ප්‍රමිතයන්ට ( SLFRS/ LKAS) අනුගත වූ ආකාරය සටහන අංක 27 හි දක්වා ඇත.

### ප්‍රතිඵල

ප්‍රවර්ථන වසරෙහි මූල්‍ය ප්‍රතිඵල සහ ස්කන්ධය වෙනස් වීම පිළිබඳ දත්ත ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය හා මූල්‍ය ප්‍රකාශනය මඟින් අනාවරණය කර ඇත.

### ව්‍යාපාර සමාලෝචනය

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය ශේෂ පත්‍රයෙහි දක්වා ඇති අතර ඒ පිළිබඳ ඇගයීමක් කළමනාකාර අධ්‍යක්‍ෂ තුමාගේ වාර්තාවෙහි ඇතුලත් කර ඇත.

### දේපළ, පිරියත හා උපකරණ

පිරිවැයෙන් සමුච්චිත ක්‍ෂය අඩුකර ඉඩම්, ගොඩනැගිලි සහ මෝටර් වාහන වල වටිනාකම දක්වා ඇත. මූල්‍ය ප්‍රකාශනයෙහි ප්‍රවර්ථන වසරට අදාලව දේපළ, පිරියත හා උපකරණ වල සිදුවූ වෙනස්කම් සටහන් අංක 12 මඟින් පැහැදිලි කර ඇත. මෙම සටහනෙහි පෙන්වන වටිනාකම් ඒවායේ වර්තමාන වෙළඳපොල අගය හා ප්‍රමාණාත්මක වෙනස්කම් නොපවති.

### ප්‍රධාන ක්‍රියාකාරකම්

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- විවෘත වෙළඳපොල වෙත ඖෂධ සහ සෞඛ්‍ය ආරක්‍ෂිත අයිතම ආනයනය, මිලදී ගැනීම, විකිණීම සහ බෙදාහැරීම.
- සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙත ඖෂධ සහ සෞඛ්‍ය ආරක්‍ෂිත අයිතම ආනයනය කර සැපයීම.
- ජීවනී, ග්ලූකෝස් සහ බෙන්සිල් බෙන්සොවේට් ක්‍රීම් නිෂ්පාදනය කිරීම සහ විකිණීම.
- රසායනාගාර පහසුකම් සහ වෛද්‍ය පරීක්‍ෂණ පහසුකම් සැපයීම.

පසුගිය මූල්‍ය වර්ෂය තුල සංස්ථාවේ ක්‍රියාකාරකම් වල මූලික වෙනස්වීමක් පෙන්නුම් නොකරයි.

### සංචිත

ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය තුල සංස්ථාවේ මූල්‍ය සංචිත වල සංයුතිය දක්වා ඇත.

### අධ්‍යක්ෂ මණ්ඩලය

2012 දෙසැම්බර් 31 වන දිනට පත්ව සිටි සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| මහාචාර්ය එස්.ඩී. ජයරත්න | - | සභාපති |
| ආර්.එල්.ධර්මතිලක මහතා | - | කළමනාකාර අධ්‍යක්ෂ |
| වෛද්‍ය පී.ජී. මහිපාල මහතා | - | අධ්‍යක්ෂ |
| එච්.එම් අජිත් චන්ද්‍රා | - | අධ්‍යක්ෂ |
| මහාචාර්ය රංජනී ගමගේ මහත්මිය | - | අධ්‍යක්ෂ |
| මර්වින් ගුණසේන මහතා | - | අධ්‍යක්ෂ |
| ලලිත් සේනානායක මහතා | - | අධ්‍යක්ෂ |

### විගණන කමිටුව

රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයන්ට (Public Enterprises Guidline) අනුකූලව සංස්ථාවේ විගණන කමිටුව පිහිටුවා ඇත.

### සාංගමික යහපාලනය/අභ්‍යන්තර පාලනය

ශක්තිමත් සාංගමික යහපාලන මූලධර්ම ක්‍රියාත්මක කිරීම සඳහා සංස්ථාව මඟින් විධික්‍රම හා ක්‍රියාපටිපාටින් ක්‍රියාත්මක කර ඇත. පිටු අංක 11 හි විගණන කමිටු වාර්තාව දක්වා ඇත.

## සේවා නියුක්තිය

සේවකයන්ගේ නිපුනතාවයන් වර්ධනය කිරීම සඳහා යෝග්‍ය වන මානව සම්පත් කළමනාකරණ ක්‍රියාමාර්ග හා ප්‍රතිපත්ති සංස්ථාව මඟින් ක්‍රියාත්මක කරයි.

### ව්‍යවස්ථාපිත ගෙවීම්

රජයට සහ සේවකයන් හට ගෙවීමට නියමිත සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් කලට වේලාවට ගෙවා නිමකර ඇත.

.

### පාරිසරික ආරක්ෂාව

පරිසරයට අහිතකර කිසිදු ක්‍රියාකාරකමකට සංස්ථාව මැදිහත්වී නොමැත.

.

### රජයට දායකත්වය

ලාභ ලබන රාජ්‍ය සංස්ථාවක් ලෙස මෙම වසරේදී රුපියල් මිලියන 238.4 ක් ආදායම් බදු හා භාණ්ඩාගාර අයබදු ලෙස ගෙවා ඇත.

### ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනට පසු ගිණුම් මඟින් ගැලපීමට හෝ හෙළිදරව් කිරීම සඳහා කිසිදු සිදුවීමක් වාර්තාවී නොමැත.

### විගණකවරු

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන රජයේ විගණකාධිපති තුමා විසින් විගණනය කරන ලදි.

**අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝග මත**



............................

**අනුරාධා විජයවර්ධන**
**නීති නිළධාරිණී/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්**

# විගණන කමිටුවේ වාර්තාව

## විගණන කමිටුවේ සංයුතිය

විගණන කමිටුවට අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරු හතර දෙනෙකු ඇතුලත්වන අතර කමිටුවේ සභාපතිවරයා ලෙස මහා භාණ්ඩාගාරය නියෝජනය කරනු ලබන අධ්‍යක්ෂවරයා කටයුතු කරයි. 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ ගිණුම් වර්ෂය තුල විගණන කමිටුවේ සාමාජිකත්වය පහත පරිදි වේ.

| | |
|---|---|
| එච්.එම්. අජිත් චන්ද්‍රා මහතා | විගණන කමිටුවේ සභාපති |
| මහාචාර්ය රංජනී ගමගේ මහත්මිය | අධ්‍යක්ෂ |
| මර්වින් ගුණසේන මහතා | අධ්‍යක්ෂ |
| ලලිත් සේනානායක | අධ්‍යක්ෂ |

සංස්ථාවේ සභාපති, කළමනාකාර අධ්‍යක්ෂ, සාමාන්‍යාධිකාරිතුමා හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය) සම්ක්ෂකයන් ලෙස කමිටු රැස්වීම් වලට සහභාගි විය. විගණන කමිටුවේ ආරාධනයෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් හා පරිපාලන), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අළෙවි) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (තාක්ෂණ) හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන හා වාණිජ) විගණන කමිටු රැස්වීම් වලට සහභාගි විය. අභ්‍යන්තර විගණක, විගණන කමිටු ලේකම් ලෙස කටයුතු කරන ලදි.

## විගණන කමිටුවේ කාර්යභාරය

විගණන කමිටුවේ ප්‍රධාන කාර්යය වනුයේ සංස්ථාවේ පවත්නා අභ්‍යන්තර පාලන පිළිවෙත් අධීක්ෂණය කිරීම හා සමාලෝචනය කිරීමත්, සංස්ථාවේ විගණන කටයුතු සහ මූල්‍ය කටයුතු පිළිබඳව සමාලෝචනයන් හා නිර්දේශයන් ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම නිසියාකාරව ඉටු කිරීම සඳහා ඔවුනට සහාය වීමත් වේ. ඉහත සඳහන් පරමාර්ථයන් ලඟාකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුලදී කමිටුව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් වල නියැලෙන ලදි.

1. සංස්ථාවේ අභ්‍යන්තර පාලනයන් පිළිබඳව සමාලෝචනය කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී අවශ්‍ය සංශෝධන සඳහා වන නිර්දේශයන් ඉදිරිපත් කිරීම.
2. 2012 වසරට අදාල අභ්‍යන්තර විගණන සැලසුම සමාලෝචනය කිරීම හා අනුමත කිරීම.
3. පැනනැගී ඇති කරුනු වල ස්වභාවයත්, අදාල කරුනු වලට කළමනාකරනයේ ප්‍රතිචාරයන් හා අභ්‍යන්තර විගණකගේ නිර්දේශත් ආවරණය වන ලෙස අභ්‍යන්තර විගණන වාර්තාවන් සමාලෝචනය කිරීම.
4. 1971 අංක 38 දරණ මූල්‍ය පනතේ 13(7)(ඒ) සහ 14(2)(සී) වගන්ති ප්‍රකාරව විගණකාධිපති විසින් නිකුත් කර ඇති වාර්තාවන්හි දක්වා ඇති කරුණු සමාලෝචනය කිරීම.
5. රාජ්‍ය ව්‍යවසාය කමිටුවේ (COPE) නිර්දේශ ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම.

## අභ්‍යන්තර විගණන අංශය

විගණන කමිටුවේ මඟපෙන්වීම යටතේ, සමාලෝචිත වර්ෂය තුලදී, අනුමත විගණන සැලැස්ම අභ්‍යන්තර විගණන අංශය මඟින් ක්‍රියාත්මත කරන ලදි. තවද අභ්‍යන්තර විගණන අංශයේ පද්ධති හා මූල්‍ය විගණන ක්‍රියා මාර්ග තුලින් අකාර්යක්ෂම පිළිවෙත් බැහැර කිරීමත්, අභ්‍යන්තර පාලනය වැඩිදියුණු කිරීමත්, පාඩු හා සිදුවිය හැකි වැරදි හා වංචා අවම කර ගැනීමටත් කටයුතු කරන ලදි.

## රැස්වීම්

2012 වර්ෂය තුල විගණන කමිටු රැස්වීම් හයක් පවත්වන ලදි. එහිදී හඳුනාගන්නා ලද අඩුලුහුඩුකම් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලදි. එම අඩුලුහුඩුකම් පිළිබඳව ඉදිරිපත් කරන ලද කමිටුවේ අදහස් සැලකිල්ලට ගනිමින් ඒවා නිවැරදි කර ගැනීම සඳහා වන නිසි ක්‍රියා මාර්ග ගැනීමට කළමනාකාරීත්වය කටයුතු කොට ඇත.



..........................................
එච්.එම්. අජිත් චන්ද්‍රා
**විගණන කමිටුවේ සභාපති**

**රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව**
**2012 දෙසැම්බර් 31 වන දිනට ශේෂපත්‍රය**

| | සටහන | 2012<br>රු | 2012<br>රු | 2011<br>රු | 2011<br>රු |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල පිරියත හා උපකරණ | 12 | 1,667,811,536 | | 1,564,603,189 | |
| දිගුකාලීන බදු ඉඩම් - රත්මලාන | | 10,680,000 | | 10,840,000 | |
| නොනිමි වැඩ - ප්‍රාග්ධනය | | 15,578,367 | | 16,193,567 | |
| අනෙකුත් ජංගම නොවන වත්කම් | | 14,948,350 | | 13,800,775 | |
| | | | **1,709,018,254** | | **1,605,437,531** |
| **ජංගම වත්කම්** | | | | | |
| තොගය | 13 | 1,079,938,789 | | 887,455,903 | |
| මාර්ගස්ථ තොගය | 14 | 886,881,626 | | 2,086,268,827 | |
| වෙළඳ හා වෙනත් ණයගැතියෝ | 15 | 11,062,836,871 | | 5,123,702,453 | |
| පෙරගෙවීම් | 16 | 23,578,839 | | 24,478,862 | |
| මුදල් සහ බැංකු ශේෂය | 17 | 216,358,949 | | 600,806,882 | |
| | | | **13,269,595,075** | | **8,722,712,928** |
| **මුළු වත්කම්** | | | **14,978,613,328** | | **10,328,150,459** |
| **ස්කන්ධය හා වගකීම්** | | | | | |
| දායක ප්‍රාග්ධනය | | 59,055,258 | | 59,055,258 | |
| ඒකාබද්ධ ලාභා ලාභ ගිණුම | | 3,622,539,288 | | 3,377,491,107 | |
| පොදු සංචිතය | | 66,061,447 | | 66,061,447 | |
| | | | **3,747,655,993** | | **3,502,607,812** |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව | 18 | 94,248,566 | | 74,894,076 | |
| විලම්බිත බදු වගකීම | 19 | 30,309,522 | | 30,188,279 | |
| | | | **124,558,088** | | **105,082,355** |
| **ජංගම වගකීම්** | | | | | |
| වෙළඳ හා අනෙකුත් ණයහිමියෝ | 20 | 3,016,958,649 | | 1,784,155,464 | |
| ආදායම් බදු බැඳියාව | | 191,439,643 | | 219,331,798 | |
| විලම්බිත ආදායම් | | 1,291,826 | | 317,625 | |
| ජංගම මුල්‍ය වගකීම් | 21 | 7,896,709,130 | | 4,716,655,405 | |
| | | | **11,106,399,247** | | **6,720,460,292** |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | | | **14,978,613,328** | | **10,328,150,459** |

පිටු අංක 18 සිට 45 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම ගිණුම් වාර්තාව හා සබැඳි අත්‍යාවශ්‍ය කොටස්වේ.

| | | | |
|---|---|---|---|
| **මහාචාර්ය එස්.ඩී.ජයරත්න** | **ආර්.එල්.ධර්මතිලක** | **කේ.එම්.ඩී.ආර්. දසනායක** | **මහින්ද ගමගේ** |
| **සභාපති** | **කළමනාකාර අධ්‍යක්ෂ** | **සාමාන්‍යාධිකාරී** | **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)** |

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

| | දායක ප්‍රාග්ධනය රු | දායක ප්‍රාග්ධනය වෙනුවෙන් ලද අත්තිකාරම් රු | පොදු සංචිතය රු | ඒකාබද්ධ ලාභාලාභ ගිණුම රු | එකතුව රු |
|---|---|---|---|---|---|
| 2010 දෙසැම්බර් 31 වන දිනට ශේෂය | **35,042,000** | **24,013,258** | **66,061,447** | **3,287,663,198** | **3,412,779,903** |
| 2011 ජනවාරි 1 වන දිනට ශේෂය | 35,042,000 | 24,013,258 | 66,061,447 | 3,287,663,198 | 3,412,779,903 |
| භාණ්ඩාගාර අයබදු ගෙවීම් | | | | (15,000,000) | (15,000,000) |
| තාවකාලික වෙනස්කම් ගැලපීම මත විලම්බිත වියදම/ආදායම | | | | 11,325,057 | 11,325,057 |
| වසරේ ශුද්ධ ලාභය | | | | 93,502,852 | 93,502,852 |
| **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **35,042,000** | **24,013,258** | **66,061,447** | **3,377,491,107** | **3,502,607,812** |
| 2012 ජනවාරි 1 වන දිනට ශේෂය | 35,042,000 | 24,013,258 | 66,061,447 | 3,377,491,107 | 3,502,607,812 |
| | | | | - | - |
| තාවකාලික වෙනස්කම් ගැලපීම මත විලම්බිත වියදම/ආදායම | | | | (14,281,409) | (14,281,409) |
| වසරේ ශුද්ධ ලාභය | | | | 259,329,589 | 259,329,589 |
| **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **35,042,000** | **24,013,258** | **66,061,447** | **3,622,539,288** | **3,747,655,993** |

**රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව**

**2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය**

| | සටහන | ක්‍රියාකාරකම් රා.ඖ.ස. | ක්‍රියාකාරකම් රා.බෙ.ග. | මුළු ක්‍රියාකාරකම් 2012 | මුළු ක්‍රියාකාරකම් 2011 |
|---|---|---|---|---|---|
| ආදායම | 3 | **5,001,672,742** | **16,608,492,451** | **21,610,165,194** | **17,375,459,642** |
| **අඩු කලා** | | | | | |
| සෘජු වියදම් - රා.බෙ.ග | 4 | | 15,415,278,195 | 15,415,278,195 | 11,788,555,087 |
| විකුණුම් පිරිවැය - රා.ඖ.ස | 5 | 3,959,568,211 | | 3,959,568,211 | 3,726,917,368 |
| නිෂ්පාදන පරිවැය - ජීවනී ඒකකය | 6 | 50,563,135 | | 50,563,135 | 35,798,972 |
| දළ ලාභය/අතිරික්තය | | **991,541,396** | **1,193,214,256** | **2,184,755,652** | **1,824,188,215** |
| **එකතු කලා** | | | | | |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 7 | 15,104,844 | | 15,104,844 | 23,230,881 |
| **අඩු කලා** | | | | | |
| පරිපාලන වියදම් | 8 | 431,862,360 | 223,047,683 | 654,910,043 | 614,019,155 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 9 | 183,385,789 | 561,844,238 | 745,230,027 | 492,631,005 |
| මෙහෙයුම් ලාභය | | **391,398,091** | **408,322,336** | **799,720,426** | **740,768,935** |
| **අඩු කලා** | | | | | |
| මූල්‍ය වියදම් | 10 | 17,022 | 339,035,117 | 339,052,139 | 422,895,753 |
| **එකතු කලා** | | | | | |
| මූල්‍ය ආදායම් (සේවක ණය පොලී) | | 3,943,725 | - | 3,943,725 | 4,102,392 |
| බදු වලට පෙර ලාභය | | **395,324,794** | **69,287,218** | **464,612,012** | **321,975,574** |
| ආදායම් බදු වියදම | 11 | 174,668,819 | 30,613,604 | 205,282,423 | 228,472,722 |
| බදු වලට පසු ලාභය | | **220,655,975** | **38,673,614** | **259,329,589** | **93,502,852** |
| **අනෙකුත් විස්තිරණ ආදායම්** | | | | | |
| පාරිතෝෂික අරමුදලේ ලාභය/අලාභය | | (6,283,820) | (7,997,589) | (14,281,409) | 11,325,057 |
| භාණ්ඩාගාර අයබදු/ලාභාංශ ගෙවීම් | | - | - | - | (15,000,000) |
| වසරේ මුළු විස්තිරණ ආදායම | | **214,372,155** | **30,676,025** | **245,048,180** | **89,827,909** |

* භාණ්ඩාගාරය විසින් රු.මි. 247.6 ක බැංකු අයිරාපොලී ප්‍රතිපූර්ණය කළ පසු ඉතිරි රු.මි. 339 ක වටිනාකම ඉහත මූල්‍ය වියදම් ලෙස දක්වා ඇත.

## රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඔසුසල ආදායම් ප්‍රකාශය

| | ඔසුසල වෙළඳාම කොළඹ 07 රු | ඔසුසල වෙළඳාම කොළඹ 04 රු | ඔසුසල වෙළඳාම කොළඹ 01 රු | ඔසුසල වෙළඳාම මහනුවර රු | ඔසුසල වෙළඳාම නුගේගොඩ රු | ඔසුසල වෙළඳාම අවිස්සාවේල්ල රු | ඔසුසල වෙළඳාම රත්නපුර රු | ඔසුසල වෙළඳාම මිනුවන්ගොඩ රු | ඔසුසල වෙළඳාම පානදුර රු | ඔසුසල වෙළඳාම ගාල්ල රු | ඔසුසල වෙළඳාම මාතර රු | ඔසුසල වෙළඳාම කුරුණෑගල රු | ඔසුසල වෙළඳාම අම්පාර රු | ඔසුසල වෙළඳාම හම්බන්තොට රු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| විකුණුම් | 557,432,351 | 298,226,353 | 85,249,396 | 147,855,885 | 62,311,879 | 36,494,631 | 68,865,487 | 27,149,221 | 57,124,189 | 91,045,043 | 61,400,139 | 82,192,761 | 22,799,717 | 32,038,794 |
| **මුළු විකුණුම් මාරු කිරීම්** | **557,432,351** | **298,226,353** | **85,249,396** | **147,855,885** | **62,311,879** | **36,494,631** | **68,865,487** | **27,149,221** | **57,124,189** | **91,045,043** | **61,400,139** | **82,192,761** | **22,799,717** | **32,038,794** |
| විකුණුම් පිරිවැය හා මාරු කිරීම් | 471,511,225 | 264,879,403 | 72,212,463 | 122,736,788 | 50,970,356 | 29,897,348 | 58,586,508 | 21,335,441 | 46,015,853 | 77,965,634 | 49,139,786 | 66,493,359 | 18,077,405 | 26,420,776 |
| **විකුණුම් හා මාරු කිරීම් මත දළ වෙළඳ ලාභය** | **85,921,126** | **33,346,950** | **13,036,933** | **25,119,097** | **11,341,523** | **6,597,282** | **10,278,978** | **5,813,779** | **11,108,336** | **13,079,409** | **12,260,353** | **15,699,402** | **4,722,311** | **5,618,018** |
| **ආයතන හා පරිපාලන වියදම්** | | | | | | | | | | | | | | |
| සේවක පඩි නඩි | 26,928,078 | 11,949,337 | 5,480,812 | 9,378,561 | 7,223,932 | 4,701,617 | 7,671,441 | 3,540,366 | 6,515,668 | 9,035,875 | 6,819,720 | 5,620,504 | 3,205,579 | 3,614,198 |
| ගමන් වියදම් | 25,324 | 2,066 | 3,442 | 4,822 | 1,787 | 22,208 | 15,758 | 7,948 | 5,846 | 2,345 | 10,460 | 3,132 | 1,887 | 2,741 |
| සැපයුම් හා අවශ්‍යතා | 544,562 | 101,018 | 95,820 | 171,690 | 53,612 | 94,499 | 156,705 | 29,568 | 152,051 | 131,371 | 134,822 | 131,474 | 78,527 | 70,603 |
| අලුත්වැඩියා හා නඩත්තු | 644,882 | 97,316 | 70,641 | 125,948 | 52,282 | 33,821 | 165,462 | 16,459 | 109,780 | 110,784 | 89,166 | 99,814 | 58,793 | 92,351 |
| ප්‍රවාහන, සන්නිවේදන,උපයෝගිතා හා වෙනත් සේවා | 9,635,743 | 3,519,260 | 1,823,278 | 3,509,586 | 3,078,086 | 2,040,669 | 2,753,656 | 1,534,145 | 2,251,423 | 3,332,779 | 2,599,746 | 2,596,276 | 1,457,758 | 1,808,562 |
| **වෙනත් මෙහෙයුම් වියදම්** | | | | | | | | | | | | | | |
| විකුණුම් හා බෙදාහැරීමේ පිරිවැය | 898,083 | 165,902 | 216,440 | 707,765 | 332,841 | 106,318 | 272,865 | 134,160 | 236,287 | 292,803 | 431,357 | 363,449 | 194,512 | 205,920 |
| **මුළු පොදුකාර්ය පිරිවැය** | **38,676,673** | **15,834,899** | **7,690,433** | **13,898,372** | **10,742,540** | **6,999,133** | **11,035,887** | **5,262,645** | **9,271,055** | **12,905,958** | **10,085,271** | **8,814,649** | **4,997,056** | **5,794,375** |
| **ශුද්ධ ලාභය/අලාභය** | **47,244,453** | **17,512,051** | **5,346,500** | **11,220,725** | **598,982** | **(401,851)** | **(756,909)** | **551,134** | **1,837,281** | **173,450** | **2,175,082** | **6,884,754** | **(274,745)** | **(176,357)** |

## රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඔසුසල ආදායම් ප්‍රකාශය

| | ඔසුසල වෙළඳාම මීගෙඩ රු | ඔසුසල වෙළඳාම අනුරාධපුර රු | ඔසුසල වෙළඳාම මහරගම රු | ඔසුසල වෙළඳාම ජයවර්ධනපුර රු | ඔසුසල වෙළඳාම කරාපිටිය රු | ඔසුසල වෙළඳාම මීගමුව රු | ඔසුසල වෙළඳාම බදුල්ල-සතොස රු | ඔසුසල වෙළඳාම දියතලාව රු | ඔසුසල වෙළඳාම යාපනය රු | ඔසුසල වෙළඳාම පොළොන්නරුව රු | ඔසුසල වෙළඳාම රත්මලාන රු | ඔසුසල වෙළඳාම පිළියන්දල රු | ඔසුසල වෙළඳාම කලුතර රු | ඔසුසල වෙළඳාම ණිහෑග රු | සමස්ථ ඔසුසල වෙළඳ ක්‍රියාකාරකම් රු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| විකුණුම් | 3,720,549 | 46,425,433 | 70,587,654 | 132,582,906 | 61,401,894 | 58,523,648 | 39,500,527 | 14,500,936 | 13,867,660 | 7,335,286 | 8,884,249 | 5,938,176 | 4,100,008 | 88,309,374 | 2,185,864,145 |
| | | | | | | | | | | | | | | | - |
| **මුළු විකුණුම් මාරු කිරීම්** | **3,720,549** | **46,425,433** | **70,587,654** | **132,582,906** | **61,401,894** | **58,523,648** | **39,500,527** | **14,500,936** | **13,867,660** | **7,335,286** | **8,884,249** | **5,938,176** | **4,100,008** | **88,309,374** | 2,185,864,145 |
| | | | | | | | | | | | | | | | - |
| විකුණුම් පිරිවැය හා මාරු කිරීම් | 2,916,293 | 37,662,613 | 57,420,269 | 109,779,557 | 52,520,378 | 48,611,233 | 31,803,131 | 11,399,573 | 10,815,214 | 5,166,766 | 7,269,670 | 4,738,996 | 3,382,391 | 61,187,211 | 1,820,915,642 |
| **විකුණුම් හා මාරු කිරීම් මත දළ** | | | | | | | | | | | | | | | - |
| **වෙළඳ ලාභය** | **804,256** | **8,762,820** | **13,167,385** | **22,803,349** | **8,881,516** | **9,912,415** | **7,697,396** | **3,101,362** | **3,052,446** | **2,168,520** | **1,614,579** | **1,199,180** | **717,617** | **27,122,163** | **364,948,503** |
| **ආයතන හා පරිපාලන වියදම්** | | | | | | | | | | | | | | | |
| සේවක පඩි නඩි | 872,109 | 3,335,202 | 5,703,417 | 11,118,621 | 6,876,762 | 4,501,751 | 3,998,686 | 2,241,881 | 2,743,392 | 1,101,328 | 1,077,600 | 993,749 | 1,138,858 | 2,893,004 | 160,282,049 |
| ගමන් වියදම් | 250 | 1,400 | 214 | 1,150 | 3,790 | 11,030 | 6,343 | 19,393 | 210,085 | - | 738 | 3,610 | 200 | 9,432 | 377,401 |
| සැපයුම් හා අවශ්‍යතා | 21,545 | 162,781 | 380,323 | 173,327 | 133,847 | 133,947 | 106,465 | 165,711 | 5,974 | 75,924 | 1,834 | 1,431 | 3,937 | 35,620 | 3,348,990 |
| අලුත්වැඩියා හා නඩත්තු | 75 | 51,507 | 97,076 | 36,875 | 102,576 | 166,196 | 129,893 | 8,773 | 25,629 | 100,403 | 3,322 | 12,595 | 7,904 | 53,479 | 2,563,803 |
| ප්‍රවාහන, සන්නිවේදන,උපයෝගිතා | 248,428 | 2,566,605 | 2,327,360 | 3,077,231 | 2,241,427 | 2,765,808 | 2,383,371 | 363,063 | 4,176,105 | 1,036,307 | 108,710 | 136,222 | 93,758 | 1,742,645 | 65,208,009 |
| හා වෙනත් සේවා | | | | | | | | | | | | | | | - |
| | | | | | | | | | | | | | | | - |
| **වෙනත් මෙහෙයුම් වියදම්** | | | | | | | | | | | | | | | |
| විකුණුම් හා බෙදාහැරීමේ පිරිවැය | 120,258 | 267,623 | 241,919 | 568,547 | 411,637 | 226,527 | 142,097 | 126,508 | 33,474 | 181,972 | 18,752 | 74,288 | 96,880 | 65,259 | 7,134,443 |
| **මුළු පොදුකාර්ය පිරිවැය** | **1,262,665** | **6,385,120** | **8,750,310** | **14,975,751** | **9,770,039** | **7,805,259** | **6,766,856** | **2,925,330** | **7,194,660** | **2,495,934** | **1,210,957** | **1,221,896** | **1,341,538** | **4,799,438** | **238,914,696** |
| **ශුද්ධ ලාභය/අලාභය** | **(458,409)** | **2,377,701** | **4,417,076** | **7,827,598** | **(888,523)** | **2,107,156** | **930,540** | **176,032** | **(4,142,214)** | **(327,414)** | **403,623** | **(22,716)** | **(623,921)** | **22,322,725** | **126,033,807** |

**ඔසුසල ආදායම් ප්‍රකාශය**

ප්‍රධාන ගබඩාවෙන් ලබාගන්නා ඖෂධ වෙනුවෙන් ඔසුසල වලට ලබාදෙන වට්ටම 9% සිට 13% දක්වා වැඩිකිරීම හේතුවෙන් ඔසුසල ලාභදායකත්වය 4% කින් ප්‍රවර්ථන වර්ෂයේ දී වැඩිවී ඇත. කෙසේ වුවද මෙය සංස්ථාවේ සමස්ථ ලාභයට බල නොපායි.

**රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව**
**2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2012<br>රු | 2011<br>(නැවත ප්‍රකාශිත)<br>රු |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය** | | |
| බදු වලට පෙර ශුද්ධ ලාභය | **464,612,012** | **321,975,574** |
| **ගැලපීම්** | | |
| ක්ෂය කිරීම් | 32,438,191 | 27,663,472 |
| විශ්‍රාමික පාරිතෝෂික වෙන්කිරීම් | 13,396,159 | 11,191,815 |
| කල්බදු ක්‍රමක්ෂය - රත්මලාන | 160,000 | 160,000 |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීම් මත ලාභය | - | (2,682,498) |
| බදු කුලී ක්‍රමක්‍ෂය | (1,147,575) | (321,518) |
| නොඉපයූ ලාභ | (3,257,373) | 2,679,004 |
| බොල් ණය සඳහා වෙන්කිරීම | 263,926,011 | 113,667,421 |
| තොග අලාභ | 56,338 | 212,629 |
| හානි වූ හා යල් පැනගිය තොග සඳහා වෙන්කිරීම - රා.ඖ.ස | 22,939,226 | - |
| හානි වූ හා යල් පැනගිය තොග සඳහා වෙන්කිරීම - රා.බෙ.ග | 47,472,817 | 114,252,765 |
| පොලී වියදම් | 339,035,117 | 419,235,181 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය** | **1,179,630,923** | **1,008,033,846** |
| වෙළඳ සහ වෙනත් ණයගැතියෝ වැඩිවීම/අඩුවීම | (6,197,661,919) | (1,782,647,729) |
| තැන්පතු සහ පෙර ගෙවීම් වැඩිවීම/අඩුවීම | 900,023 | (1,894,302) |
| තොග වැඩිවීම/අඩුවීම | (212,221,076) | (20,647,299) |
| මාර්ගස්ථ තොගය වැඩිවීම/අඩුවීම | 1,151,914,384 | 664,558,004 |
| වෙළඳ ණයහිමියෝ වැඩිවීම/අඩුවීම | 1,232,803,185 | 232,753,919 |
| නොනිම්වැඩ වැඩිවීම/අඩුවීම | 615,200 | (15,628,606.00) |
| විලම්බිත ආදායම් | 974,201 | (1,240,969) |
| **මෙහෙයුම් කටයුතු වලින් මුදල් ඉපයීම** | **(2,843,045,079)** | **83,286,864** |
| ආදායම් බදු ගෙවීම් | (238,451,841) | (238,404,225) |
| පාරිතෝෂික ගෙවීම් | (8,323,079) | (12,923,183) |
| පොලී ගෙවීම් | (339,035,117) | (419,235,181) |
| භාණ්ඩාගාර අයබදු හා ලාභාංශ ගෙවීම් | - | (15,000,000) |
| **විශේෂිත අයිතම වලට පෙර මුදල් ප්‍රවාහය** | **(585,810,037)** | **(685,562,590)** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(3,428,855,116)** | **(602,275,726)** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය** | | |
| දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම | (135,646,541) | (55,815,022) |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීම් | - | 2,682,498 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් උපයෝජනය** | **(135,646,541)** | **(53,132,524)** |
| **මුදල් හා මුදල් වලට සමාන දෑ වල ශුද්ධ වැඩිවීම** | **(3,564,501,657)** | **(655,408,250)** |
| | | |
| **වර්ෂය මුල මුදල් හා මුදල් වලට සමාන දෑ** | **(4,115,848,523)** | **(3,460,440,273)** |
| **වර්ෂය අග මුදල් හා මුදල් වලට සමාන දෑ (සටහන (අ))** | **(7,680,350,180)** | **(4,115,848,523)** |

**සටහන (අ) මුදල් හා මුදල් වලට සමාන දෑ**

| | 2012<br>රු | 2011<br>රු |
|---|---|---|
| අතැති මුදල් සහ බැංකු මුදල් | **185,894,745** | **575,436,414** |
| භාණ්ඩාගාර බිල්පත් ආයෝජන | 30,464,204 | 25,370,468 |
| බැංකු අයිරාව | **(7,896,709,130)** | **(4,716,655,405)** |
| | **(7,680,350,180)** | **(4,115,848,523)** |

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. ආයතනික තොරතුරු

### 1.1 පොදු තොරතුරු

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ 1971 දී රාජ්‍ය සංස්ථාවක් ලෙස සංස්ථාපනය කරන ලද අතර අංක 75, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01 යන ස්ථානයේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇත.

රාජ්‍ය ඖෂධ සංස්ථාව දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මාස දොළහක කාල සීමාව සඳහා මූල්‍ය වාර්තා සකස් කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම ගිණුම් වාර්තා අනුමත කරයි.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම්

සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ,

- ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂිත අයිතම විවෘත වෙළඳපොලට ආනයනය කිරීම, මිලදී ගැනීම විකිණීම සහ බෙදාහැරීම.
- රාජ්‍ය බෙහෙත් ගබඩාවට අවශ්‍ය ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂිත අයිතම ආනයනය කර සැපයීම.
- ජීවනී, ග්ලූකෝස් සහ බෙන්සිල් බෙන්සෝවේට් ක්‍රීම් (B.B. Cream) නිෂ්පාදනය කර විකිණීම.
- රසායනාගාර පහසුකම් සැපයීම සහ වෛද්‍ය පරීක්ෂණ සිදු කිරීම.

## 2. පිළියෙල කිරීමේ පදනම

### 2.1 2012 ජනවාරි 01 වන දින සිට බල පවත්වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර/ශ්‍රී.ල.ගි.ප්‍ර) පළමු වරට යොදා ගැනීම

මෙම මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී.ල.මූ.වා.ප්‍ර හා ශ්‍රී.ල.ගි.ප්‍ර ඇතුලත් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියනට අනුව පිළියෙල කර ඇත
2011 දෙසැම්බර් 31 දින දක්වා බලපවත්වන ලද ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතයනට අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ සියළු කාල පරිච්ඡේද සඳහා සංස්ථාවේ මූල්‍ය වාර්තා පිළියෙල කරන ලදි. 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා 2012 ජනවාරි 01 දින සිට බල පවත්වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර/ශ්‍රී.ල.ගි.ප්‍ර) අනුව මෙම සංස්ථාව පිළියෙල කළ පළමු මූල්‍ය ප්‍රකාශනය මෙය වේ.
ඉහත සංක්‍රමණය පිළිබඳ පැහැදිලි කිරීම් සඳහා සටහන අංක 7 බලන්න.

සටහන අංක 7 හි සඳහන් සමහර තෝරාගැනීම් හා අත්හැර දැමීම් වලට යටත්ව, 2010 ජනවාරි මස 01 දින පළමු ශ්‍රී.ල.මූ.වා.ප ශේෂපත්‍රය පිළියෙල කිරීමට භාවිත කරන ලද ගිණුම් ප්‍රතිපත්ති සැමකල්හි බලපැවැත් වූ ලෙසට, අඛණ්ඩව භාවිතා කරන ලදි.

### 2.2 මිණුම් පදනම

සාධාරණ වටිනාකම අනුව දක්වා ඇති වත්කම් හා වගකීම් හැරුනුවිට සියළු මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැයට අනුව පිළියෙල කර ඇත

සංස්ථාවේ ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමේදී එහි නිල හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය ලෙස ශ්‍රී ලංකා රුපියල භාවිතා කරයි.

## 3. මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

### 3.1.1 මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

රාජ්‍ය ඖෂධ සංස්ථාව පහතින් දක්වා ඇති මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම වාර්තාව පිළියෙල කිරීමේදි භාවිතා කර ඇත.

### 3.1.2 දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ සටහන් කර ඇත්තේ සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරන අලාභවීම් ඇත්නම් ඒවා ද අන්තර්ග්‍රහණය කර ගණනය කළ ශුද්ධ පිරිවැය ලෙසය. එබඳු පිරිවැය අගයයන්ට දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ පිරිවැයට තැනුම් කොටස් වෙනුවට අලුත් ඒවා යෙදීමේ සහ පිරිවැය නිර්ණායක වලට අනුකූල වන්නේ නම්, දීර්ඝ කාලීන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ණයට ගැනීමේ පිරිවැයද ඇතුලත්වේ. යම් නියමිත කාලයකට වරක් දේපල , පිරියත සහ යන්ත්‍රෝපකරණ වල වැදගත් කොටස් වෙනුවට අලුත් ඒවා යෙදීම අවශ්‍ය වන්නේ නම්, අදාල ඉවත් කරනු ලබන කොටසට අදාල වටිනාකම ඉවත්කරන අතර නව කොටස එහි ප්‍රයෝජනවත් ආයුකාලය හා ක්ෂය සමඟින් පිරිවැයට එක්රැස් කරනු ලැබේ. එලෙසම, ප්‍රධාන පෙළේ පිරික්සීමක් සිදුකරනු ලබන අවස්ථාවේදි එහි පිරිවැය, පිරිවැය නිර්ණායක සපුරාලන්නේ නම්, ආදේශනයක් වශයෙන් දේපළ හා පිරියතෙහි අනෙකුත් අලුත් වැඩියා කිරීම් හා නඩත්තු වියදම් ආදායම් ප්‍රකාශයට ඇතුලත් කරනු ලැබේ.

#### 3.1.2.1 කල්බදු දේපල

සංස්ථාව රත්මලානේ පිහිටි බදු ඉඩම මූල්‍ය බද්දක් ලෙස වර්ගකර දක්වා මුළු වටිනාකම ඉතිරි එලදායි ජීවිත කාලය පුරා ක්‍රමක්ෂය කරයි.

### 3.1.3 ක්ෂය කිරීම්

අනුපාතික පදනම අනුව, දේපල, පිරියත හා උපකරණ අත්පත් කරගත් හා ඉවත්කළ වර්ෂය තුල ක්ෂය කිරීම සිදුකරයි. දේපල, පිරියත හා උපකරණ වල ප්‍රයෝජනවත් ආයුකාලය පහත පරිදි වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 40 |
| රථ වාහන | වසර 3 සිට 17 |
| ලී බඩු සහ සවිකිරීම් | වසර 10 |
| උපකරණ | වසර 5 |
| පිරියත හා උපකරණ | වසර 8 |
| බයිසිකල් | වසර 6 සිට 7 |
| පරිගණක | වසර 4 |
| පුස්තකාල පොත් | වසර 5 |

### 3.1.4 නොනිම් වැඩ - ප්‍රාග්ධනය

ප්‍රවර්ථන වර්ෂයේ දි දරා ඇති එහෙත් ශේෂපත්‍ර දින දි ප්‍රාග්ධනිත නොකල ප්‍රාග්ධන වියදම් නොනිම් වැඩ ප්‍රාග්ධනය ලෙස දක්වා ඇති අතර ප්‍රවර්ථන වර්ෂයේදි ප්‍රාග්ධනිත ගත කර ප්‍රයෝජනයට ගන්නා ප්‍රාග්ධන වත්කම් දේපළ, පිරියත හා උපකරණ යටතේ දක්වා ඇත.

### 3.1.5 අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කර ගන්නා අස්පෘශ්‍ය වත්කම් වල මූලික පිරිවැය වන්නේ අත්පත් කරගැනීමේ පිරිවැයයි. මූලික පිරිවැය හඳුනා ගැනීමෙන් පසුව, අස්පෘශ්‍ය වත්කම් ඉදිරියට ගෙනයන අගය තීරණය කරනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානි කරන අලාභ අඩු කරමිනි. ප්‍රාග්ධන සංවර්ධන වියදම් හැර අභ්‍යන්තරිකව ජනනය කරන ලද අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධන ගත කරනු නොලබන අතර වියදම ඇතිවූ වර්ෂයේ ආදායම් ප්‍රකාශය තුල අදාල වියදම පිළිබිඹු කෙරේ.

**3.1.6 මූල්‍ය නොවන වත්කම් හානිකරණය**

වත්කම් හානි විය හැකි බව දක්වන සංඥාවක් ඇතිදැයි සංස්ථාව එක් එක් වාර්තා කරන දිනයේ දී තක්සේරු කරයි. කවර හෝ සංඥාවක් පවති නම්, හෝ වත්කමක් සඳහා වාර්ෂික හානි පිරික්සුමක් අවශ්‍ය වූ විට, සංස්ථාව අදාල වත්කමේ අයකර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරයි.

**3.1.7 බදුකරණය**

**3.1.7.1 වර්තමාන බදුකරණය**

වර්තමාන බදු වත්කම් හා වර්තමාන බදු වගකීම් වනුයේ, බදු බලධාරීන්ට ප්‍රවර්ථන වර්ෂය හා අතීත වර්ෂ වෙනුවෙන් ගෙවිය යුතු වන හා ඔවුන්ගේන් අයකරගත යුතු වන වටිනාකම් වේ. එම බදු ප්‍රමාණයන් ගණනය කිරීමට යොදා ගන්නා ලද බදු අනුපාතික හා බදු නීති වනාහි ශේෂපත්‍ර දින වන විට පනවා තිබූ ඒවා වේ.

ඒ අනුව, 2000 අංක 38 දරණ දේශීය ආදායම් පනතේ හා එයට කරන ලද සංශෝධන වල විධි විධානවලට අනුකූලව පනතේ නියම කර ඇති අනුපාතයනට අනුව බදු ගෙවීමේ කාර්යය සඳහා ගලපන ලද වර්ෂයේ ලාභය පදනම් කර ගෙන බදු ප්‍රතිපාදනය කරන ලැබේ. සමාලෝචිත වර්ෂයේ බදු සඳහා ප්‍රතිපාදන සලස්වා ඇත්තේ පනතේ නියම කර ඇති අනුපාතික වලට යටත්ව ගිණුම්ගත ලාභය පදනම් කරගෙනය.

**3.1.7.2 විලම්බිත බදුකරණය**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල හඳුනාගෙන ඇති වත්කම් හා වගකීම් වලට අදාල තාවකාලික වෙනස්කම් වර්ග සඳහා විලම්බිත බදු බැරකම් හා වත්කම් සඳහා ප්‍රතිපාදන කර ඇත අපගේ මූල්‍ය ප්‍රකාශය තුල ප්‍රධාන වශයෙන් ස්ථාවර වත්කම් වල පොත් හා බදු ලිඛිත වටිනාකම සඳහා විලම්බිත බදු බැරකමක්ද විශ්‍රාම පාරිතෝෂිකය වෙනුවෙන් වූ ප්‍රතිපාදනය සඳහා විලම්බිත බදු වත්කමක් ද හඳුනා ගත්තෙමු. සංස්ථාව විලම්බිත වත්කම් හා බැරකම් මනිනු ලබන්නේ ආදායම් බදු අනුපාතය අනුවය.

**3.2.1 භාණ්ඩ තොග**

ශ්‍රීඝ්‍රටමයෙන් ලැබූ ප්‍රථමයෙන් නිකුත් කළ " පදනමින් අගය තක්සේරු කෙරෙන අභාවිත හෝ මන්දගාමී චලනයන් සහිත භාණ්ඩ සඳහා නිසි වෙන්කිරීම් කල පසුව පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත භාණ්ඩ තොග වටිනාකම් ගණනය කිරීම සිදුකරයි.

**තොග අගය කිරීම**

**3.2.2 තොග පිරිවැය**

**අමුද්‍රව්‍ය තොග - පිවනි ඒකකය**

කවර හෝ පසු වියදම්ද ඇතුලත්ව මිලට ගැනීමේ පිරිවැය

**නොනිමි වැඩ**

අමුද්‍රව්‍ය පිරිවැය හා විචල්‍ය නිෂ්පාදන වියදම මුළුමුනින්ම

**නිමි භාණ්ඩ**

අමුද්‍රව්‍ය පිරිවැය හා විචල්‍ය නිෂ්පාදන වියදම මුළුමුනින්ම

**3.2.3 මුදල් හා මුදල් වලට සමාන දෑ**

මුදල් හා මුදල් වලට සමාන දෑ වලට අයත් වන්නේ අතැති මුදල් හා බැංකු මුදල්, භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන, මාස දොලහක් හෝ අඩු කාලයක් තුල කල්පිරෙන ද්‍රවශීල තාවයෙන් ඉහල ආයෝජනයි. බැංකු අයිරාව ශේෂපත්‍රයේ ජංගම වගකීම් යටතේ දක්වා ඇත.

### 3.2.4 පර්යේෂණ පිරිවැය

නව විද්‍යාත්මක හෝ තාක්ෂණික දැනුම හා අවබෝධය ලබා ගැනීමේ අරමුණෙන් සිදුකරන ලද පර්යේෂණ කටයුතු සඳහා වියදම් ඇතිවූ අවස්ථාවේ දී ඒවා ලාභාලාභ තුල පෙන්වා ඇත.

## 4. බැරකම් සහ ප්‍රතිපාදන

### 4.1 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

### 4.1.1 නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලසුම් විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව පාරිතෝෂික ගෙවීමට සංස්ථාව බැඳි සිටි සේවකයෙකුට ගෙවිය යුතු පාරිතෝෂිකය සඳහා බැරකමක් පැන නගින්නේ සේවකයෙකු සංස්ථාව සමඟ අවුරුදු පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කරන අවස්ථාවේදිය මෙම වගකීම සපුරාලන පිරිස මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල ප්‍රතිපාදනයක් ඉදිරියට ගෙන යනු ලැබේ වර්ෂය මුලදී ගෙන ආ ප්‍රතිපාදනය හා වර්ෂය අවසානයේදී ඉදිරියට ගෙන ගිය ප්‍රතිපාදනය අතර ඇතිවන වෙනස ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

ගණනය කිරීම්වලදී භාවිතා කෙරෙන ප්‍රධාන උපකල්පනයන් පහතින් දැක්වේ.

| | | |
|---|---|---|
| අපේක්ෂිත සාමාන්‍ය වාර්ෂික වැටුප් වර්ධන අනුපාතිකය | - | 7.15% |
| වට්ටම්/පොලී අනුපාතිකය | - | 11.69% |
| කාර්යමණ්ඩල පිරිවැටුම් සාධකය | - | 2.74% |

මෙම බැරකම සම්බන්ධයෙන් බාහිරව අරමුදල් සැපයීම සිදු නොකෙරේ. මෙම අංග මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ජංගම නොවන බැරකම් යටතේ කාණ්ඩ ගත කෙරේ.

### 4.1.2 නිශ්චිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදල් දායකත්වයට හා සේවක භාරකාරත්ව අරමුදල් දායකත්වයට සුදුසුකම් ඇති සියළුම සේවකයන් අදාළ රෙගුලාසි වලට අනුකූලව අදාළ දායකත්ව අරමුදල් මඟින් ආවරණය කරනු ලැබේ. සේවකයන් ආවරණය කරමින් අර්ථසාධක අරමුදලට හා භාරකාර අරමුදලට සැපයෙන දායකත්වයන් පිළිබඳ වගකීම් භාරයන් ආදායම් ප්‍රකාශය තුල වියදම් වශයෙන් හඳුනා ගනු ලැබේ.

**සේවක අර්ථසාධක අරමුදල**

පිළිවෙලින් සංස්ථාව හා සේවකයන් දළ වැටුපෙන් 12% ක් හා 10% ක් ලෙස සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය සපයයි.

**සේවක භාරකාර අරමුදල**

සංස්ථාව දළ සේවක වැටුපෙන් 3% ක් ලෙස සේවක භාරකාර අරමුදලට දායකත්වය සපයයි.

## 5. ආදායම් ප්‍රකාශය

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා වියදම් ශ්‍රිත ක්‍රමය යොදා ගෙන ඇත්තේ එමඟින් සංස්ථාවේ කාර්යසාධනයෙහි සංරචකයන් සාධාරණව නිරූපණය වන බැවිනි.

### 5.1.1 ආදායම් හඳුනා ගැනීම

ගෙවන අවස්ථාව කවරක් වුවද ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ගලා ඒමේ හැකියාව ඇති හා ආදායම හා ඊට සම්බන්ධ පිරිවැය විශ්වාසය තැබිය හැකි අයුරින් මැනිය හැකි ආදායම් උපචිත පදනමට හඳුනාගනු ලැබේ. ගිවිසුම් ගතව නිර්වචනය කරන ලද ගෙවීමේ නියමයන් සැලකිල්ලට ගනිමින් ලැබුණු හෝ අයවිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකමට ආදායම මනිනු ලැබේ.

ආදායම් වශයෙන් හඳුනා ගැනීමේ දි පහත සඳහන් විශේෂ පිළිගත් මිණුම්දඬු සපුරාලිය යුතුය.

**භාණ්ඩ අලෙවිය**

භාණ්ඩ අලෙවි ආදායම හඳුනා ගනු ලබන්නේ භාණ්ඩ හිමිකරුගේ අවදානම් හා ප්‍රතිලාභ ගැනුම්කරුට හිමිවූ අවස්ථාවේදී, සාමාන්‍යයෙන් භාණ්ඩ භාරදුන් විටය.

**අනෙකුත් ආදායම්**

වෙනත් ආදායම් උපචිත පදනම අනුව හඳුනාගනියි.

**පොළී ආදායම්**

ක්‍රමක්ෂේපිත පිරිවැයට අගය කරන සියළුම මූල්‍ය උපකරණ හා පොළී දරණ මූල්‍ය වත්කම් විකිණීම සඳහා ඇති මූල්‍ය උපකරණ ලෙසද, ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහය හා ආදායම මූල්‍ය උපකරණවල ඵලදායි ජීවිත කාලය පුරා හෝ කෙටි කාලයකට නිවැරදිව ක්‍රමක්ෂය කර දක්වන සඵල පොළී අනුපාත ක්‍රමය (EIR) භාවිතා කරමින් මූල්‍ය වත්කම් හා වගකීම් වල ශුද්ධ පොත් අගය කාලානුරූප වන පරිදි ක්‍රමක්ෂය කරයි. පොලි ආදායම ආදායම් වාර්තාවේ මූල්‍ය ආදායම් යටතේ දක්වයි.

**සැපයුම් කරුවන්ගෙන් ලැබිය යුතු වන්දි**

අතිරේක ගබඩා ගාස්තු, ඩෙමරේජ් ගාස්තු, හිඟ සැපයුම් සහ තොග හානි වෙනුවෙන් අයවිය යුතු හිමිකම් ඒවායේ අවිනිශ්චිත භාවය නිසා මූල්‍ය ප්‍රකාශනයන්හි සැලකිල්ලට ගෙන නොමැත. කෙසේ වෙතත් ආදායම උපලබ්ධි වන බව නිශ්චිතව දන්නා විට එම හිමිකම් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර ඇත.

### 5.1.2 වියදම්

වර්ෂයේ ලාභය ගණනය කිරීමේදි ව්‍යාපාරය පවත්වා ගෙන යාමෙන් ඇති වූ සියළුම වියදම් ආදායමෙන් අඩුකර ඇත.
අලුත්වැඩියාවන් හා අලුත් කිරීම් එම වියදම ඇතිවූ වර්ෂයේ ලාභ අලාභවලට අය කරනු ලැබේ.

### 5.1.3 මූල්‍ය වියදම්

ප්‍රයෝජනයට ගත හැකි මට්ටමට ගෙන ඒමට සැලකිය යුතු කාලයක් ගතවන වත්කම්, අත්පත්කර ගැනීම, ගොඩනැගීම. නිෂ්පාදනය වෙනුවෙන් කෙලින්ම අදාලවන ණය පිරිවැය, අදාල වත්කමේ පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධන ගත කරයි. අනෙක් සියළුම ණය පිරිවැයන් පිරිවැය දරන ලද වර්ෂයේ වියදම් ලෙස සලකයි. සංස්ථාවේ මූල්‍ය වියදම් තුල බැංකු අයිරා පොළී, ණයවර ලිපි ආරම්භ කිරීමේ වියදම් සහ ණය ගිවිසුම් ගාස්තු ඇතුලත්වේ.

### 5.1.4 පොදුකාර්ය වියදම් බෙදා වෙන්කිරීම

රාජ්‍ය ඖෂධ සංස්ථාව සහ රාජ්‍ය බෙහෙත් ගබඩාවට සම්බන්ධ ක්‍රියාකාරකම් විශ්ලේෂණය කිරීමෙන් පසුව පොදුකාර්ය පිරිවැය ප්‍රතිශතයක් ලෙස බෙදා වෙන්කර දක්වා ඇත. මූල්‍ය ප්‍රකාශනයේ පොදුකාර්ය වියදම් බෙදා ඇති ආකාරය පහත දැක්වේ.

| | ර.බෙ.ග | රා.ඖ.ස |
|---|---|---|
| (a) සේවක වේතන | 56% | 44% |
| (b) ගමන් වියදම් | 10% | 90% |
| (c) සැපයුම් සහ අවශ්‍යතා | 25% | 75% |
| (d) අලුත්වැඩියා සහ නඩත්තු | 50% | 50% |
| (e) ප්‍රවාහන, සන්නිවේදන, -උපයෝගිතා හා වෙනත් සේවා | 50% | 50% |
| (f) පර්යේෂණ හා සංවර්ධන | 65% | 35% |
| (g) බැංකු අයිරා පොළී | 100% | - |

## 6. මූල්‍යකරණ මෙවලම් - ප්‍රථම සහ පසු වර්ෂ සඳහා තක්සේරු කිරීම

### 6.1 මූල්‍ය වත්කම්

### 6.1.1 මුල් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම

ශ්‍රී.ල.මු.වා.ප්‍ර අංක. 39 හි විෂය පථය තුල මූල්‍ය වත්කම් වර්ගීකරණය වී ඇත්තේ ලාභ අලාභ ගිණුම හරහා මූල්‍ය වත්කම් ණය හා අයවිය යුතු දේ, කල් පිරීම දක්වා ඇති ආයෝජන හා විකිණීමට ඇති මූල්‍ය වත්කම් ලෙසය. ඒ අනුව මූලික හඳුනා ගැනීමේ දි යෝග්‍ය ආකාරයට තම මූල්‍ය වත්කම් වර්ගීකරණය කළ යුතුය.
මූලික හඳුනා ගැනීමේ දී සියළුම මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට හඳුනා ගනියි, ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට හඳුනා නොගන්නා විට ගනුදෙනු පිරිවැයට ආරෝපණය කරයි.

සංස්ථාවේ මූල්‍ය වත්කම් වල මුදල් හා කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත් ආයෝජන, වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ, සේවක ණය හා අනෙකුත් ලැබිය යුතු අයිතම ඇතුලත් වේ.

### 6.1.2 පසු තක්සේරුව

මූල්‍ය වත්කම් වල පසු වර්ෂවල තක්සේරුව පහත දැක්වෙන පරිදි ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

### 6.1.2.1 ලාභාලාභ ගිණුම හරහා වෙළඳපල වටිනාකමට අගය තක්සේරු කරන මූල්‍ය වත්කම්

ලාභාලාභ ගිණුම හරහා වෙළඳපල වටිනාකමට අගය තක්සේරු කරන මූල්‍ය වත්කම් වලට අන්තර්ගත වනුයේ විකිණීම සඳහා වෙන්කරන ලද මූල්‍ය වත්කම් හා හඳුනා ගැනීමේදී මෙම වර්ගීකරණයට අයත් යැයි නිර්ණය කරන ලද මූල්‍ය වත්කම්ය. මූල්‍ය වත්කම් නුදුරු කාලයේදී විකිණීමේ හෝ යලි මිලට ගැනීමේ කාර්යය සඳහා අත්කර ගෙන ඇති නම්, ඒවා වෙළඳාම සඳහා දරනු ලබන ලෙස වර්ගීකරණය කෙරේ. 2011 හා 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර වල ලාභාලාභ ගිණුම හරහා වෙළඳපල වටිනාකමට අගය තක්සේරු කරන මූල්‍ය වත්කම් සංස්ථාව සතුව නොතිබුණි.

### 6.1.2.2 ණය සහ ලැබිය යුතු දේ

ණය සහ අයවිය යුතු දේ වනාහි ක්‍රියාශීලී වෙළඳපලක තක්සේරු නොකරන ලද ස්ථාවර හෝ නිර්ණය කළ එකකි. ගෙවීම් සහිත විවෘත වෙළඳපලේ විකුණා ඉපයීමක් නොකරන මූල්‍ය වත්කම්ය මුල් හඳුනා ගැනීමෙන් පසුව එබඳු මූල්‍ය වත්කම් පසු වර්ෂයන්හි තක්සේරු කරනු ලබන්නේ හානිවීම අඩු කර සඵල පොළී අනුපාතික ක්‍රමය (EIR) භාවිතා කරමින් ක්‍රමක්ෂය කරන ලද පිරිවැයටය ගාස්තු හා පිරිවැය සහ අත්කර ගැනීමේදි වූ වට්ටම් හෝ විශේෂ දීමනා සැලකිල්ලට ගනිමින් ගණනය කළ සඵල පොළී අනුපාතිකය භාවිතා කර ක්‍රමක්ෂය කරන ලද පිරිවැය ගණනය කරණු ලැබේ. ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම තුල සඵල පොළී අනුපාතික ක්‍රමක්ෂය ඇතුලත් කරනු ලැබේ. හානිවීම් නිසා පැන නගින අලාභයන් ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුල හඳුනාගනු ලැබේ.

### 6.1.2.3 කල්පිරීම තෙක් රඳවනු ලබන ආයෝජන

ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත විවෘත වෙළඳපලේ විකිණීමක් නොකරන සංස්ථාවට කල්පිරීම දක්වා දැරීමේ හැකියාව හා සාධනීය චේතනාව තිබේ නම්, ඒවා කල් පිරීම තෙක් රඳවනු ලබන ඒවා ලෙස වර්ගීකරණය කෙරේ. මූලික අගය කිරීමෙන් පසුව, කල්පිරීම තෙක් රඳවනු ලබන ආයෝජන තක්සේරු කරනු ලබන්නේ හානිවීම් අඩුකර සඵල පොළී අනුපාත ක්‍රමය (EIR) භාවිතා කර ක්‍රමක්ෂය කරන ලද පිරිවැයටය. ගාස්තු හා පිරිවැය සහ අත්කර ගැනීමේදී වූ වට්ටම් හෝ විශේෂ දිමනා සැලකිල්ලට ගනිමින් ගණනය කරනු ලබන පොලී අනුපාතිකය භාවිතා කරමින් ක්‍රමක්ෂය කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම තුල සඵල පොලී අනුපාතික ක්‍රමක්ෂය ඇතුලත් කරනු ලැබේ. හානිවීම කෙරෙන් පැන නගින අලාභයන් ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුල හඳුනාගනු ලැබේ.

### 6.1.2.4 විකිණීමට ඇති මූල්‍ය ආයෝජන

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන වලට කාරක ප්‍රග්ධනය හා ණය සුරැකුම් ඇතුලත්ය. විකිණීමට ඇති මූල්‍ය ආයෝජන ලෙස වර්ගීකරණය කර ඇති කාරක ප්‍රාග්ධන ආයෝජන විකිණුම් සඳහා රඳවා ගනු ලබන ලෙස වර්ගීකරණය කරනු ලැබූ, ලාභ හෝ අලාභ ගිණුම හරහා නොමැති ඒවාය. මෙම ප්‍රභේදය තුළ ඇති ණය සුරැකුම් වනාහි ද්‍රවශීලතාව සඳහා වූ අවශ්‍යතාවන්ට ප්‍රතිචාර වශයෙන් හෝ වෙළඳපල තත්ත්වයන්ගේ වෙනස්කම් වලට ප්‍රතිචාර වශයෙන් අලෙවි කරනු ලැබිය හැකි අවිනිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා රඳවනු ලැබීමට අපේක්ෂිත කෙරෙන ඒවාය.

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන මූලික හඳුනා ගැනීමෙන් පසුව, සමුච්චිත අලාභය ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුල යලි වර්ගීකරණය කර විකිණීමට ඇති සංචිතයෙන් ඉවත් කෙරෙන අතර, සමුච්චිත අලාභය වෙනත් මෙහෙයුම් ආදායම තුළ හඳුනාගන්නා හෝ අපචයවූ ලෙස නිර්ණය කරනු ලබන අවස්ථාවන් ආයෝජන හඳුනා නොගැනීම කෙරෙන තෙක්, විකිණීමට ඇති සංචිතය තුල අනෙකුත් අංග සම්පූර්ණ ආදායම ලෙස හඳුනාගනු ලැබූ අනු උපලබ්ධි ලාභ හෝ අලාභ සමඟ වෙළඳපල වටිනාකමට තක්සේරු කරනු ලැබේ. විකිනීමට ඇති ණය සුරැකම් මත පොළී ආදායම සඵල පොළී ක්‍රමය භාවිතා කරමින් ගණනය කරනු ලබන අතර, ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනු ලැබේ.

සංස්ථාව සිය විකිණීමට ඇති මූල්‍ය වත්කම් තක්සේරු කරනුයේ නුදුරු කාලයේදී මෙම මූල්‍ය වත්කම් විකිණීමට ඇති හැකියාව හා අභිප්‍රාය තවමත් උචිතද යන්න නිශ්චය කරනු පිණිසය වෙළඳපලේ අක්‍රිය බව නිසා මෙම මූල්‍ය වත්කම් ගනුදෙනු කිරීමට සංස්ථාවට නොහැකි වන විට සහ එසේ කිරීමට කළමණාකාරීත්වයට ඇති අභිප්‍රාය සාදෘශ්‍ය අනාගතයේදී සැලකිය යුතු ලෙස වෙනස් වන විට, සංස්ථාව ඉතා කලාතුරකින් මෙම මූල්‍ය වත්කම් යලි වර්ගීකරණය කිරීමට තීරණය කිරීමට ඉඩ ඇත. මූල්‍ය වත්කම් ණය හා අයවිය යුතු දෑවල නිර්වචනය සපුරාලයි නම් සහ සාදෘශ්‍ය අනාගතය තුල හෝ කල් පිරෙන තෙක් මෙම වත්කම් රඳවා ගැනීමට ඇති හැකියාව හා අභිප්‍රාය බැංකුවට ඇතිවිට ඒවා ණය හා අයවිය යුතු දෑ ලෙස යලි වර්ගීකරණය කිරීමට අවසර ලැබේ. කල්පිරෙන තෙක් රඳවනු ලබන ආයෝජන ලෙස යලි වර්ගීකරණය කිරීමට අවසර ලැබෙනුයේ ආයතනයට අදාල මූල්‍ය වත්කම් එලෙස රැඳවීමට හැකියාව හා අභිප්‍රාය තිබේ නම් පමණි.

විකිණීමට ඇති ප්‍රබේදයෙන් ඉවත්ව යලි වර්ගීකරණය කරන ලද මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන් කාරක ප්‍රාග්ධනය තුල හඳුනාගෙන ඇති එම වත්කමේ කවර හෝ පෙර ලාභයක් හෝ අලාභයක් සඵල පොළී අනුපාතික භාවිතා කරමින් ආයෝජනයේ ඉතිරිව ඇති ආයුකාලය මුළුල්ලේ ලාභය හෝ අලාභයට ක්‍රමක්ෂය කරනු ලැබේ. නව ක්‍රමක්ෂය කරන ලද පිරිවැය සහ අපේක්ෂිත මුදල් ප්‍රවාහ අතර ඇතිවන කවර හෝ වෙනසක් වුවද සඵල පොළී අනුපාතික භාවිතා කරමින් වත්කමෙහි ඉතිරිව ඇති ආයුකාලය මුළුල්ලේ ක්‍රමක්ෂය කරනු ලැබේ. අදාල වත්කම් පසුව හානිවී ඇතැයි නිර්ණය කරනු ලබන්නේ නම්, එවිට කාරක ප්‍රාග්ධනය තුල සටහන් කරන ලද ප්‍රමාණය ආදායම් ප්‍රකාශය වෙත යලි වර්ගීකරණය කරනු ලැබේ. 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල හෝ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල සංස්ථාව සතුව කිසිදු විකිණීමට ඇති මූල්‍ය ආයෝජනයක් නොතිබුණි.

### 6.1.2.5 හඳුනා නොගැනීම

මූල්‍ය වත්කමක් (එසේත් නැත හොත්, අදාළ අවස්ථාව අනුව, මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) හඳුනා නොගැනීමක් කරනු ලබන්නේ පහත අවස්ථාවන්හිදිය.

1. වත්කම වෙතින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය ඉකුත් වීම.

11. සංස්ථාව එම වත්කම වෙතින් මුදල් ප්‍රවාහ ලැබීමේ සිය අයිතිවාසිකම් පවරා තිබීම හෝ විනිවිද යන විධිවිධානයක් යටතේ තුන්වන පාර්ශවයකට බලවත් ප්‍රමාදයකින් තොරව ලැබුණු මුදල් ප්‍රවාහයන් පූර්ණ වශයෙන් ගෙවීමේ වගකීමක් භාරයක් භාරගෙන තිබීම සහ

- අ) සංස්ථාව වත්කමෙහි සියළුම අවදානම් සහ ප්‍රතිලාභ ප්‍රමාණවත්ව පවරා තිබීම හෝ
- ආ) සංස්ථාව වත්කමෙහි සියළුම අවදානම් සහ ප්‍රතිලාභ ප්‍රමාණවත්ව පැවරීමකින් හෝ රඳවා ගැනීමකින් තොරව වත්කමේ පාලනය පවරා තිබීම.

### 6.1.2.6 මූල්‍ය වත්කම් හානිකරණය

යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානි වී තිබෙන බවට පිළිගත හැකි සාක්ෂි කිසිවක් තිබේදැයි සංස්ථාව එක් එක් වාර්තා කරන දිනයේදි තක්සේරු කර බලයි. යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානි වී ඇතැයි සලකනු ලබන්නේ, වත්කමේ මූලික හඳුනා ගැනීමට පසුව සිදුවූ සිදුවීමක හෝ කීපයක ප්‍රතිඵලය වශයෙන් හානි වීමක් පිළිබඳව පිළිගත හැකි සාක්ෂි ඇති නම් සහ මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් මත විශ්වාසය තැබිය හැකි අයුරින් ඇස්තමෙන්තු කළහැකි බලපෑමක් මඟින් අලාභ ගෙන දෙන සිදුවීමක් හෝ සිදුවී ඇති නම් පමණි.

හානිකරණයේ සාක්ෂි ලෙස ණයගැතියන්ගේ හෝ ණයගැති සමූහයේ සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, පොළී හෝ මුල් මුදල් ගෙවීම් පැහැර හැරීම, බුන්වත්භාවය හෝ වෙනත් මූල්‍ය සංවිධානයවීම් වලට අවතීර්ණ වීම අත් විඳිමින් සිටින බව දක්වන සංඥා සහ පැහැර හැරීම් වලට සහ සම්බන්ධ හිඟ වාරික, හෝ ආර්ථික තත්ත්වයන් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි මැනිය හැකි අඩු වීමක් තිබෙන බව හඟවන නිරීක්ෂණය කළ හැකි දත්ත ඇතුළත් වේ.

සංස්ථාව ලැබිය යුතු වෙළඳ ණය සඳහා විශේෂිත වෙන්කිරීමක් සිදුකරයි (specific provision) සිදුකරයි.

### 6.1.2.7 ක්‍රමක්ෂිත පිරිවැය අගයයෙන් ගෙන යනු ලබන මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂිත පිරිවැයෙන් මූල්‍ය ප්‍රකාශන වල පෙන්වනු ලබන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන්, සංස්ථාව මුලින්ම, තනිව වැදගත් වන මූල්‍ය වත්කම් සඳහා තනි තනිව අපවය වීමේ හෝ සහ තනිව වැදගත් නොවන මූල්‍ය වත්කම් සඳහා සාමූහික වශයෙන් අපවය වීමේ වාස්තවික සාක්ෂි තිබේද යන්න තක්සේරු කරයි. තනිව තක්සේරු කරනු ලබන මූල්‍ය වත්කමක් සඳහා අපවය වීමේ වාස්තවික සාක්ෂි නොමැති බවට සංස්ථාව තක්සේරු කරන්නේ නම් එම වත්කම සැලකිය යුතු එකක් වුවද, නොවුවද, සංස්ථාව එම වත්කම එයට සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් කණඩායමකට ඇතුළත්කොට, අපවය සම්බන්ධයෙන් අදාළ වත්කම් කණඩායමම සාමූහිකව තක්සේරු කරයි. අපවය ඇතිදැයි තනි තනිව තක්සේරු කරනු ලබන හා අපවය අලාභයක් ඇති හෝ අඛණ්ඩව පවතිනු ඇති ලෙස හඳුනා ගනු ලබන වත්කම් සාමූහික අපවය තක්සේරුවකට ඇතුළත් කරනු නොලැබේ.
අපවය අලාභයක් සිදුවී ඇති බවට වාස්ටවික සාක්ෂි පවති නම්, අලාභයේ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කමෙහි ධාරණ අගය හා ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි තවමත් ඇති වී නොමැති අනාගතයේ අපේක්ෂිත ණය අලාභයන් ඇතුළත් නොවන වර්තමාන වටිනාකම අතර වෙනස ලෙසය. ඇසතමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන වටිනාකම් මූල්‍ය වත්කමෙහි මුල් සඵල පොළී අනුපාතිකයට වට්ටම් කරනු ලැබේ .

සංස්ථාව එක් එක් ණයගැති ප්‍රභේදය සඳහා විශේෂිත අපවය තක්සේරු කිරීම සිදුකර ඇත.

**6.2 මූල්‍ය වගකීම්**

**මුල් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම**

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර අංක. 39 හි විෂය පථය තුල මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය වී ඇත්තේ, ලාභ ලාභ ගිණුම හරහා සාධාරණ අගයට නිර්මාණය වූ මූල්‍ය වගකීම්, ණය හා අයවිය යුතු දේ, හෝ ඵලදායි හෙජ් කිරීම සඳහා හෙජ් කිරීමේ මෙවලම් ලෙස නම්කල ව්‍යුත්පන්න උපකරණ සුදුසු පරිදි වේ. සංස්ථාව තම මූලික හඳුනා ගැනීමේ දීම තම මූල්‍ය වගකීම් වර්ගීකරණය තීරණය කරයි.

මූලික හඳුනා ගැනීමේ දී සියළුම මූල්‍ය වගකීම් සාධාරණ වටිනාකමට හා, ණය හා අයවිය යුතු දේ ක්‍රමක්ෂේපිත පිරිවැයට හඳුනා ගනියි. මෙයට කෙලින්ම අර්පණය කළ හැකි වියදම්ද ඇතුලත් වේ. සංස්ථාවේ මූල්‍ය වගකීම් වල වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ හා බැංකු අයිරාව ඇතුලත් වේ.

**පසු තක්සේරුව**

සංස්ථාවේ මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය කළ පිරිවැයට අගය කරයි.

**හඳුනා නොගැනීම**

මූල්‍ය වගකීමක් හඳුනා නොගැනෙන්නේ, වගකීමට ඇති බැඳීමෙන් නිදහස් වූ විට හෝ අවලංගු කල විට හෝ කල් ඉකුත්වූ විටයි.

## 7. පළමු වරට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත ( ශ්‍රී. ල මූ.වා.ප්‍ර/ ශ්‍රී.ල.ගි.ප්‍ර) යොදා ගැනීම

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මෙම මූල්‍ය ප්‍රකාශයන් මෙම සංස්ථාව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (එස්.එල්.එෆ්.ආර්.එස්/එල්.කේ.ඒ.එස්) භාවිතා කරමින් පිළියෙල කරන ලද පළමුවැන්න වේ. 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේද සඳහා සංස්ථාව සිය මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කළේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවය.

ඒ අනුව සංස්ථාව 2012 ජනවාරි 01 දින සිට ආරම්භ වන කාලපරිච්ඡේදයන් සඳහා අදාලවන පරිදි ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (එස්.එල්.එෆ්.ආර්.එස්/එල්.කේ.ඒ.එස්) අනුකූලව මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කර ඇති අතර, ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විස්තර කර ඇති පරිදි 2011 දෙසැම්බර් 31 දිනට හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා සංසන්දනාත්මක කාලපරිච්ඡේද දත්ත ඉදිරිපත් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී,සංස්ථාවේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ආරම්භක ප්‍රකාශය පිළියෙල කරන ලද්දේ ආයතනය ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (එස්.එල්.එෆ්.ආර්.එස්/එල්.කේ.ඒ.එස්)වෙත මාරු වූ දිනය වූ 2011 ජනවාරි 01 වන දිනටය. මෙම සටහන මඟින් 2010.12.31 දිනට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව ප්‍රකාශයට පත්කරන ලද සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශය සඳහා ශ්‍රී.ල.මූ.වා.ප්‍ර වලට අනුව සංස්ථාවට අදාල ප්‍රධාන ගැලපීම් කර 2011 ජනවාරි 01 දිනට මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කර තිබේ.

## අදාළ නිදහස් කිරීම්

SLFRS 1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති මඟින් ප්‍රථම වරට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති යොදා ගන්නා පුද්ගලයින්ට (SLFRS/LKAS) ගිණුම්කරණ ප්‍රමිති ප්‍රත්‍යවේක්ෂණ ලෙස යොදා ගැනීම සම්බන්ධව යම් යම් නිදහස් කිරීම් සඳහා ඉඩ සලසා දෙයි.

සංස්ථාව පහතින් දැක්වෙන නිදහස් කිරීම් භාවිත කර ඇත

SLAS පෙර පැවති ගිණුම් ප්‍රමිතයනට අනුව සමහර දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන වටිනාකමට ගිණුම්වල දක්වා තිබණි. පහත සටහනේ දී ඇති දින වලදී සිදුකල ප්‍රත්‍යාගණනයේ වටිනාකම් වත්කම් වල සාධාරණ වටිනාකම නිරූපණය කරන බැවින් එම වටිනාකම වත්කම් වල පිරිවැය ලෙස සලකා කටයුතු කිරීමට සංස්ථාව තීරණය කරන ලදී.

**රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව**

**2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ගිණුම්** සටහන 03

| ආදායම | 2012 | 2012 | 2011 | 2011 |
|---|---|---|---|---|
| **ආදායම - රා.ඖ.ස** | රු. | රු. | රු. | රු. |
| තොග වෙළඳාම | 2,027,462,772 | | 2,091,099,161 | |
| ජිවනී වෙළඳාම | 63,867,890 | | 49,330,484 | |
| ඔසුසල වෙළඳාම | 2,185,864,145 | | 1,974,823,472 | |
| ඔසුසල් වෙත මාරුකිරීම් | 718,441,193 | | 678,794,365 | |
| නොඉපයූ ලාභ සඳහා වෙන්කිරීම් | (3,257,373) | | 2,679,004 | |
| ණය රක්‍ෂණ යෝජනා ක්‍රමය | 1,506,345 | | 4,457,344 | |
| විශේෂ ඇනවුම් මත ආනයන | 630,730 | | 4,985,668 | |
| සැපයුම්කරුවන්ගෙන් අයවූ වන්දි | 7,157,040 | | | |
| | | **5,001,672,742** | | **4,806,169,497** |
| **ආදායම - රා.බෙ.ග** | | | | |
| ආනයනික සැපයුම් | 14,195,545,611 | | 10,710,183,106 | |
| දේශීය සැපයුම් | 2,401,917,605 | | 1,738,393,445 | |
| ම.මි.ගෑ. ඒකකය හරහා සැපයුම් | 1,008,563 | | 74,208,925 | |
| සැපයුම්කරුවන්ගෙන් අයවූ වන්දි | 10,020,672 | | 46,504,669 | |
| | | **16,608,492,451** | | **12,569,290,145** |
| **මුළු ආදායම** | | **21,610,165,194** | | **17,375,459,642** |

**විකුණුම් පිරිවැය/ඍජ වියදම්** සටහන 04

| ඍජු වියදම් - රා.බෙ.ග | 2012 | 2012 | 2011 | 2011 |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| **ආදායම** | | **16,608,492,451** | | **12,569,290,145** |
| **ඍජු වියදම්** | | | | |
| ර.බෙ.ග ඇණවුම් වල පිරිවැය (මි.ර.ගැ) | 12,844,532,712 | | 11,121,910,544 | |
| තිරු ගාස්තු සහ බදු | 703,433,976 | | 647,413,989 | |
| දේශීය සැපයුම් පිරිවැය | 2,361,043,561 | | 1,769,517,093 | |
| ම.මි.ගෑ. ඒකකය හරහා සැපයුම් පිරිවැය | - | | 72,753,848 | |
| | | **15,909,010,249** | | **13,611,595,473** |
| බැංකු වියදම් ( මුද්දර ගාස්තු, කොමිස්, ණයවර ලිපි | 147,463,703 | | 150,204,476 | |
| ගොඩබෑමේ වියදම් | 26,730,376 | | 25,879,325 | |
| ආනයන බලපත්‍ර ගාස්තු | 18,265,097 | | 17,449,752 | |
| | | **192,459,176** | | **193,533,553** |
| **අඩු කලා :** | | | | |
| මාර්ගස්ථ තොග | | 686,191,229 | | 2,016,573,939 |
| **ඍජු වියදම්/විකුණුම් පිරිවැය** | | **15,415,278,195** | | **11,788,555,087** |
| **දළ ලාභය/අතිරික්තය** | | **1,193,214,256** | | **780,735,058** |

සටහන 05

| **විකුණුම් පිරිවැය - රා.ඖ.ස** | **තොග වෙළඳාම** | **ඔසුසල වෙළඳාම** | **මුළු වෙළඳාම රා.ඖ.ස-2012** | **මුළු වෙළඳාම රා.ඖ.ස-2012 (නැවත ප්‍රකාශිත)** |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| වර්ෂය ආරම්භයේ වෙළඳ තොගය | 538,445,634 | 342,729,364 | 881,174,998 | 866,745,819 |
| **එකතු කළා** | | | | |
| ආනයනික බෙහෙත් | 1,479,670,408 | | 1,479,670,408 | 1,335,472,125 |
| භාවිතා කරන ලද අමුද්‍රව්‍ය | | | - | - |
| රසායනික ද්‍රව්‍ය | 802,381 | | 802,381 | 1,047,753 |
| දේශීය මිලදී ගැනුම් (රා.ඖ.ස) | 302,296,729 | | 302,296,729 | 284,968,946 |
| රසායනාගාර පරීක්‍ෂණ වියදම් | | - | - | - |
| ම.මි.ගෑ ඒකකයේ මිලදී ගැනුම් | 485,662,165 | | 485,662,165 | 493,679,136 |
| දේශීය මිලදී ගැනුම් (ඔසුසල) | - | 1,189,782,058 | 1,189,782,058 | 963,339,881 |
| තොග මාරු කරීම් | | 718,441,193 | 718,441,193 | 678,794,365 |
| **විකිණීම සඳහා තිබූ වෙළඳ තොගය** | **2,806,877,316** | **2,250,952,615** | **5,057,829,932** | **4,624,048,026** |
| **අඩු කලා :** | | | | |
| වර්ෂය අවසානයේ වෙළඳ තොගය | 668,224,747 | 430,036,973 | 1,098,261,721 | 897,130,658 |
| **විකුණුම් පිරිවැය සහ මාරු කිරීම්** | **2,138,652,569** | **1,820,915,642** | **3,959,568,211** | **3,726,917,368** |
| **මුළු වෙළඳාම** | | | | |
| වට්ටම් අඩුකල පසු විකුණුම් | 2,027,462,772 | 2,185,864,145 | 4,213,326,917 | 4,806,169,497 |
| **විකුණුම් පිරිවැය** | 1,420,211,376 | 1,820,915,642 | 3,241,127,018 | 3,036,581,829 |
| **දළ වෙළඳ ලාභය** | **607,251,397** | **364,948,503** | **972,199,900** | **1,769,587,668** |

**රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව**

**2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඔසුසල ආදායම් ප්‍රකාශය**

**සටහන - 5 අ**

| විකුණුම් පිරිවැය | ඔසුසල වෙළදාම කොළඹ 07 | ඔසුසල වෙළදාම කොළඹ 04 | ඔසුසල වෙළදාම කොළඹ 01 | ඔසුසල වෙළදාම මහනුවර | ඔසුසල වෙළදාම නුගේගොඩ | ඔසුසල වෙළදාම අවිස්සාවේල්ල | ඔසුසල වෙළදාම රත්නපුර | ඔසුසල වෙළදාම මිනුවන්ගොඩ | ඔසුසල වෙළදාම පානදුර | ඔසුසල වෙළදාම ගාල්ල | ඔසුසල වෙළදාම මාතර | ඔසුසල වෙළදාම කුරුණෑගල | ඔසුසල වෙළදාම අම්පාර | ඔසුසල වෙළදාම හම්බන්තොට |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **ආරම්භක වෙළඳ තොගය** | 61,333,272 | 27,881,991 | 13,618,331 | 24,996,332 | 10,216,540 | 8,594,699 | 16,448,347 | 5,917,252 | 8,008,967 | 21,783,668 | 11,789,615 | 19,733,171 | 6,809,655 | 7,279,009 |
| ආනයනය කල ඖෂධ | | | | | | | | | - | - | - | - | - | |
| දේශීය මිලදීගැනීම් | 368,573,469 | 234,099,177 | 49,877,424 | 79,634,849 | 27,474,204 | 12,642,658 | 34,066,746 | 8,618,388 | 28,808,644 | 47,192,917 | 27,700,879 | 35,003,636 | 4,459,421 | 16,480,577 |
| තොග මාරුකිරීම් | 118,057,982 | 36,519,800 | 26,990,991 | 52,380,750 | 26,339,198 | 18,589,094 | 25,610,813 | 13,535,038 | 20,737,065 | 31,490,593 | 23,654,882 | 36,314,588 | 12,956,797 | 12,232,645 |
| **විකිණීම සඳහා ඇති තොගය** | **547,964,724** | **298,500,968** | **90,486,747** | **157,011,931** | **64,029,942** | **39,826,451** | **76,125,905** | **28,070,678** | **57,554,676** | **100,467,178** | **63,145,377** | **91,051,396** | **24,225,874** | **35,992,232** |
| වර්ෂය අවසානයේ වෙළඳ තොගය | 76,453,499 | 33,621,565 | 18,274,284 | 34,275,144 | 13,059,586 | 9,929,103 | 17,539,397 | 6,735,237 | 11,538,823 | 22,501,543 | 14,005,590 | 24,558,037 | 6,148,468 | 9,571,455 |
| **විකුණුම් පිරිවැය හා මාරුකිරීම්** | **471,511,225** | **264,879,403** | **72,212,463** | **122,736,788** | **50,970,356** | **29,897,348** | **58,586,508** | **21,335,441** | **46,015,853** | **77,965,634** | **49,139,786** | **66,493,359** | **18,077,405** | **26,420,776** |
| **මුළු වෙළඳාම** | | | | | | | | | | | | | - | |
| වට්ටම් අඩුකල පසු විකුණුම් | 557,432,351 | 298,226,353 | 85,249,396 | 147,855,885 | 62,311,879 | 36,494,631 | 68,865,487 | 27,149,221 | 57,124,189 | 91,045,043 | 61,400,139 | 82,192,761 | 22,799,717 | 32,038,794 |
| වරිපනම් බදු | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| | **557,432,351** | **298,226,353** | **85,249,396** | **147,855,885** | **62,311,879** | **36,494,631** | **68,865,487** | **27,149,221** | **57,124,189** | **91,045,043** | **61,400,139** | **82,192,761** | **22,799,717** | **32,038,794** |
| **අඩු කලා** | | | | | | | | | | | | | | |
| විකුණුම් පිරිවැය | 471,511,225 | 264,879,403 | 72,212,463 | 122,736,788 | 50,970,356 | 29,897,348 | 58,586,508 | 21,335,441 | 46,015,853 | 77,965,634 | 49,139,786 | **66,493,359** | 18,077,405 | 26,420,776 |
| **දළ වෙළඳ ලාභය** | **85,921,126** | **33,346,950** | **13,036,933** | **25,119,097** | **11,341,523** | **6,597,282** | **10,278,978** | **5,813,779** | **11,108,336** | **13,079,409** | **12,260,353** | **15,699,402** | **4,722,311** | **5,618,018** |

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඔසුසල ආදායම් ප්‍රකාශය

සටහන - 5 අ

| විකුණුම් පිරිවැය | ඔසුසල වෙළදාම මීගොඩ | ඔසුසල වෙළදාම අනුරාධපුර | ඔසුසල වෙළදාම මහරගම | ඔසුසල වෙළදාම ජයවර්ධනපුර | ඔසුසල වෙළදාම කරාපිටිය | ඔසුසල වෙළදාම මීගමුව | ඔසුසල වෙළදාම බදුල්ල-සතොස | ඔසුසල වෙළදාම දියතලාව | ඔසුසල වෙළදාම යාපනය | ඔසුසල වෙළදාම පොළොන්නරුව | සතොස ශාඛාව රත්මලාන | සතොස ශාඛාව පිළියන්දල | සතොස ශාඛාව කලුතර | ප්‍රාදේශිය ගබඩාව මහනුවර | සමස්ථ ඔසුසල වෙළඳ ක්‍රියාකාරකම් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **ආරම්භක වෙළඳ තොගය** | 772,341 | 11,617,946 | 18,556,555 | 19,121,248 | 17,331,808 | 9,824,943 | 7,739,336 | 2,709,756 | 3,112,059 | - | 1,131,015 | 1,327,752 | 1,197,540 | 3,876,214 | 342,729,364 |
| ආනයනය කල ඖෂධ | | | | | | | | | | | | | | | |
| දේශිය මිලදිගැනීම් | 687,743 | 20,381,257 | 35,018,924 | 71,404,578 | 29,634,033 | 25,717,609 | 13,968,199 | 2,865,467 | 2,854,425 | 6,037,075 | 3,004,954 | 2,542,481 | 1,031,346 | 980.00 | 1,189,782,058 |
| තොග මාරුකිරීම් | 2,031,274 | 19,092,498 | 23,448,209 | 45,716,547 | 24,437,933 | 24,822,415 | 19,139,111 | 9,586,875 | 11,170,486 | 8,694,024 | 5,039,863 | 2,433,780 | 2,042,385 | 65,375,555 | 718,441,193 |
| **විකිණීම සඳහා ඇති තොගය** | **3,491,358** | **51,091,701** | **77,023,688** | **136,242,372** | **71,403,775** | **60,364,966** | **40,846,647** | **15,162,098** | **17,136,970** | **14,731,099** | **9,175,832** | **6,304,014** | **4,271,271** | **69,252,748** | **2,250,952,615** |
| වර්ෂය අවසානයේ වෙළඳ තොගය | 575,065 | 13,429,088 | 19,603,419 | 26,462,815 | 18,883,397 | 11,753,733 | 9,043,516 | 3,762,524 | 6,321,756 | 9,564,334 | 1,906,162 | 1,565,018 | 888,880 | 8,065,537 | 430,036,973 |
| **විකුණුම් පිරිවැය හා මාරුකිරීම්** | **2,916,293** | **37,662,613** | **57,420,269** | **109,779,557** | **52,520,378** | **48,611,233** | **31,803,131** | **11,399,573** | **10,815,214** | **5,166,766** | **7,269,670** | **4,738,996** | **3,382,391** | **61,187,211** | **1,820,915,642** |
| **මුළු වෙළඳාම** | | | | | | | | | | | | | | | |
| වට්ටම් අඩුකල පසු විකුණුම් | 3,720,549 | 46,425,433 | 70,587,654 | 132,582,906 | 61,401,894 | 58,523,648 | 39,500,527 | 14,500,936 | 13,867,660 | 7,335,286 | 8,884,249 | 5,938,176 | 4,100,008 | 88,309,374 | 2,185,864,145 |
| වරිපනම් බදු | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| | **3,720,549** | **46,425,433** | **70,587,654** | **132,582,906** | **61,401,894** | **58,523,648** | **39,500,527** | **14,500,936** | **13,867,660** | **7,335,286** | **8,884,249** | **5,938,176** | **4,100,008** | **88,309,374** | 2,185,864,145 |
| **අඩු කලා** | | | | | | | | | | | | | | | |
| විකුණුම් පිරිවැය | 2,916,293 | 37,662,613 | 57,420,269 | 109,779,557 | 52,520,378 | 48,611,233 | 31,803,131 | 11,399,573 | 10,815,214 | 5,166,766 | 7,269,670 | 4,738,996 | 3,382,391 | 61,187,211 | 1,820,915,642 |
| **දළ වෙළඳ ලාභය** | **804,256** | **8,762,820** | **13,167,385** | **22,803,349** | **8,881,516** | **9,912,415** | **7,697,396** | **3,101,362** | **3,052,446** | **2,168,520** | **1,614,579** | **1,199,180** | **717,617** | **27,122,163** | **364,948,503** |

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ගිණුම්

ග්ලූකෝස්. පිවනි සහ බී.බී ක්‍රීම් නිෂ්පාදන පිරිවැය සටහන - 6

| | 2012 රු | 2012 රු | 2011 රු | 2011 රු |
|---|---|---|---|---|
| **අමුද්‍රව්‍ය ආරම්භක තොගය** | | 1,622,578 | | 595,984 |
| **එකතු කලා :** අමුද්‍රව්‍ය මිලදී ගැනීම් | | **21,651,980** | | **11,911,803** |
| | | **23,274,558** | | **12,507,786** |
| **අඩුකලා :** අමුද්‍රව්‍ය අවසන් තොගය | | 1,259,183 | | 990,252 |
| **අමුද්‍රව්‍ය පිරිවැය** | | **22,015,375** | | **11,517,534** |
| **නිෂ්පාදන පිරිවැය** | | | | |
| වැටුප්,වේතන හා දීමනා | 7,742,813 | | 7,492,697 | |
| අතිකාල දීමනා | 1,891,889 | | 1,579,122 | |
| නිල ඇඳුම් | 131,642 | | 169,829 | |
| රෝහල් ගාස්තු ප්‍රතිපූරණය | 128,013 | | 104,982 | |
| අර්ථසාධක | 649,068 | | 625,604 | |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 165,328 | | 150,750 | |
| පැමිණීමේ ප්‍රසාද දීමනා | 284,000 | | 301,900 | |
| වාර්ෂික ලාභාංශ ප්‍රසාද දීමනා | 354,699 | | 708,200 | |
| සේවක සුභසාධන වියදම් | 719,633 | | 700,533 | |
| වෛද්‍ය වියදම් | 352,417 | | 354,688 | |
| විදුලිය | 2,901,010 | | 2,075,360 | |
| ක්ෂය කිරීම් | 1,604,398 | | 948,978 | |
| අලුත්වැඩියා හා නඩත්තු | 183,476 | | 226,101 | |
| ඇසුරුම් ද්‍රව්‍ය | 8,823,586 | | 6,908,103 | |
| | | **25,931,972** | | **22,346,847** |
| අපතේ යාම් | | - | | - |
| **භාණ්ඩ වල නිෂ්පාදන පිරිවැය** | | **47,947,346** | | **33,864,381** |

| **පිවනි වෙළඳාම** | 2012 රු | 2012 රු | 2011 රු | 2011 රු |
|---|---|---|---|---|
| වට්ටම් අඩුකල පසු විකුණුම් | | 63,867,890 | | 49,330,484 |
| ආරම්භක තොගය (නිමි භාණ්ඩ) | 4,093,626 | | 3,652,333 | |
| **එකතු කළා** | | | | |
| භාණ්ඩවල නිෂ්පාදන පිරිවැය | 47,947,346 | | 33,864,381 | |
| | **52,040,972** | | **37,516,714** | |
| **අඩු කළා** | | | | |
| අවසාන තොගය (නිමි භාණ්ඩ) | 1,477,837 | | 1,717,742 | |
| විකුණුම් පිරිවැය | | 50,563,135 | | 35,798,972 |
| **දළ වෙළඳ ලාභය** | | **13,304,755** | | **13,531,513** |

**රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව**

**2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ගිණුම්**

**අනෙකුත් මෙහෙයුම් ආදායම්** සටහන - 7

| | 2012<br>රු | 2011<br>රු |
|---|---|---|
| රථ නවතා තැබීමේ ගාස්තු | 201,600 | 168,000 |
| ටෙන්ඩර් හා ආකෘති පත්‍ර විකුණුම් | 5,818,596 | 8,523,407 |
| ගෙවල් කුලී ලැබීම් | - | 771,600 |
| භාණ්ඩාගාර බිල්පත් පොළිය | 2,628,142 | 1,123,126 |
| අබල ද්‍රව්‍ය විකුණුම් | 604,546 | 60,050 |
| අතිරික්ත මුදල් කළමනාකරණයෙන් ලද ආදායම | - | 14,504 |
| විවිධ ආදායම් | 1,520,596 | 703,809 |
| ඊ චැනලින් සේවාවෙන් ලද කොමිස් | 400 | 6,330 |
| නිවාඩු නිකේතනයන්ගේ කුලී ආදායම් | 764,525 | 657,850 |
| පූර්ව යෝග්‍යතා ආදායම් | - | 1,748,760 |
| සාම්පල් පරීක්ෂාවෙන් ලද ආදායම | - | 1,151,984 |
| අයකර ගත් බොල්ණය | 1,072,728 | 4,877,625 |
| සැපයුම්කරුවන්ගේ සම්මන්ත්‍රණය | 1,146,803 | - |
| නිෂ්කාශනය නොවූ හා ප්‍රමාදවූ චෙක්පත් මත දඩ පොළිය | 1,346,907 | 741,338 |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීම් මත ලාභය | - | 2,682,498 |
| | **15,104,844** | **23,230,881** |

**රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව**

**2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ගිණුම්**

**පරිපාලන පිරිවැය** — **සටහන 8**

| (ආ) පරිපාලන පිරිවැය | රා.ඖ.ස. | | | මුළු වෙළඳාම රා.ඖ.ස. | මුළු වෙළඳාම රා.බෙ.ග. | මුළු වෙළඳාම 2012 | මුළු වෙළඳාම 2011 |
|---|---|---|---|---|---|---|---|
| | ඔසුසල වෙළඳාම | පිවනි ඒකකය | තොග වෙළඳාම | | | | |
| **සේවක වේතන** | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වැටුප්,වේතන හා දීමනා | 115,174,591 | - | 77,820,741 | 192,995,331 | 99,044,579 | 292,039,911 | 267,887,869 |
| අතිකාල දීමනා | 17,023,875 | - | 6,742,456 | 23,766,331 | 4,494,970 | 28,261,301 | 27,449,063 |
| සේවක පුහුණු වියදම් | - | - | 870,564 | 870,564 | 1,107,990 | 1,978,554 | 1,501,994 |
| නිල ඇඳුම් | 1,675,907 | - | 665,883 | 2,341,790 | 847,487 | 3,189,277 | 3,148,598 |
| රෝහල් ගාස්තු ප්‍රතිපූරණය | 2,739,256 | - | 2,481,643 | 5,220,899 | 3,158,455 | 8,379,355 | 8,363,131 |
| අර්ථසාධක | 9,869,932 | - | 6,243,108 | 16,113,040 | 7,945,774 | 24,058,814 | 22,532,797 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 2,001,855 | - | 1,358,122 | 3,359,977 | 1,728,519 | 5,088,496 | 4,999,798 |
| මාසික පැමිණීමේ දීමනා | 4,728,276 | - | 3,133,631 | 7,861,907 | 3,988,257 | 11,850,164 | 11,052,375 |
| ක්‍රීඩා සමාජ | - | - | 875,146 | 875,146 | 1,113,822 | 1,988,969 | 685,413 |
| වාර්ෂික ලාභාංශ ප්‍රසාද දීමනා | 4,359,552 | - | 3,393,482 | 7,753,034 | 4,318,977 | 12,072,011 | 24,654,683 |
| පාරිතෝෂිකය | - | - | 5,894,310 | 5,894,310 | 7,501,849 | 13,396,159 | 11,058,573 |
| ඉඩම්/නිවාස ණය පොළී | 2,708,805 | 220,416 | 2,055,109 | 4,984,330 | 2,615,594 | 7,599,924 | 5,370,162 |
| වාහන කුලී වියදම් | - | - | 345,000 | 345,000 | 345,000 | 690,000 | 281,710 |
| උපයන විට ගෙවීම් | - | - | 382,915 | 382,915 | 487,346 | 870,261 | 2,776,773 |
| රා.ඖ.නී.ස. සංවත්සර ගෙවීම් | - | - | 1,448,696 | 1,448,696 | 1,843,794 | 3,292,490 | 1,453,326 |
| මරණ පාරිතෝෂිකය | - | - | 170,228 | 170,228 | 216,653 | 386,881 | 250,632 |
| | **160,282,049** | **220,416** | **113,881,032** | **274,383,497** | **140,759,068** | **415,142,565** | **393,466,896** |
| **ගමන් වියදම්** | | | | | | | |
| විදේශීය ගමන් වියදම් - අධ්‍යක්ෂ | - | - | - | - | - | - | - |
| දේශීය ගමන් වියදම් - අධ්‍යක්ෂ | - | - | - | - | - | - | 77,140 |
| විදේශීය ගමන් වියදම් - වෙනත් | - | - | 392,173 | 392,173 | 43,575 | 435,748 | 136,690 |
| දේශීය ගමන් වියදම් - වෙනත් | 377,401 | - | 3,784,375 | 4,161,776 | 420,486 | 4,582,262 | 3,732,398 |
| | **377,401** | **-** | **4,176,548** | **4,553,949** | **464,061** | **5,018,010** | **3,946,228** |
| **සැපයුම් සහ අවශ්‍යතා** | | | | | | | |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 3,348,990 | 83,238 | 3,926,058 | 7,358,286 | 1,308,686 | 8,666,972 | 11,869,542 |
| අධ්‍යක්‍ෂක මණ්ඩල රැස්වීම් වියදම් | - | - | 195,228 | 195,228 | 65,076 | 260,304 | 196,113 |
| සංග්‍රහ වියදම් - අනෙකුත් | - | - | 204,017 | 204,017 | 68,006 | 272,022 | 258,631 |
| රථ වාහන අළුත්වැඩියා | - | - | 5,337,820 | 5,337,820 | 1,779,273 | 7,117,093 | 5,745,491 |
| ඉන්ධන වියදම් | - | - | 8,921,741 | 8,921,741 | 2,973,914 | 11,895,655 | 8,163,230 |
| වාහන බලපත්‍ර ගාස්තු | - | - | 115,866 | 115,866 | 38,622 | 154,488 | 139,422 |
| | **3,348,990** | **83,238** | **18,700,729** | **22,132,957** | **6,233,576** | **28,366,533** | **26,372,429** |
| **අ ත්වැඩියා සහ නඩත්තු** | | | | | | | |
| ගොඩනැගිලි | 947,601 | - | 2,690,501 | 3,638,102 | 2,690,501 | 6,328,603 | 8,848,424 |
| ලී බඩු, සවිකිරීම් හා උපකරණ | 1,451,603 | - | 2,005,712 | 3,457,315 | 2,005,712 | 5,463,027 | 4,714,871 |
| පරිගණක | 164,599 | - | 4,065,802 | 4,230,401 | 4,065,802 | 8,296,202 | 6,127,707 |
| | **2,563,803** | **-** | **8,762,014** | **11,325,818** | **8,762,014** | **20,087,832** | **19,691,002** |
| **ප්‍රවාහන, සන්නිවේදන,** | | | | | | | |
| **උපයෝගිතා හා වෙනත් සේවා** | | | | | | | |
| කුලී | 10,849,550 | - | 210,000 | 11,059,550 | 210,000 | 11,269,550 | 8,391,467 |
| කල්බදු කුලී | 764,143 | - | 160,000 | 924,143 | - | 924,143 | 1,720,516 |
| වරිපනම් හා ගාස්තු | 439,014 | 13,500 | 490,331 | 942,846 | 490,331 | 1,433,177 | 1,464,474 |
| වතුර බිල් | 853,415 | 68,569 | 474,066 | 1,396,049 | 474,066 | 1,870,115 | 2,098,869 |
| විදුලිය | 13,101,803 | - | 8,888,385 | 21,990,188 | 8,888,385 | 30,878,573 | 22,518,880 |
| තැපැල්, විදුලිපණිවුඩ හා දුරකථන ගාස්තු | 2,072,257 | 37,789 | 4,752,911 | 6,862,957 | 4,752,911 | 11,615,868 | 9,359,662 |
| වෙළඳ දායකත්ව සහ | 257,403 | - | 129,157 | 386,559 | 129,157 | 515,716 | 668,813 |
| සඟරා | | | | - | | - | - |
| වෘත්තීය ගාස්තු | - | - | 2,251,700 | 2,251,700 | 2,251,700 | 4,503,400 | 1,289,879 |
| රක්ෂණ | - | - | 1,122,736 | 1,122,736 | 1,122,736 | 2,245,472 | 1,795,269 |
| පුවත්පත් දැන්වීම් | - | - | 3,478,307 | 3,478,307 | 8,116,049 | 11,594,356 | 17,418,252 |
| ආරක්‍ෂක සේවා | 11,097,237 | 264,515 | 3,172,420 | 14,534,171 | 3,172,420 | 17,706,592 | 16,394,184 |
| ක්ෂය කිරීම් | 8,939,631 | - | 10,947,083 | 19,886,714 | 10,947,083 | 30,833,797 | 26,714,494 |
| බෙහෙත් බලපත්‍ර ගාස්තු | 210,560 | - | 300,150 | 510,710 | 2,701,347 | 3,212,057 | 2,885,738 |
| ආනයන බලපත්‍ර ගාස්තු | | | - | - | - | - | - |
| විවිධ වියදම් | 75,421 | 811 | 575,299 | 651,532 | 270,729 | 922,261 | 589,053 |
| අධ්‍යක්ෂ ගාස්තු | - | - | 273,375 | 273,375 | 273,375 | 546,750 | 348,750 |
| විගණන ගාස්තු | - | - | 338,480 | 338,480 | 338,480 | 676,960 | 1,298,776 |
| ටෙන්ඩර් මණ්ඩල රැස්වීම් ගාස්තු | - | - | 2,084,750 | 2,084,750 | 4,864,418 | 6,949,168 | 8,574,600 |
| සේවක සුභසාධන වියදම් | 12,057,756 | - | 9,783,768 | 21,841,524 | 12,452,068 | 34,293,593 | 31,485,089 |
| සේවක වෛද්‍ය වියදම් | 4,489,818 | - | 2,979,605 | 7,469,423 | 3,792,225 | 11,261,648 | 10,624,191 |
| ප්‍රදාන | - | - | 172,376 | 172,376 | - | 172,376 | 2,071,042 |
| භාණ්ඩාගාර බිල් ප්‍රත්‍යාගණන වෙනස | - | - | 45,454 | 45,454 | - | 45,454 | 41,793 |
| නිවාඩු නිකේතන වියදම් | - | - | 1,242,594 | 1,242,594 | 1,581,483 | 2,824,077 | 2,788,811 |
| | **65,208,009** | **385,183** | **53,872,947** | **119,466,139** | **66,828,963** | **186,295,102** | **170,542,600** |
| | | | | - | | | |
| **මුළු පරිපාලන පිරිවැය** | **231,780,253** | **688,837** | **199,393,271** | **431,862,360** | **223,047,683** | **654,910,043** | **614,019,155** |

**රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව**

**2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ගිණුම්**

**සටහන -8අ**

| ඔසුසල පොදුකාර්ය පිරිවැය | ඔසුසල වෙළදාම කොළඹ 07 රු | ඔසුසල වෙළදාම කොළඹ 04 රු | ඔසුසල වෙළදාම කොළඹ 01 රු | ඔසුසල වෙළදාම මහනුවර රු | ඔසුසල වෙළදාම නුගේගොඩ රු | ඔසුසල වෙළදාම අවිස්සාවේල්ල රු | ඔසුසල වෙළදාම රත්නපුර රු | ඔසුසල වෙළදාම මිනුවන්ගොඩ රු | ඔසුසල වෙළදාම පානදුර රු | ඔසුසල වෙළදාම ගාල්ල රු | ඔසුසල වෙළදාම මාතර රු | ඔසුසල වෙළදාම කුරුණෑගල රු | ඔසුසල වෙළදාම අම්පාර රු | ඔසුසල වෙළදාම හම්බන්තොට රු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **(ආ) පරිපාලන පිරිවැය** | | | | | | | | | | | | | | |
| **සේවක වේතන** | | | | | | | | | | | | | | |
| වැටුප්,වේතන හා දීමනා | 18,896,409 | 8,150,367 | 4,015,725 | 6,265,955 | 5,040,314 | 3,480,944 | 5,619,689 | 2,636,858 | 4,775,549 | 6,748,325 | 5,121,296 | 3,881,952 | 2,232,998 | 2,816,411 |
| අතිකාල දීමනා | 3,076,037 | 1,645,422 | 299,052 | 1,268,569 | 781,097 | 460,432 | 695,672 | 397,494 | 613,278 | 713,447 | 456,705 | 565,562 | 536,206 | 274,997 |
| නිල ඇඳුම් | 274,855 | 129,639 | 65,086 | 97,591 | 63,070 | 46,012 | 84,601 | 37,481 | 67,684 | 96,729 | 71,932 | 67,641 | 31,924 | 44,496 |
| රෝහල් ගාස්තු ප්‍රතිපූරණය | 548,996 | 258,998 | 194,840 | 372,412 | 264,275 | 31,914 | 165,847 | - | 133,893 | 26,240 | 188,272 | 25,992 | 2,250 | 15,750 |
| අර්ථ සාධක | 1,583,452 | 698,488 | 364,121 | 557,349 | 433,273 | 303,329 | 480,915 | 235,981 | 420,670 | 608,139 | 440,447 | 334,295 | 192,324 | 243,859 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 359,553 | 142,500 | 63,703 | 112,500 | 68,055 | 63,548 | 98,250 | 36,630 | 82,500 | 120,000 | 78,000 | 82,500 | 35,882 | 45,000 |
| වාර්ෂික ලාභාංශ ප්‍රසාද දීමනා | 748,995 | 327,328 | 174,633 | 280,457 | 147,845 | 128,671 | 234,191 | 72,462 | 201,590 | 296,490 | 186,165 | 201,075 | 63,896 | 98,585 |
| ඉඩම්/නිවාස ණය පොළී | 633,681 | 297,995 | 158,352 | 105,628 | 219,102 | 34,268 | 47,175 | 11,760 | 21,903 | 110,749 | 65,264 | 273,286 | - | - |
| පැමිණීමේ දීමනා | 806,100 | 298,600 | 145,300 | 318,100 | 206,900 | 152,500 | 245,100 | 111,700 | 198,600 | 315,756 | 211,640 | 188,200 | 110,100 | 75,100 |
| | **26,928,078** | **11,949,337** | **5,480,812** | **9,378,561** | **7,223,932** | **4,701,617** | **7,671,441** | **3,540,366** | **6,515,668** | **9,035,875** | **6,819,720** | **5,620,504** | **3,205,579** | **3,614,198** |
| **ගමන් වියදම්** | | | | | | | | | | | | | | |
| දේශීය ගමන් වියදම් - වෙනත් | 25,324 | 2,066 | 3,442 | 4,822 | 1,787 | 22,208 | 15,758 | 7,948 | 5,846 | 2,345 | 10,460 | 3,132 | 1,887 | 2,741 |
| | **25,324** | **2,066** | **3,442** | **4,822** | **1,787** | **22,208** | **15,758** | **7,948** | **5,846** | **2,345** | **10,460** | **3,132** | **1,887** | **2,741** |
| **සැපයුම් සහ අවශ්‍යතා** | | | | | | | | | | | | | | |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 544,562 | 101,018 | 95,820 | 171,690 | 53,612 | 94,499 | 156,705 | 29,568 | 152,051 | 131,371 | 134,822 | 131,474 | 78,527 | 70,603 |
| | **544,562** | **101,018** | **95,820** | **171,690** | **53,612** | **94,499** | **156,705** | **29,568** | **152,051** | **131,371** | **134,822** | **131,474** | **78,527** | **70,603** |
| **අ ත්වැඩියා සහ නඩත්තු** | | | | | | | | | | | | | | |
| ගොඩනැගිලි | 332,345 | 84,890 | 23,906 | 13,806 | 4,784 | 14,280 | 107,323 | 4,550 | 16,201 | 38,040 | 27,439 | 22,847 | 15,493 | 11,202 |
| ලී බඩු, සවිකිරීම් හා උපකරණ | 166,493 | 12,426 | 46,735 | 110,392 | 47,498 | 19,542 | 58,139 | 11,909 | 90,779 | 72,745 | 58,227 | 76,967 | 43,301 | 78,148 |
| පරිගණක | 146,044 | - | - | 1,750 | - | - | - | - | 2,800 | - | 3,500 | - | - | 3,000 |
| | **644,882** | **97,316** | **70,641** | **125,948** | **52,282** | **33,821** | **165,462** | **16,459** | **109,780** | **110,784** | **89,166** | **99,814** | **58,793** | **92,351** |
| **ප්‍රවාහන, සන්නිවේදන, උපයෝගිතා හා වෙනත් සේවා** | | | | | | | | | | | | | | |
| කුලී | - | - | - | - | 982,000 | 254,610 | - | 448,784 | 645,000 | 480,000 | 480,000 | 802,200 | - | 566,000 |
| කල්බදු කුලී | - | - | - | 225,000 | 294,333 | - | 35,719 | - | - | - | - | - | - | - |
| වරිපනම් හා ගාස්තු | 235,620 | 83,160 | 71,379 | 31,316 | 5,000 | - | - | - | 2,500 | - | 7,758 | - | 325 | - |
| වතුර බිල් | 84,237 | 74,597 | 168,926 | 43,497 | 34,518 | 26,250 | 60,811 | 12,202 | 24,839 | 13,417 | 17,981 | 34,035 | 43,876 | 8,982 |
| විදුලිය | 3,269,711 | 911,561 | 232,800 | 769,767 | 231,456 | 196,266 | 791,635 | 115,565 | 480,727 | 646,458 | 649,825 | 410,223 | 410,264 | 356,357 |
| තැපැල්, විදුලිපණිවුඩ හා දුරකථන ගාස් | 222,175 | 157,055 | 46,519 | 38,416 | 114,277 | 41,075 | 122,342 | 27,655 | 43,437 | 189,981 | 40,907 | 85,007 | 39,643 | 69,134 |
| ක්ෂය කිරීම් | 1,162,703 | 639,745 | 386,612 | 513,678 | 207,896 | 264,463 | 653,829 | 17,912 | 199,134 | 464,039 | 125,205 | 88,919 | 439,821 | 205,695 |
| වෙළඳ දායකත්ව සහ සඟරා | 40,255 | 13,228 | - | 12,550 | 13,470 | 12,800 | 11,630 | 7,310 | 11,610 | 11,020 | 10,390 | 14,760 | - | 5,440 |
| ආරක්ෂක සේවා | 1,874,249 | 626,112 | 217,384 | 757,660 | 535,153 | 750,830 | 215,489 | 537,151 | 218,473 | 538,238 | 538,238 | 538,238 | 219,921 | 218,560 |
| බෙහෙත් බලපත්‍ර ගාස්තු | 11,200 | 11,200 | 13,440 | 11,200 | 11,200 | 11,200 | 11,200 | - | - | 11,200 | 11,200 | 11,200 | - | 11,200 |
ශේෂපත්‍ර දිනට පසු සිදුවූ සියලුම වැදගත් සිදුවීම් සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශනයෙහි අවශ්‍ය අවස්ථාවන්හිදී යෝග්‍ය වෙනස්කම් සිදුකර ඇති අතර, අවශ්‍ය තැන්හිදී මූල්‍ය ප්‍රකාශයට අනාවරණයන් සිදුකර ඇත.

## රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

## මූල්‍ය තත්ත්වය දැක්වෙන වාර්තාව

සටහන 27

| | සටහන | 2011 ජනවාරි 01 වන දිනට ( නව ගිණුම් ප්‍රමිතයන්ට SLFRS/LKAS මාරුවූ දින) | | |
|---|---|---|---|---|
| | | නව ගිණුම් ප්‍රමිත අනුව - SLFRS/LKAS රු | නැවත ඇගයීම රු | පැවති ගිණුම් ප්‍රමිත අනුව -SLAS රු |
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපළ,පිරියත හා උපකරණ | අ | 1,536,451,657 | 889,851,258 | 646,600,399 |
| දිගුකාලීන බදු ඉඩම් - රත්මලාන | අ | 11,000,000 | 11,000,000 | - |
| නොනිමි වැඩ - ප්‍රාග්ධනය | ආ | 564,961 | (2,200,000) | 2,764,961 |
| අනෙකුත් ජංගම නොවන වත්කම් | ආ | 13,479,257 | 874,266 | 12,604,991 |
| විලම්බිත බදු වත්කම් | ඇ | - | (13,510,356) | 13,510,356 |
| | | **1,561,495,875** | **886,015,168** | **675,480,707** |
| **ජංගම වත්කම්** | | | | |
| වෙළඳ තොගය | ඈ | 874,017,636 | (105,296,784) | 979,314,420 |
| මාර්ගස්ථ තොග | ඉ | 2,860,762,197 | 108,157,355 | 2,752,604,842 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු | ඊ | 3,453,354,349 | (110,662,011) | 3,564,016,360 |
| පෙරගෙවීම් | උ | 22,368,916 | 9,312,830 | 13,056,086 |
| අතැති මුදල් හා බැංකු මුදල් | ඌ | 671,104,056 | (31,895) | 671,135,951 |
| | | **7,881,607,155** | **(98,520,504)** | **7,980,127,659** |
| **මුළු වත්කම්** | | **9,443,103,030** | **787,494,664** | **8,655,608,366** |
| **ස්කන්ධය හා වගකීම්** | | | | |
| දායක ප්‍රාග්ධනය | | 59,055,258 | - | 59,055,258 |
| රඳවාගත් ලාභ | | 3,287,663,211 | 1,235,739,291 | 2,051,923,920 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | - | (467,073,828) | 467,073,828 |
| පොදු සංචිතය | | 66,061,447 | - | 66,061,447 |
| **මුළු ප්‍රාග්ධනය** | | **3,412,779,916** | **768,665,463** | **2,644,114,453** |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව | එ | 87,950,502 | - | 87,950,502 |
| විලම්බිත බදු වගකීම | ඒ | 25,399,285 | 25,399,285 | |
| | | **113,349,787** | **25,399,285** | **87,950,502** |
| **ජංගම වගකීම්** | | | | |
| වෙළඳ හා අනෙකුත් ණයහිමියෝ | ඔ | 1,551,401,545 | (8,128,678) | 1,559,530,223 |
| ආදායම් බදු බැඳියාව | | 232,468,854 | - | 232,468,854 |
| විලම්බිත ආදායම් | ඕ | 1,558,594 | 1,558,594 | |
| ජංගම මූල්‍ය වගකීම් | | 4,131,544,335 | - | 4,131,544,335 |
| | | **5,916,973,327** | **(6,570,084)** | **5,923,543,412** |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | | **9,443,103,030** | **787,494,664** | **8,655,608,366** |

**රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව**

**මූල්‍ය තත්ත්වය දැක්වෙන වාර්තාව**

සටහන 27

| | සටහන | 2011 දෙසැම්බර් 31 වන දිනට | | |
|---|---|---|---|---|
| | | නව ගිණුම් ප්‍රමිත අනුව - SLFRS/LKAS<br>රු | නැවත ඇගයීම<br>රු | පැවති ගිණුම් ප්‍රමිත අනුව -SLAS<br>රු |
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපළ,පිරියත හා උපකරණ | අ | 1,564,603,189 | 898,767,613 | 665,835,576 |
| දිගුකාලීන බදු ඉඩම් - රත්මලාන | අ | 10,840,000 | 10,840,000 | - |
| නොනිමි වැඩ - ප්‍රාග්ධනය | ආ | 16,193,567 | (2,200,000) | 18,393,567 |
| අනෙකුත් ජංගම නොවන වත්කම් | ආ | 13,800,775 | 874,266 | 12,926,509 |
| විලම්බිත බදු වත්කම් | ඇ | | (1,694,576) | 1,694,576 |
| | | **1,605,437,531** | **906,587,303** | **698,850,228** |
| **ජංගම වත්කම්** | | | | |
| වෙළඳ තොගය | ඈ | 887,455,903 | (105,408,611) | 992,864,514 |
| මාර්ගස්ථ තොග | ඉ | 2,086,268,828 | 107,729,164 | 1,978,539,664 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු | ඊ | 5,123,702,453 | (110,346,535) | 5,234,048,988 |
| පෙරගෙවීම් | උ | 24,478,862 | 8,943,031 | 15,535,831 |
| අතැති මුදල් හා බැංකු මුදල් | ඌ | 600,806,882 | (73,688) | 600,880,570 |
| | | 8,722,712,928 | (99,156,639) | 8,821,869,567 |
| **මුළු වත්කම්** | | **10,328,150,459** | **807,430,664** | **9,520,719,795** |
| **ස්කන්ධය හා වගකීම්** | | | | |
| දායක ප්‍රාග්ධනය | | 59,055,258 | - | 59,055,258 |
| රඳවාගත් ලාභ | | 3,377,491,107 | 1,155,963,149 | 2,221,527,958 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | - | (467,073,828) | 467,073,828 |
| පොදු සංචිතය | | 66,061,447 | - | 66,061,447 |
| **මුළු ප්‍රාග්ධනය** | | **3,502,607,812** | **688,889,321** | **2,813,718,491** |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව | එ | 74,894,076 | (11,191,816) | 86,085,892 |
| විලම්බිත බදු වගකීම | ඒ | 30,188,279 | 30,188,279 | - |
| | | **105,082,355** | **18,996,463** | **86,085,892** |
| **ජංගම වගකීම්** | | | | |
| වෙළඳ හා අනෙකුත් ණයහිමියෝ | ඔ | 1,784,155,464 | 99,227,255 | 1,684,928,209 |
| ආදායම් බදු බැඳියාව | | 219,331,798 | - | 219,331,798 |
| විලම්බිත ආදායම් | ඕ | 317,625 | 317,625 | |
| ජංගම මූල්‍ය වගකීම් | | 4,716,655,405 | - | 4,716,655,405 |
| | | 6,720,460,292 | 99,544,880 | 6,620,915,412 |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | | **10,328,150,459** | **807,430,664** | **9,520,719,795** |

## අ, අ – දේපල, පිරියත, උපකරණ, කල්බදු දේපල

උපකරණ, ගෘහභාණ්ඩ, පරිගණක, යතුරුපැදි හා පුස්තකාලපොත් හැර දේපල, පිරියත, උපකරණ පෙර පැවති ගිණුම් ප්‍රමිත SLAS යටතේ පහත දිනවලදි ප්‍රත්‍යාගණනය කර ශේෂ පත්‍රයේ දක්වා ඇත.

| | | |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | - | 31.12.2012 |
| රථ වාහන | - | 01.02.2012 |
| දේපල හා පිරියත | - | 31.12.2012 |

ඉහත ප්‍රත්‍යාගණන වටිනාකම් වත්කම් වල සාධාරණ වටිනාකම නිරූපණය කරන බැවින් එම වටිනාකම වත්කම් වල පිරිවැය ලෙස සලකා කටයුතු කිරීමට සංස්ථාව තිරණය කරන ලදි. (SLFRS/LKAS) නව ගිණුම් ප්‍රමිතයන්ට පරිවර්තනය වන දින දේපල, පිරියත, උපකරණ සඳහා පහත ගැලපිලි සිදුකරණ ලදි.

| | 2010 | 2011 |
|---|---|---|
| සංරචක ගිණුම්කරණ ගැලපීම් | 692,452 | 9,608,807 |
| ප්‍රත්‍යාගණන සංචිත ගැලපීම | 900,158,806 | 900,158,806 |
| මූල්‍ය කල්බදු සඳහා වර්ගීකරණය | (11,000,000) | (11,000,000) |
| | **887,851,258** | **898,767,613** |

තවදුරටත්, කල්බදු දේපල දේපලෙහි ඉතිරි ඵලදායි ජිවිත කාලය පුරා ක්‍රමක්ෂය කිරීම සිදුකරයි. (සෑම වසරකටම රු. 160,000 බැගින්)

### ආ – නොනිමි වැඩ - ප්‍රාග්ධනය, අනෙකුත් ජංගම නොවන වත්කම්

2010 වසරේ රු.2,200,000 ක් වු නොනිමි වැඩ ප්‍රාග්ධනය විලම්බිත වියදම් ගිණුමට මාරු කරන ලදි.

### ඇ, ඒ – විලම්බිත බදු වත්කම්/විලම්බිත බදු වගකීම්

(SLFRS/LKAS) නව ගිණුම් ප්‍රමිතයන්ට පරිවර්තනය වීමේදි මූල්‍ය ප්‍රකාශන වලට සිදුකල ගැලපීම් හේතුවෙන් 2010 දෙසැම්බර් 31 දිනට රු 25,399,285 විලම්බිත බදු වගකීමක් නිර්මාණය විය ( 2011 දෙසැම්බර් 31 දිනට එය රු 30,188,279 ක් විය)

### ඇ, ඉ – වෙළඳ තොගය හා මාර්ගස්ථ තොගය

පෙර පැවති ගිණුම් ප්‍රමිත යටතේ සංස්ථාවේ ගිණුම් වල මාර්ගස්ථ තොගය රු 105,296,784 ක් විය (2011 දෙසැම්බර් 31 දිනට එය රු 100,277,434 ක් විය). (SLFRS/LKAS) නව ගිණුම් ප්‍රමිතයනට අනුවද මෙම වටිනාකම් මාර්ගස්ථ තොග ලෙස දක්වන්නට සුදුසුකම් ලබන අතර භාණ්ඩවල අවදානම හා ප්‍රතිලාභ හුවමාරු වන දිනදි විදේශ ණය හිමියන් ගිණුම් ගත කර නොතිබීම නිසා මාර්ගස්ථ තොගය රු 2,860,571/- කින් වැඩි විය. (2011 දි එය රු. 7,451,730/-ක් විය)

### ඊ, උ - වෙළඳ හා අනෙකුත් ණයගැතියෝ හා පෙරගෙවීම්

පෙර පැවති ගිණුම් ප්‍රමිත SLAS අනුව, සේවක ණය, වෙළඳපල වටිනාකමට වඩා අඩුවෙන් පිරිවැයට ගිණුම් ගතකර තිබුණි. නව ගිණුම් ප්‍රමිත (SLFRS/LKAS), අනුව පරිවර්තනය වන දිනදි සංස්ථාව සේවක ණය සාධාරණ වටිනාකමට ගණනය කරන ලදි. එහි ප්‍රතිපලයක් ලෙස 2010 දෙසැම්බර් 31 දිනට පෙර ගෙවූ සේවක පිරිවැය රු. 9,312,830 ක් ලෙස ගණනය විය. (2011 දි එය රු 358,158 ක්වූ ක්‍රමක්ෂය අඩුකල පසු රු.8,943,031 ක් විය)

### ඌ – මුදල් සහ බැංකු ශේෂය

පෙර පැවති ගිණුම් ප්‍රමිත SLAS යටතේ, භාණ්ඩාගාර බිල්පත් ඒවායේ පිරිවැයට ගිණුම් ගතකර තිබුණි. නව ගිණුම් ප්‍රමිත (SLFRS/LKAS), අනුව එම ආයෝජන කල්පිරෙන තෙක් රඳවාගත් මූල්‍ය ආයෝජන ලෙස වර්ගකර දක්වන ලදි. (SLFRS/LKAS), නව ගිණුම් ප්‍රමිතයනට පරිවර්තනය වන දිනට එම ආයෝජන වල සාධාරණ වටිනාකමේ වෙනස රු. 31,895/- ක් ආදායම් ගිණුමට ගලපා ඇත. (2011 දි එය රු.73,688/- ක් විය )

### ඔ, ඕ - වෙළඳ හා අනෙකුත් ණයහිමියෝ හා විලම්බිත ආදායම්

පෙර පැවති ගිණුම් ප්‍රමිත SLAS යටතේ, ණය රක්ෂණ යෝජනා ක්‍රමය, වගකීමක් ලෙස ගිණුම් වල දක්වා තිබුණි.
කෙසේ වුවත් බෙදාහරින්නන් ගෙන් ලැබූ වාරික ආදායම සංස්ථාවට තෙවන පාර්ශවයක් වෙත ගෙවිය යුතු වගකීමක් ඇති නොකරන ලදි. මෙයින් රු.12,260,198 ක් (රු. 3,216,375 ක් 2011 දි) රඳවාගත් ඉපයුම් ගිණුමට මාරු කරන ලදි. 2012 දි රු 1,558,598 ක් (රු. 317,625 ක් 2011 දි) විලම්බිත ආදායම් ලෙස හදුනාගෙන ගිණුම් ගතකරන ලදි. මේ හැරුනුවිට මිලදි ගැනුම් වලින් නිසා ඇතිවූ විදේශ මුදල් හුවමාරු අගයයන්හි වෙනස ලෙස රු 4,131,520 ක් ගලපන ලදි. (2011 දි එය රු. 5,869,979 ක් විය). 2011 දි ගෙවියයුතු එකතුකල අගයමත බද්ද හා ජාතිය ගොඩනැගීමේ බද්ද රු.104,702,329 ක් විය.

### එ - විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව

සමස්ථ ආයුගණක වෙනස වූ රු 11,325,057 ක්, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වූ ගිණුම් ප්‍රකාශයේ දක්වා ඇත.

**රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව**

**නව ගිණුම් ප්‍රමිතයන් (SLFRS) ප්‍රථම වරට අනුගමනය කිරීම පැහැදිලි කිරීමේ සටහන්**

**ආදායම් වාර්තාව**

සටහන 28

| | සටහන | 2011<br>නව ගිණුම් ප්‍රමිත<br>අනුව- SLFRS/LKAS<br>රු | නැවත ඇගයීම<br>රු | 2011<br>පැවති ගිණුම්<br>ප්‍රමිත අනුව -SLAS<br>රු |
|---|---|---|---|---|
| ආදායම | අ | 17,375,459,642 | 58,626,684 | 17,316,832,958 |
| විකුණුම් පිරිවැය | ආ | (15,551,271,427) | (88,856,732) | (15,462,414,695) |
| **දළ ලාභය** | | **1,824,188,215** | | **1,854,418,263** |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | ඇ | 23,230,881 | (58,308,774) | 81,539,655 |
| | | - | | |
| පරිපාලන වියදම් | ඈ | (614,019,155) | 8,623,128 | (622,642,283) |
| වෙනත් මෙහෙයුම් වියදම් | ඉ | (492,631,005) | (22,314,670) | (470,316,335) |
| **මෙහෙයුම් ලාභය** | | **740,768,936** | | **842,999,299** |
| මූල්‍ය වියදම් | | (422,895,753) | | (422,895,753) |
| මූල්‍ය ආදායම් | ඊ | 4,102,392 | 4,102,392 | - |
| **බදුපෙර ලාභය** | | **321,975,575** | | **420,103,546** |
| **බදු වියදම** | උ | (228,472,722) | 7,026,786 | (235,499,508) |
| **කාලපරිච්ඡේදය සඳහා ලාභය** | | **93,502,853** | | **184,604,038** |

## ආදායම් වාර්තාව සැසඳීම

### අ – ආදායම

පෙර පැවති ගිණුම් ප්‍රමිත යටතේ, උපලබ්ධි නොවූ ලාභය, විශේෂ ඇනවුම් මත ආනයන හා සැපයුම් කරුවන් ගෙන් අයවූ වන්දි වෙනත් මෙහෙයුම් ආදායමක් ලෙස ගිණුම් ගත කර තිබුණි. නව ගිණුම්කරණ ප්‍රමිත (SLFRS/LKAS) යටතේ, මෙම වටිනාකම් (2011 දි රු. 54,169,340 කි) ආදායම් ලෙස වර්ග කර දක්වා ඇති අතර රු 4,457,344 ක් වූ ණය රක්ෂණ යෝජනාක්‍රමය ද ආදායම් ගිණුමට මාරු කරන ලදි. (යොමුව k)

### ආ – විකුණුම් පිරිවැය

රු 88,856,732 ක් වූ ගෙවන ලද අගය එකතු කිරීමේ බදු ප්‍රවර්තන වර්ෂයේදි වැරදි නිවැරදි කිරීමක් ලෙස විකුණුම් පිරිවැයට මාරු කරන ලදි.

### ඇ, ඊ – වෙනත් මෙහෙයුම් ආදායම් හා මූල්‍ය ආදායම්

නව ගිණුම්කරණ ප්‍රමිත (SLFRS/LKAS) යටතේ රු 54,169,340 ක් ආදායම් ගිණුමට මාරු කරන ලද අතර රු 4,102,392 ක් වූ සේවක ණයපොලී මූල්‍ය ආදායම් යටතේ වෙනමම දක්වා ඇත. ඉතිරිය රු 41,793 ක් වූ භාණ්ඩාගාර බිල් සඳහා වූ වෙළඳපල තක්සේරු වටිනාකමේ වෙනසයි.

### ඈ – පරිපාලන වියදම්

පෙර පැවති ගිණුම් ප්‍රමිත SLAS යටතේ, සංස්ථාව ඵලදායි ආයුකාලය නොසලකා සම්මත ප්‍රතිශතයකට වත්කම් ක්ෂය කිරිම සිදුකරන ලදි. නව ගිණුම්කරණ ප්‍රමිත (SLFRS/LKAS) යටතේ වත්කම් උපාංග ලෙස ගිණුම්තැබීමේදි හා ඵලදායි ජිවිත කාලය ගණනය කිරීමේදි ඇතිවූ ක්ෂය වටිනාකමේ අඩුවීම රු. 8,916,370 ක් විය. සේවක පාරිතෝෂික ලෙස රු. 133,242 කුත්, කල්බදු දේපල ක්‍රමක්ෂය ලෙස රු. 160,000 කුත් ආදායම් වාර්තාවට ගලපන ලදි.

### ඉ - වෙනත් මෙහෙයුම් වියදම්

පෙර ගිණුම් ප්‍රමිත යටතේ ගිණුම්ගත කර නොතිබූ එහෙත් නව ගිණුම් ප්‍රමිත (SLFRS/LKAS) මඟින් හඳුනාගත් ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු වටිනාකම රු. 22,314,670 ක් විය.

### උ – බදු වියදම

පෙර තිබූ බදුවෙන් කිරිම හා නව ගිණුම් කරන ප්‍රමිත (SLFRS/LKAS) යටතේ කල වෙන්කිරීම් අතර වෙනස රු. 7,026,786 ක් ආදායම් ප්‍රකාශයට ගලපා ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / எனது இல / My No: එච්එම්/ඒ/එස්පීසී/ඒඒඒ/2012

ඔබේ අංකය / உமது இல / No.:

දිනය / திகதி / Date: 2014 අප්‍රේල් 09 දින

සභාපති,

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තියේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත 2013 අගෝස්තු 26 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ


අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887220
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ-மெயில் / E-mail: oaggov@sltnet.lk

සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

---

2.1 තත්ත්වාගණනය කළ මතය

---

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

---

### 2.2.1 ගිණුම් ප්‍රතිපත්ති

---

වෛද්‍ය සැපයීම් අංශයේ වසර 05 ඉක්මවූ ණය ගැති ශේෂ මත හා වෛද්‍ය සැපයීම් අංශය හැර වසරක් ඉක්මවූ අනෙකුත් වෙළඳ ණයගැති ශේෂ මත සියයට සියයක බොල් හා අඩමාන ණය ප්‍රතිපාදනයක් සිදුකර තිබුණද, එම ප්‍රතිපාදනය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකට සැපයූ ඖෂධ හා ශල්‍ය උපකරණවලට අදාලව 2006 වර්ෂයේ සිට 2011 වර්ෂය සම්බන්ධයෙන් වූ රු.156,164,310ක සහ සමාලෝචිත වර්ෂයට අදාල රු. 1,953,152ක හර පත්‍ර ගිණුම් ගත නොවීමේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ණයගැතියෝ හා රඳවාගත් ලාභය රු. 158,117,462 බැගින් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ආ) 2007 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකට අලෙවි කරන ලද රු. 686,191,229 ක් වටිනා ඖෂධ හා ශල්‍ය උපකරණ තොග මාර්ගස්ථ තොග ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඇ) වෛද්‍ය සැපයීම් අංශයෙන් ප්‍රතික්ෂේපකල වටිනාකම රු.189,893,482ක් වූ ඖෂධ හා ශල්‍ය උපකරණ වලින් රු.132,212,356ක් වටිනා ඖෂධ හා ශල්‍ය උපකරණ අලෙවි කළ නොහැකි තත්ත්වයට පත්ව තිබුණු අතර ඒ වෙනුවෙන් රු.141,121,163ක ප්‍රතිපාදනයක් සැලසීම හේතුවෙන් රු.8,908,807ක අධි ප්‍රතිපාදනයක් සලසා තිබුණි.

### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව, බෙදාහරින්නන් 49ක් අතුරින් තෝරාගත් බෙදාහරින්නන් 16 දෙනෙකුට අනුමත ණය සීමාවෙන් සියයට 75ක අතිරේක ණය පහසුකම් සපයා තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබූ මුළු ණය ප්‍රමාණය රු.මිලියන 127 ක් විය. තවද අතිරේක ණය පහසුකම් ලබාගත් බෙදාහරින්නන් පස්දෙනෙක් සහ අනුමත ණය පහසුකම් ලබාගත් බෙදාහරින්නන්

පස්දෙනෙක් ඇතුලුව බෙදාහරින්නන් 10 දෙනෙකුට එම ණය සීමාව ඉක්මවා එකතුව රු.මිලියන 13.6ක ණය පහසුකම් ලබාදී තිබුණි.

(ආ) නියෝජිත ආයතන 80 න් තෝරාගත් ආයතන 08 ක් සඳහා ඉහත අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව අනුමත ණය සීමාවෙන් සියයට 75ක අතිරේක ණය පහසුකම් ලබා දී තිබූ අතර එසේ ලබාදී තිබූ මුළු ප්‍රමාණය රු. මිලියන 4.2 ක් විය. තවද අතිරේක ණය පහසුකම් ලබා දී තිබූ ආයතන 08න් දෙකක් සහ අනුමත ණය පහසුකම් ලබාගෙන තිබූ ආයතන 07ක් ඇතුළුව ආයතන 09කට එම ණය සීමාවන් ඉක්මවා එකතුව රු. මිලියන 1.2ක ණය පහසුකම් ලබාදී තිබුණි.

(ඇ) ඔසුසල් මගින් ඖෂධ අලෙවි කිරීමේදී ගණුදෙනු කරුවන් 22 දෙනෙකුට අනුමත ණය සීමාවන් ඉක්මවා ණය පහසුකම් ලබා දී තිබූ අතර එම ප්‍රමාණයන් වල එකතුව රු. මිලියන 2.5 ක් විය.

(ඈ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සංස්ථාවේ 2012 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 11,369 ක් වූ මුළු වෙළඳ ණයගැතියන්ගෙන් රු. මිලියන 11,108 ක් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන වලින් සමන්විත විය. එය මුළු වෙළඳ ණයගැතියන්ගෙන් සියයට 97.8 ක් විය. තවද, එම වෙළඳ ණයගැතියන්ගෙන් රු. මිලියන 10,821 ක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකට කළ සැපයීම් වෙනුවෙන් ලැබිය යුතු මුදල් වූ අතර එය මුළු වෙළඳ ණය ගැතියන්ගෙන් සියයට 95.2 ක් විය.

(ඉ) වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂකගෙන් අය විය යුතු රු. මිලියන 10,821 න් වසර 1 ට වඩා වැඩි ණය ගැති ශේෂය රු.මිලියන 2,177 ක් වූ අතර වසර 05 ට වඩා වැඩි ණයගැති ශේෂය රු.මිලියන 552ක් විය.

(ඊ) පෞද්ගලික ආයතනවලින් ලැබිය යුතු වසරක් ඉක්මවූ එකතු ණයගැති ශේෂය රු. මිලියන 10 ක් වූ අතර වසර 05 ට වඩා වැඩි එකතු ණයගැති ශේෂය රු. මිලියන 0.8ක් විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

| විස්තරය | වටිනාකම රු. | විගණනයට ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| ණයගැතියෝ | 2,048,012,299 | ශේෂ තහවුරු කිරීමේ ලිපි |
| ණයහිමියෝ | 264,771,252 | - එම - |

## 2.2.5 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථාවන් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2000 ජනවාර් 31 දිනැති අංක පීඊඒ/පීඊ/6 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව ඉකුත් වර්ෂ සහ සමාලෝචිත වර්ෂය සඳහා උපයනවිට ගෙවීම් බදු මුදල් සංස්ථාවේ අරමුදල් වලින් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථා අරමුදලින් රු.870,261ක් උපයන විට බදු ලෙස ගෙවා තිබුණි. **උපයන විට බදු අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව 2013 අප්‍රේල් මස දක්වා සංස්ථාව විසින් ගෙවන ලදි. මේ සම්බන්ධයෙන් දිගින් දිගටම වෘත්තිය සමිති සමග සාකච්ඡා කර 2013 මැයි මස සිට සේවකයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර ඇති බවට සභාපතිවරයා විසින් විගණනයට දන්වා තිබුණි.** |
| (ආ) 2006 මාර්තු 01 දිනැති අංක 09 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛය | |
| i. 2.9.1 වගන්තිය | සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රධාන ප්‍රසම්පාදන කමිටු සභාපතිට හා සෙසු සාමාජිකයින්ට පිළිවෙලින් රු.17,500 හා රු. 15,000 බැගින් දීමනා ගෙවා තිබූ අතර සුළු ප්‍රසම්පාදන කමිටු සභාපතිට හා සෙසු සාමාජිකයින්ට පිළිවෙලින් රු.12,500 හා රු. 10,000 බැගින් දීමනා ගෙවා තිබුණි.<br>මේ අනුව ප්‍රසම්පාදන කමිටු සභාපතිට හා සෙසු සාමාජිකයින්ට සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2010 ජුලි 19 දිනැති අංක SH/65/2007 දරන ලිපිය අනුව සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.3,981,750 ක් වැඩියෙන් ප්‍රසම්පාදන කමිටු දීමනා ගෙවා තිබුණි. |
| ii. 2.9.1 වගන්තිය | මෙම දීමනා ලබාගෙන තිබූ සමහර ප්‍රසම්පාදන කමිටු රැස්වීම් සාමාන්‍ය රාජකාර් වේලාවන් තුල පවත්වා තිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය. | |
| i. ඡේද අංක 6.5.1 | චක්‍රලේඛය ප්‍රකාරව කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| ii. ඡේද අංක 6.5.3 | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසන්වී දින 150 ක් ඇතුලත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2011 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |
| (ඇ) 2011 පෙබරවාරි 11 දිනැති අංක පීඊඩී 57 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය. | සමාලෝචිත වසර තුල සංස්ථාව විසින් චක්‍රලේඛ විධිවිධානයන්ට පටහැනිව ප්‍රදානයන් හා අනුග්‍රාහකත්ව දීමනාවන් ලෙස රාජ්‍ය නොවන ආයතනවලට රු.13,800,000 ක් ගෙවා තිබුණි |

## 2.2.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------

2012 මාර්තු 30 දිනැති අංක බී.පී/61/12 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව සංස්ථාව විසින් රු.14,670,857ක ණයගැති ශේෂයන් පොත්වලින් ලියාහැර තිබුණි. වෛද්‍ය සැපයීම් අංශයෙන් අයවිය යුතු රු. 4,237,061ක්ද වෙනත් රාජ්‍ය ආයතන 32කින් අයවිය යුතු රු.9,612,367ක් හා පෞද්ගලික ගනුදෙනුකරුවන් 38 දෙනෙකුගෙන් අයවිය යුතු රු.821,428 ක් ලියාහරින ලද ණයගැති ශේෂ තුල ඇතුලත්ව තිබුණි. මෙම ණයගැතියන් 71 දෙනාගෙන් පෞද්ගලික හිමිකාරත්වය සහිත ණයගැතියන් 06 දෙනෙකු තවදුරටත් සංස්ථාවේ ගණුදෙනුකරුවන් නොවන බවද අනාවරණය විය.

## 3. මූල්‍ය සමාලෝචනය

--------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය බදු වලට පෙර රු. 464,612,012 ක ශුද්ධ ලාභයක් වූ අතර, එය ඉකුත් වර්ෂය සඳහා බදුවලට පෙර ශුද්ධ ලාභය වූ රු. 321,975,574 සමඟ සැසඳීමේදී රු. 142,636,438 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ රු. 339,052,139 ක් වූ මූල්‍ය වියදම අඩු කිරීමට පෙර සංස්ථාව විසින්

රු. 799,720,426 ක මෙහෙයුම් ලාභයක් උපයා තිබූ අතර එය පසුගිය වර්ෂයේ මූල්‍ය පිරිවැය අඩු කිරීමට පෙර මෙහෙයුම් ලාභය රු.740,768,935 සමඟ සැසඳීමේදී රු.58,951,491ක මෙහෙයුම් ලාභය වැඩි වීමකි.

3.2 මූල්‍ය ප්‍රතිඵල සමාලෝචනය

---

සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ වැදගත් දත්තයන් ඉකුත් වර්ෂයට අදාල අනුරූප දත්තයන් සහිතව පහත දැක්වේ.

| | 2012 වර්ෂය රු.මිලියන | 2011වර්ෂය රු.මිලියන |
|---|---|---|
| පිරිවැටුම | 21,610.2 | 17,375.5 |
| විකුණුම් පිරිවැය/ සෘජු වියදම් | 19,425.4 | 15,551.3 |
| දළ ලාභය | 2,184.8 | 1,824.2 |
| මෙහෙයුම් ලාභය | 799.7 | 740.8 |
| මූල්‍ය ආදායම් | 3.9 | 4.1 |
| මූල්‍ය වියදම් | 339.1 | 422.9 |
| ශුද්ධ ලාභය(බදු පෙර) | 464.6 | 322.0 |
| බදු වියදම් | 205.3 | 228.5 |
| ශුද්ධ ලාභය (බදු පසු) | 245.0 | 89.8 |
| දළ ලාභ අනුපාතය - සියයට | 10.1 | 10.5 |
| ශුද්ධ ලාභ අනුපාතය - සියයට | 1.1 | 0.5 |
| තොග පිරිවැටුම් අනුපාතය - වාර | 7.9 | 4.6 |
| තොග පිරිවැටුම් කාලය - දින | 47 | 79 |
| ණය ගැති පිරිවැටුම් අනුපාතය - වාර | 2.6 | 3.9 |
| ණය ගැති පිරිවැටුම් අනුපාතය - දින | 140 | 94 |
| ණය හිමි පිරිවැටුම් අනුපාතය - වාර | 36 | 28 |
| ණය හිමි පිරිවැටුම් අනුපාතය - දින | 10 | 13 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ දළ ලාභ හා ශුද්ධ ලාභ අනුපාත සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතයේ අඩු වීමක් හා ශුද්ධ ලාභ අනුපාතයේ වැඩිවීමක් පෙන්නුම් කෙරේ.

(ආ) සමාලෝචිත වර්ෂයේ තොග පිරිවැටුම් අනුපාතය 2011 වර්ෂයේ තොග පිරිවැටුම් අනුපාතය සමඟ සැසඳීමේදී වාර 3.3ක වැඩිවීමක් පෙන්නුම් කෙරෙන අතර තොග පිරිවැටුම් කාලය දින 32 කින් අඩුවී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ණයගැති පිරිවැටුම් අනුපාතය 1.3 කින් අඩුවී තිබූ අතර ණය එකතු කිරීමේ කාලය දින 46 කින් වැඩි වී තිබුණි. ඒ අනුව සංස්ථාවේ ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය ඵලදායි තත්ත්වයක නොපැවති අතර එය සංස්ථාවේ මුදල් ප්‍රවාහය සඳහා සෘජුව බලපා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ණයහිමි පිරිවැටුම් අනුපාතය ඉකුත් වසරේ ණයහිමි පිරිවැටුම් අනුපාතය සමඟ සැසඳීමේදී වාර 8ක වැඩිවීමක් පෙන්නුම් කළද ණය ගෙවීම් කාලය දින 03 කින් අඩුවී තිබුණි.ඒ අනුව සංස්ථාවේ ණය ගෙවීම් ප්‍රමාද වීමක් පැවති අතර සංස්ථාවේ මුදල් ප්‍රවාහයේ පැවති දුර්වලතා මීට බලපා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ අධි තෝලන තත්ත්වයක් පෙන්නුම් කළ අතර මුළු ණය ප්‍රාග්ධනයෙන් සියයට 70ක් බැංකු අයිරාව මගින් නියෝජනය වී තිබුණු අතර එය 2012 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 7896.7 කි. මෙම බැංකු අයිරාව පසුගිය වසර හා සැසඳීමේදී සියයට 67 ක වැඩිවීමකි.

## 3.3 මෙහෙයුම් සමාලෝචනය

### 3.3.1 ඔසුසල් ක්‍රියාකාරීත්වය

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04ක ඔසුසල්හි ක්‍රියාකාරීත්වය පිළිබඳ විස්තර පහත පරිදි විය.

| | 2012 | 2011 | 2010 | 2009 | 2008 |
|---|---|---|---|---|---|
| ක්‍රියාත්මකව පැවති ඔසුසල් සංඛ්‍යාව | 28 | 25 | 25 | 23 | 21 |
| පිරිවැටුම (රු. මිලියන) | 2,185.9 | 1974.8 | 1,840.2 | 1,691.4 | 1,398.2 |
| මිලදී ගැනීම් - දේශිය (රු. මිලියන) | 1189.8 | 963.3 | 918.7 | 791.7 | 609.7 |
| - ආනයනික (රු මිලියන) | 718.4 | 678.8 | 683.7 | 677.7 | 594.6 |
| ඉපයූ ලාභය (රු. මිලියන) | 134.1 | 102.6 | 96.6 | 97.4 | 44.2 |
| පාඩු ලැබූ ඔසුසල් සංඛ්‍යාව | 10 | 09 | 06 | 04 | 10 |
| ලැබූ පාඩුව (රු. මිලියන) | 8.1 | 7.2 | 7.02 | 3.8 | 9.16 |

ඔසුසල්වල ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂය තුල සංස්ථාවට අයත් ඔසුසල් 28ක් ක්‍රියාකාරීව පැවති අතර මින් යාපනය, පොලොන්නරුව, පිළියන්දල,කළුතර හා රත්මලාන යන ඔසුසල් 05 සමාලෝචිත වර්ෂයේදී අලෙවි කටයුතු අළුතින් ආරම්භ කල ඔසුසල් වන අතර පසුගිය වර්ෂයේදී පැවති ඔසුසල් 02ක් සමාලෝචිත වර්ෂයේදී තම අලෙවි කටයුතු නවතා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ඔසුසල් 28න් 18ක් ලාභදායී මට්ටමක පැවති අතර ඔසුසල් 10 ක් අලාභ ලබා තිබුණි. එම අලාභය රු.මිලියන 8.1 ක් වූ අතර අවිස්සාවේල්ල, අම්පාර හා මීගොඩ ඔසුසල් 2010 වර්ෂයේ සිට දිගින් දිගටම පාඩු ලබන තත්ත්වයක පවතී.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී අලෙවි කටයුතු අළුතින් ආරම්භ කළ ඔසුසල් 05 න් රත්මලාන ඔසුසල හැර අනෙක් ඔසුසල් 04 පාඩු ලබා තිබූ අතර එම ඔසුසල් 04 හි අලාභය රු.මිලියන 5.1ක් විය.

(ඈ) පසුගිය වසර තුල ලාභ ලබා තිබූ කරාපිටිය ඔසුසල සමාලෝචිත වර්ෂය තුලදී පාඩු ලබා තිබූ අතර නුවර , ගාල්ල හා දියතලාව යන ඔසුසල් පසුගිය වසරේ ලැබූ ලාභයට වඩා අඩු ලාභයක් සමාලෝචිත වර්ෂයේදී ලබා තිබූ අතර මීගොඩ, මීගමුව හා දියතලාව යන ඔසුසල්හි විකුණුම් පසුගිය වසර හා සැසඳීමේදී අඩුවීමක් දක්නට ලැබුණි.

(ඉ) අවිස්සාවේල්ල, මීනුවන්ගොඩ, කුරුණෑගල, අම්පාර, බදුල්ල-සතොස, දියතලාව, යාපනය, රත්මලාන, පොලොන්නරුව හා කළුතර යන ඔසුසල් හැර ඉතිරි ඔසුසල් 18 හි දේශීය මිළදී ගැනීම් ඉතා ඉහළ අගයක පැවති අතර ඔසුසල් සඳහා සමාලෝචිත වර්ෂයේදී මිළදී ගෙන ඇති ඖෂධ හා ශල්‍ය පාර්භෝජන ද්‍රව්‍යයන්ගේ එකතු වටිනාකම රු. මිලියන 1,908.2 ක් වූ අතර ඉන් රු. මිලියන 1189.8 ක් එනම් සියයට 62 ක් දේශීය මිළදීගැනීම් විය.ඒ අනුව ආනයනික ඖෂධ වලට වඩා දේශීයව මිළදී ගත් ඖෂධ අලෙවිය සඳහා සංස්ථාව වැඩි නැඹුරුවක් දක්වා තිබුණි.

(ඊ) රාජ්‍ය ඔසුසල්වල සාමාන්‍යයෙන් ඖෂධ වර්ග 1600 ක් පමණ අලෙවි කරන අතර ඉන් ඉහල පිරිවැටුමක් සහිත ඖෂධ වර්ග 150 ක් පමණ වේ. සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාර ඔසුසල් 28 න් ඔසුසල් 22 ක අලෙවි වන ඖෂධ වර්ග වල විශාල හිඟයක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| ඔසුසල | එක් එක් මාසය තුල ඖෂධ හිඟය (ඖෂධ වර්ග අනුව) | |
|---|---|---|
| | අවමය (ඖෂධ අයිතම) | උපරිමය (ඖෂධ අයිතම) |
| අම්පාර | 25 | 90 |
| අනුරාධපුර | 20 | 120 |
| අවිස්සාවේල්ල | 50 | 104 |
| බදුල්ල | 10 | 28 |
| කොළඹ 01 | 30 | 103 |
| කොළඹ 04 | 20 | 59 |
| කොළඹ 07 | 31 | 69 |
| ගාල්ල | 07 | 10 |
| හම්බන්තොට | 31 | 60 |
| යාපනය | 59 | 84 |
| ජයවර්ධනපුර | 08 | 10 |

| | | |
|---|---|---|
| නුවර | 65 | 160 |
| කරාපිටිය | 15 | 55 |
| කුරුණෑගල | 20 | 60 |
| මහරගම | 15 | 30 |
| මාතර | 15 | 35 |
| මිනුවන්ගොඩ | 17 | 29 |
| මීගමුව | 23 | 40 |
| නුගේගොඩ | 30 | 44 |
| පානදුර | 25 | 45 |
| පොලොන්නරුව | 30 | 82 |
| රත්නපුර | 35 | 60 |

ඔසුසල්වල ඖෂධ හිඟය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. යාපනය, ජයවර්ධනපුර,මහරගම, නුගේගොඩ හා පොලොන්නරුව යන ඔසුසල් හැර අනෙක් සියලු ඔසුසල්හි වර්ෂය පුරා සැම මසකම ඖෂධ හිඟයන් පැවතුණි. මෙම ඖෂධ හිඟයන්වල උපරිම පරාසය ඔසුසල් 14 ක 10 සිට 60 දක්වාද, ඔසුසල් 07 ක 60 සිට 120 දක්වා පරාසයකද, 120ට වැඩි ඔසුසල් 01 ක්ද විය.තවද, මෙම ඖෂධ වර්ගවල හිඟයන්වල අවම පරාසය ඔසුසල් 16 ක 10 සිට 30 දක්වාද, ඔසුසල් 05 ක 30 සිට 60 දක්වාද, 60ට වැඩි ඔසුසල් 01ක්ද විය.

ii. 2012 වර්ෂයේ රත්මලාන ප්‍රධාන ඖෂධ ගබඩාවේ මාසික සාමාන්‍ය ඖෂධ හිඟය ඖෂධ වර්ග 125ක් වූ අතර වසරේ අවම ඖෂධ හිඟය ඖෂධ වර්ග 100ක් ද උපරිම ඖෂධ හිඟය ඖෂධ වර්ග 158ක් ද විය.

3.3.2 ප්‍රසම්පාදන

-------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) F/Lumber Disectomy ශල්‍ය උපකරණ කට්ටල මිලදී ගැනීම.

i. ශල්‍ය උපකරණ කට්ටලයේ ඇතුලත් අයිතම සඳහා ලබාගත් සුවද්විලවුන් උපකරණ හා ඖෂධ අධිකාරියෙහි (CDDA) ලියාපදිංචි සහතිකවල වලංගු දිනය,2011 ජනවාරි 07 දින සැපයුම්කරු වෙත ඉන්ඩෙන්ටුව නිකුත් කරන විටත් කල් ඉකුත්වී තිබුණු අතර වරායෙන් නිදහස් කර ගන්නා අවස්ථාව වන විටත් ලියාපදිංචි සහතිකය අළුත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වෙතත්, මෙම මිලදී ගැනීම වෙනුවෙන් ප්‍රතිරෝදයක් නොමැති බවට ලිපියක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය තාක්ෂණික හා සැපයීම් අංශයෙන් ලබා ගෙන තිබුණි.

ii. 2008 පෙබරවාරි සැපයිය යුතු ශල්‍ය උපකරණ අවුරුදු 3 ක් සහ මාස 4 ක් ප්‍රමාදවී වෛද්‍ය සැපයීම් අංශයට 2011 ජුනි මාසයේදී ලැබී තිබුණද, මෙම උපකරණවල ලේබල නිවැරදි නොවීම,SR අංක හා

ඉන්වොයිසි අංක සඳහන් නොවීම සහ ඉහත ඉන්වොයිසියේ අඩුපාඩු තිබීම නිසා වෛද්‍ය සැපයීම් අංශය විසින් එම උපකරණ කට්ටලය ප්‍රතික්ෂේප කර තිබූ අතර මෙම අඩුපාඩු නිවැරදි කර 2013 නොවැම්බර් නැවත සැපයීම සිදුකර තිබුණද , ඒ වනවිට වර්ෂ 05කට වැඩි කාල ප්‍රමාදයක් සිදුවී තිබුණි.

(ආ) Ibuprofen 200mg ඖෂධයෙන් පෙති මිලියන 24 ක් මිලදී ගැනීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. ඉහත ඖෂධය මිලදී ගැනීම සඳහා අංක SPC/P1/369/11 දරන ඉන්ඩෙන්තුව 2011 අගෝස්තු 11 දින නිකුත් කළ අවස්ථාව වන විට එම සැපයුම්කරුට සුවද විලවුන්,උපකරණ හා ඖෂධ අධිකාරිය (C.D.D.A) විසින් නිකුත් කරන ලද අංක PR - 041003 දරන ලියාපදිංචි සහතිකය කල් ඉකුත්වී තිබුණි. කෙසේ වුවද මෙම සහතිකය 2011 සැප්තැම්බර් 16 දින නැවත අළුත් කරවා ගෙන තිබුණි. එම ආයතනයේ දේශීය නියෝජිත CDDA ආයතනය මගින් එය 2011 සැප්තැම්බර් 16 දින ලබාගෙන ඇති බවත් ඒ අනුව එම සහතිකය 2011 අගෝස්තු 04 දින සිට වසර 05 කට වලංගු කර ඇති බව සභාපතිවරයා විසින් විගණනයට දන්වා තිබුණි.

ii. සපයන ලද පෙති මිලියන 12 න් පෙති මිලියන 4.6 ක් අලෙවි වී තිබූ අතර ඉතිරි පෙති මිලියන 7.4 ක් 2012 ජනවාරි වන විට අවපැහැගැන්වී තිබීම හේතුවෙන් අලෙවියට නුසුදුසු තත්ත්වයට පත්වී තිබූ අතර එහි පිරිවැය දළ වශයෙන් රු.මිලියන 2.79 ක් වේ.

iii. සපයන ලද තොගය නියමිත පිරිවිතරයන් සපුරා ඇති බවට ආනයන කළමනාකරු විසින් තාක්ෂණික අංශයට දැනුම්දී තිබුණද, එම ඖෂධ තත්ත්වයෙන් අසමත් බවට තත්ත්ව ආරක්ෂණ රසායනාගාර කළමණාකරුගේ 2012 ජනවාරි 23 දිනැති ලිපිය මගින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - තාක්ෂණික හා රසායනාගාර වෙත දැනුම් දී තිබුණි. මේ අනුව පිරිවිතරයන් සපුරා ඇති බවට ආනයන කළමණාකරු විසින් සහතික කිරීම කරනු ලැබුයේ කුමන පදනමක් මතද යන්න විගණනයට හෙළිදරව් නොවුණි.

iv. ඖෂධ තත්ත්වයෙන් අසමත් බව 2012 ජනවාරි 23 දින හදුනාගන්නා විට පෙති 1,000 ක ඇසුරුම් 4,952 ක් එනම්, සපයන ලද පෙති ප්‍රමාණයෙන් සියයට 41 ක් අලෙවි කර තිබුණි.

v. තත්ත්වයෙන් අසමත් පිරිවැය රු.2,972,382 ක්වූ පෙති මිලියන 7.248 වෙනුවට දින 45 සිට දින 60 ක කාලයක් තුල අළුතින් පෙති ලබාදීමට සැපයුම්කරු එකඟවී තිබුණද, මේ දක්වා එම පෙති තොග ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රු.1,347,696 ක් පිරිවැය වූ ශල්‍ය උපකරණ සංස්ථාවට අහිමි වීම (ඉන්ඩෙන්ටි අංකය:DHS/SUS/19/361A/2009)

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

රු.1,347,696 ක් (එ.ජ ඩොලර් 11,654.20) පිරිවැය වූ ශල්‍ය උපකරණ අයිතමයන් 6 ක කාට්න් 13 ක් සැපයුම්කරුගෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට 2010 ජූලි මස ලැබී තිබුණද, ඊට අදාල තොහාරපත හා

ඉන්වොයිසි දේශීය නියෝජිත ආයතනය නමින් තිබුණු නිසා එම ශල්‍ය උපකරණ වරාය අධිකාරියෙන් නිදහස් කර ගැනීමට සංස්ථාවට නොහැකි වී තිබුණි. ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව විසින් එම භාණ්ඩ විනාශ කිරීමට නිර්දේශ කර තිබීම නිසා සංස්ථාවට රු.1,194,946 ක අලාභයක් සිදුවී තිබුණි. 2012 ජනවාරි 20 දිනැති අංක BP/4/12 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාව අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය එම ශල්‍ය උපකරණ තොගය විකුණා ඇති බව සඳහන් කර තිබූ බැවින් එම තොගය සම්බන්ධව නිවැරදි තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) Clarithromycin powder for reconstitution for intravenous infusion 500 mg ඖෂධ වැල්ව 61,200 ක් මිල දී ගැනීම.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. වෛද්‍ය සැපයුම් අංශයේ ඉල්ලීම අනුව වැල්ව 30,000 ක් ආනයනය කර 2011 මැයි 02 දින වෛද්‍ය සැපයුම් අංශයට භාර දී තිබූ අතර එම තොග සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේ දී පළුදු වූ වැල්ව පවතින බවට 2011 මැයි 24 දිනැති ලිපිය මගින් වෛද්‍ය සැපයුම් අංශය සංස්ථාවට දන්වා තිබුණි.

ii. එසේ වුවද, 2011 මැයි 31 දින අදාල ණයවර ලිපිය සංශෝධනය කර එය රු. 9,250,386 (එ.ජ. ඩොලර් 167,400) ක් දක්වා වැඩිකර ඉතිරි තොගය ලංකාවට ගෙන්වීමට කටයුතු කර තිබූ අතර එම තොගයෙන් ඒකක 16,200 ක් හා ඒකක 15,000 ක් පිළිවෙලින් 2011 ජුලි 30 සහ 2011 සැප්තැම්බර් 05 දිනවල වරායෙන් නිදහස් කර ගෙන තිබුණි.

iii. 2011 නොවැම්බර් 02 දිනැති ලිපිය අනුව පසුව ගෙන්වූ වැල්ව 16,200 හා දැනට ගබඩා කර ඇති වැල්ව 15,000 යන තොග සියල්ලම භාවිතයෙන් ඉවත් කළ යුතු බවට ජාතික ඖෂධ ආරක්ෂණ අධිකාරිය මගින් දැනුම් දී තිබුණි. මේ අනුව සංස්ථාවට අයවිය යුතු එකතුව එ.ජ. ඩොලර් 98,066 කින් එ.ජ. ඩොලර් 11,384 ක් සැපයුම්කරුගෙන් අය කර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

iv. ණයවර ලිපි සඳහා ගෙවීම් කිරීමේදී රඳවා ගතයුතු මුළු තොගයටම අදාල සියයට 10 ක මුදල වන රු.1,840,440 ක වටිනාකම රඳවා ගැනීමටද ක්‍රියාකර නොතිබුණි.

(ඉ) Cannulated Screw ශල්‍ය උපකරණ මිලදී ගැනීම. (ඉන්ඩෙන්ට් අංක DHS/SU/221/825 B/08)

අවස්ථා කිහිපයකදී සපයන ලද යථෝක්ත මිලදී ගැනීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. වෛද්‍ය සැපයීම් අංශයේ 2007 ජුලි 11 දිනැති අංක MSD/SC/052/08/5 දරන ඇණවුම පරිදි 2008 ජනවාරි සැපයිය යුතු වටිනාකම රු.5,723,492 ක ශල්‍ය උපකරණ තොගය 2010 මැයි 07 දින වෛද්‍ය සැපයීම් අංශයට භාර දෙන විට අවුරුදු 02 ක් සහ මාස 09 ක් ප්‍රමාදවී තිබුණි.

- ටෙන්ඩර් ලියවිලිවල 20 හා 21 ඡේදයන්හි දක්වා ඇති පරිදි අවස්ථා දෙකකදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුල සාම්පල් පරීක්ෂා කළ යුතු වුවද , ශල්‍ය උපකරණ තොගය ආනයනයේදී එවැනි සාම්පල් පරීක්ෂාවක් සිදු කර ඇති බවට තොරතුරු විගණනයට අනාවරණය නොවුණි.

ii. 2010 මාර්තු 10 දිනැති ඉන්වොයිස් අංක 4633 යටතේ ආනයනය කරන ලද රු. 1,338,398 (එ.ජ ඩොලර් 11,760.97) ක් වටිනා ඒකක 7250 ක ඉන්වොයිස් අසම්පූර්ණ වීම හා කල් ඉකුත් වන දිනය සඳහන් නොවීම යන හේතූන් මත වෛද්‍ය සැපයීම් අංශය ප්‍රතික්ෂේප කර තිබුණි. තවද මෙම ශල්‍ය උපකරණ තොගය වෛද්‍යවරයෙකු විසින් කරන ලද පරීක්ෂණයක් මගින් තත්ත්වයෙන් අසමත් බවට 2012 ජනවාරි 27 දිනැති ලිපිය මගින් අනාවරණය කර තිබු අතර මේ දක්වා වසර 2 1/2 ක පමණ කාලයක් තොගය ගබඩාවෙහි නිෂ්කාර්යව රඳවා තිබුණි.

  - වෛද්‍ය සැපයීම් අංශය මගින් භාරගැනීම ප්‍රතික්ෂේප කළ අංක 4633 දරන ඉන්වොයිසියට අදාල ඒකක 7250 හා ඉන්වොයිසි අංක 4650 යටතේ ආනයනය කර වෛද්‍ය සැපයීම් අංශය විසින් භාර ගත් තොගයේ හිඟ ඒකක 16 ට අදාලව 2012 දෙසැම්බර් 10 දිනැති හා අංක 000339/2012 දරන හර පත්‍රයේ වටිනාකම වූ රු.1,393,189 (එ.ජ ඩොලර් 12,242.44) මේ දක්වා නිරවුල් කර ගෙන නොතිබුණි.

(ට) Gentamicin Injection BP 80mg/2ml මිලට ගැනීම (ඉන්ටෙන්ඩු අංක SPC/P1/509/10)

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. සංස්ථාවේ ඔසුසල් තුල ඉතා ඉක්මනින් අලෙවි වන ඖෂධයක් ලෙස හදුනාගෙන ඇති Gentamicin Injection BP 80mg/2ml ඒකක 240,000 න් ඒකක 80,000 බැගින් 2010 මාර්තු, ජූලි හා නොවැම්බර් මාසවල සැපයිය යුතු වුවද 2009 නොවැම්බර් 08 දිනැති පුවත් පත් දැන්වීම මගින් අවස්ථා දෙකකදී එම ප්‍රමාණයන් සැපයිය යුතු කාල සීමාවන් වෙනස් කර තිබුණි.

ii. ඉදිරිපත් වූ සැපයුම්කරුවන් 06 දෙනා අතරින් එක් සැපයුම්කරුවෙකු පමණක් සාම්පල් ඉදිරිපත් කර තිබු අතර එම සාම්පලයද තත්ත්ව වාර්තාව අනුව තත්ත්වයෙන් අසමත් වී තිබුණි.

iii. ටෙන්ඩර් ලියවිලිවල 20.1 ඡේදය අනුව සියළුම සැපයුම්කරුවන් ටෙන්ඩරය සමඟ සාම්පල් ඉදිරිපත් කළ යුතු බවත් , 20.4 ඡේදය අනුව එය අනිවාර්ය අවශ්‍යතාවයක් බවත් , එය ඉටු නොකරන අවස්ථාවලදී ටෙන්ඩරය අවලංගු කළ යුතු බවක් දක්වා තිබුණද එක් සැපයුම්කරුවකුට පෙර නැවිගත කිරීම් සාම්පල් පරීක්ෂාවට යටත්ව ටෙන්ඩරය ලබා දී තිබු අතර ඒ අනුව අවස්ථා දෙකකදී නියැදි තත්ත්වයෙන් අසමත්වීම නිසා ටෙන්ඩරය අවලංගු කර තිබුණි.

iv. තෝරාගත් සැපයුම්කරු වෙත ඉදිරිපත් කළ අංක SPC/P1/509/10 දරන ඉන්ඩෙන්ටුවෙහි ඖෂධ සැපයිය යුතු කාලය පළමු ඒකක100,000 ඉතා හදිසි ලෙසත් , දෙවන හා තෙවන තොග දැනුම් දීමෙන් පසු ලෙසත් නැවත වෙනස් කර තිබුණි.ඒ අනුව තොග පාලන අංශය විසින් තොග පිළිබඳ පරීක්ෂා කර ඉදිරිපත් කළ ඇණවුමෙහි තොග අවශ්‍ය කාලය කිසිදු හේතුවක් නොදක්වා අවස්ථා 04 කදී වෙනස් කර තිබුණි.

v. ඖෂධ හා ශල්‍ය උපකරණ සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 ජේදය අනුව ඖෂධ හා ශල්‍ය උපකරණ ආනයනයෙන් පසු අවම වශයෙන් මාස 06 ක කාලයක් සුවද විලවුන් ,උපකරණ හා ඖෂධ අධිකාරයෙහි (CDDA) සැපයුම්කරුගේ ලියාපදිංචිය සක්‍රියව පැවතිය යුතු වුවද , මෙම ඖෂධ තොගය සංස්ථා ගබඩාවට ලැබීමටත් ප්‍රථම එනම් 2011 අප්‍රේල් 28 දින සැපයුම්කරුගේ ලියාපදිංචිය කල් ඉකුත් වී තිබූ අතර ඊ වෙනුවට ප්‍රතිරෝදයක් නොමැති බවට ලිපියක් ලබාගෙන තිබුණි.

vi. 2010 අගෝස්තු මාසයේ සිට 2011 මැයි මාසය දක්වා සංස්ථාවේ ගබඩා තුල මෙම ඖෂධය හිඟව පැවති අතර මෙම කාලය තුල අදාල ඖෂධය සම්බන්ධයෙන් පාරිභෝගික අවශ්‍යතාවය ඉටු කිරීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

vii. ඖෂධ ඒකක 100,000 ක තොග ගබඩාවට ලැබීමෙන් පසුව කරන ලද නියැදි තත්ත්ව පරීක්ෂාවේදී ඖෂධ වල පැවතිය යුතු ආම්ලිකතාවය හා භාෂ්මිකතාවය (PH අගය) නොතිබීම හා කුඩා කැබලි තිබීමත් නිසා 2011 සැප්තැම්බර් 07 දිනැති අංක 578/4RIAI - 40 දරන තත්ත්ව වාර්තාවට අනුව තොගය තත්ත්වයෙන් අසමත් බවට වාර්තා වන විට එම තොගයෙන් ඒකක 15,360 ක් අලෙවිය සඳහා නිකුත් කර තිබුණි.

viii. තත්ත්වයෙන් අසමත් ඉතිරි ඒකක 84,640 සම්බන්ධයෙන් වූ රු. 682,456 ක අලාභය අයකර ගැනීම සඳහා සංස්ථාව විසින් නිකුත් කළ 2012 පෙබරවාරි 27 දිනැති අංක 000029 දරන හර පත්‍රය මේ දක්වා නිරවුල් කර ගෙන නොතිබුණි. තවද , ඉහත පරිදි අවස්ථා දෙකකදී සැපයුම්කරු විසින් සපයන ලද මෙම ඖෂධයේ නියැදි තත්ත්වයෙන් අසමත්ව තිබියදීත් , නිසි පරිදි නියැදි පරීක්ෂාවක් සිදු නොකර නැව්ගත කිරීමට පෙර නියැදි වාර්තාව මත පදනම්ව ඖෂධ ගෙන්වීම නිසා මෙම අලාභය සිදුවී තිබුණි.

(ඇ) ලොරි රථ මිලට ගැනීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලොරි රථ දෙකක් මිලට ගැනීමට ලන්සු කැඳවීමේදී සැපයුම්කරුවන් 05 දෙනෙකු ලන්සු ඉදිරිපත් කර තිබුණු අතර පළමු හා දෙවන අවම මිල ඉදිරිපත් කළ සැපයුම්කරුවන්ගේ ලන්සු ප්‍රතික්ෂේප කර එකක් රු. 7,000,000 බැගින් තෙවන අවම ලන්සුව ඉදිරිපත් කළ සතොස මෝටර්ස් ආයතනයෙන් මිලදී ගෙන තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස පළමු අවම ලන්සුව ඉදිරිපත් කළ ආයතන ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් සංස්ථාවට රු 1,480,800 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

ii. ඉදිරිපත් කළ තාක්ෂණික නියමාවලියේ 09 ජේදය අනුව, මුළු වටිනාකමින් සියයට 90 ක් වාහන 02 ලැබුණු පසුවද, සියයට 7.5 ක් මාස 03 කට පසුවද, ඉතිරි සියයට 2.5ක් රඳවා ගැනීම් ලෙස තබා ගෙන වසරකට පසුව ගෙවිය යුතු වුවද රිට පටහැනිව ලොරි රථ දෙක ලැබී මාසයක් ගත වීමටත් පෙර රු. 13,240,800ක් වූ මුළු මුදලම සැපයුම්කරුට ගෙවා තිබුණි.

### 3.3.3 ලාභාංශ මත ගෙවිය යුතු බදු

------------------------------

සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේ රු.259,329,589 ක් වූ බදු වලට පසු ලාභය මත ගෙවිය යුතු ලාභාංශ ගෙවා නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස නොගෙවන ලද ලාභාංශ මත රඳවාගත් ලාභාංශ බදු (deemed dividend tax) ගෙවීමේ අවදානමක් පවතී. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මූල්‍ය ද්‍රවශීලතාවය යහපත් මට්ටමක නොපැවති බැවින් ලාභාංශ ගෙවීමට නොහැකිවී තිබුණි. මෙම ලාභාංශයෙන් 2013 වසරේ අගෝස්තු මස රු.මිලියන 25 ක් ගෙවා තිබුණි. 2013 වසරට අදාල ලාභාංශ මෙම වසරේ දෙසැම්බර් මස ගෙවීමට කටයුතු කරන බවට සභාපතිවරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි.

### 3.3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොළඹ 07 පිහිටි ඔසුසල් පරිශ්‍රයේ රසායනාගාර පහසුකම් ඉදි කිරීමට 2010 වසරේදී රු.මිලියන 122 ක් අනුමත කර තිබුනද, 2012 දෙසැම්බර් මාසය වන විටද ඉදිකිරීම් අනුමැතිය ලබා ගැනීම හැරුණු කොට ඉදිකිරීම් සම්බන්ධ වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් සංස්ථාව විසින් ගෙන නොතිබුණි.

(ආ) ඉන්ඩෙන්ටු අංක DHS/SWW/3/32L/08-09 යටතේ මිල දී ගෙන ඇති Central Venous Catheter Double Lumen Adult set - 14G*18G lumens and 7Fr *16cm නැමැති අයිතමය වෛද්‍ය සැපයීම් අංශය ඉදිරිපත් කළ ඇණවුමෙහි සඳහන් අයිතමයේ ප්‍රමාණය හා සැපයුම්කරු ඉදිරිපත් කළ මිල ලැයිස්තුවේ සඳහන් අයිතමයේ ප්‍රමාණය එකිනෙකට වෙනස්ව තිබියදීත් සංස්ථාව විසින් සැපයුම්කරුට ඇණවුම භාර දී තිබුණි.

i. කල් ඉකුත්වීමේ දිනය වර්ෂ 3ක් සහිතව ශල්‍ය උපකරණ කට්ටලය වෛද්‍ය සැපයීම් අංශය මගින් ඇණවුම් කර තිබුණද අවස්ථා අනේදිම නියමිත ඒව කාලය සහිතව ශල්‍ය උපකරණ කට්ටලය සැපයීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

ii. පෙවන අවස්ථාවේ ගෙන්වූ රු.5,726,434 ක් වටිනා ඒකක 5000ක් වෛද්‍ය සැපයීම් අංශය මගින් ප්‍රතික්ෂේප කර තිබූ අතර ඒවා කුලියට ගත් ගබඩාවක් තුල කල් ඉකුත් වී වසරකට අධික කාලයක් ගත වී තිබුණද අලාභය සැපයුම්කරුගෙන් අය කරගත නොහැකි වී තිබුණි.

(ඇ) වරායේ සිට සංස්ථාවේ ගබඩාවලට/වෛද්‍ය සැපයීම් අංශයට ඖෂධ හා ශල්‍ය උපකරණ ප්‍රවාහනයට කුලී ගෙවීමේ පදනම මත ලබාගත් බහාලුම් වෙනුවෙන් තැන්පත් කරන ලද ආපසු අයකර ගතහැකි බහාලුම් තැන්පත් එකතුව වූ රු.6,310,000 ක් ආපසු අයකර ගෙන නොතිබුණි.

(ඇ) 2012 අගෝස්තු 10 දින පැවති අංක 672 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව, සංස්ථාවේ ලියවිලි නොමැතිවීමෙන් රු.359,500 ක්ද, නැව් ඒජන්ත සමාගම්වල ලිපිනයන් වෙනස්වීම නිසා රු.153,500 ක්ද, නැව් ඒජන්ත සමාගම්වල කාර්යයන් නැවැත්වීම නිසා රු. 90,000 ක්දවශයෙන් එකතුව රු. 603,000 ක් වූ බහාලුම් තැන්පත් අය කර ගත නොහැකිව පොත් වලින් ලියා හැර තිබුණි.

(ඉ) හානි වූ ඖෂධ තොග සඳහා වන රක්ෂණ හිමිකම් වටිනාකම රු.10,055,770 ක් වූ අතර විස්තර පහත දැක්වේ.

| වර්ෂය | වටිනාකම රු. |
|---|---|
| 2003-2005 | 552,256 |
| 2006 | 395,042 |
| 2007 | 526,248 |
| 2008 | 1,352,978 |
| 2009 | 1,004,189 |
| 2010 | 2,949,313 |
| 2011 | 1,183,562 |
| 2012 | 2,092,182 |
| | 10,055,770 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

i. 2003 වර්ෂයේ සිට 2009 වර්ෂයන් සඳහා ලැබිය යුතු රු.3,830,713 ක් වූ රක්ෂණ හිමිකම් ලබා ගැනීමට සංස්ථාව විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

ii. හානිවූ ඖෂධ තොගයන් වල වටිනාකම ගණනය කිරීමේදී සංස්ථාවේ වාප්පු අංශය හා ගිණුම් අංශය ඒකාකාර පදනමක් අනුගමනය කර නොතිබුණි. උදාහරණයක් ලෙස හානි වූ තොගයක් සඳහා ලැබිය යුතු රක්ෂණ හිමිකම ගිණුම් අංශය විසින් රු.9,919,753 කට හා වාප්පු අංශය විසින් එම තොගය රු. 9,669,879 කට ගණනය කර තිබුණි.

iii. වාප්පු අංශය විසින් රු. 9,669,879 කට අගයන ලද හානි වූ තොගයේ වටිනාකමින් රක්ෂණ හිමිකම් සඳහා ඉල්ලුම් කර තිබුණේ රු.2,226,330 ක් වටිනා හානි වූ තොගයක් සඳහා පමණක් වූ අතර රු.1,339,731 ක වන්දි මුදල් ලැබී නොතිබුණි.

3.3.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

කුලියට ගත් ගබඩාවක ඖෂධ හා ශල්‍ය පාරිභෝජන ද්‍රව්‍ය ගබඩා කර තිබූ අතර මෙම තොග සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භෞතික ආරක්ෂාව

සම්පූර්ණ ගබඩා පරිශ්‍ර ගොඩනැගිල්ලෙන් වර්ග අඩි 4000 ක කොටසක් මාසිකව රු.100,000 බැගින් කුලී ගෙවීමේ පදනම මත ඖෂධ හා ශල්‍ය පාරිභෝජන ද්‍රව්‍ය ගබඩා කිරීමට පවත්වා ගෙනයාමත්, ඉතිරි කොටස පෞද්ගලික සමාගමක සේවා අංශයක් ලෙස භාවිතා කර තිබුණි. මෙම

සේවා අංශය වෙන්කර ඇති අඩි 15 ක් පමණ උස බිත්තියට ඉහලින් බාහිර පාර්ශවයකට ඖෂධ ගබඩාවට ප්‍රවේශවීමේ හැකියාව තිබූ බැවින් ගබඩාවේ ආරක්ෂාව ප්‍රමාණවත් නොවුණි.

(ආ) තත්ත්වය පිළිබඳ ආරක්ෂාව

වෛද්‍ය සැපයීම් අංශය විවිධ හේතූන් මත ප්‍රතික්ෂේප කරන ලද ඖෂධ හා ශල්‍ය පරිභෝජන ද්‍රව්‍ය අතර ලේබල් සම්බන්ධ ගැටළු නිසා ප්‍රතික්ෂේප කළ ඖෂධ හා ශල්‍ය පරිභෝජන ද්‍රව්‍ය ද මෙම ගබඩාවේ ගබඩා කර තිබුණි. එවැනි තොග වැඩි උෂ්ණත්වයක් හා දූවිලි සහිත ස්ථානයක ගබඩා කිරීම හේතුවෙන් එම ඖෂධවල ගුණත්වය අඩුවීම හා තත්ත්වයෙන් බාල වීමේ අවදානමක් පැවතුණි.

3.3.6 ආර්ථික නොවූ ගණුදෙනු

---------------------------

2011 වර්ෂයේ බැංකු අයිරාව රු. මිලියන 4,716.7 ක් වූ අතර එය 2012 වර්ෂයේදී රු. මිලියන 7,896.7 දක්වා වැඩිවී තිබූ අතර ඒ වෙනුවෙන් ගෙවා තිබූ බැංකු අයිරා පොලිය 2011 හා 2012 වර්ෂවල පිලිවෙලින් රු.මිලියන 422.9 හා රු.මිලියන 339.1 ක් විය. 2012 වර්ෂයේදී ගෙවන ලද බැංකු අයිරා පොලියෙන් 2012 ජුනි සිට දෙසැම්බර් දක්වා පොලිය වූ රු. මිලියන 247.6 ක් මහා භාණ්ඩාගාරය විසින් නැවත ආපසු ලබා දීමට එකඟවී තිබූ අතර 2012 ජනවාරි සිට මැයි දක්වා අයිරා පොලිය වූ රු. මිලියන 91.4 ක් සංස්ථාවේ ලාභයට එරෙහිව ලියාහැර තිබුණි.

3.3.7 හඳුනා ගන්නා ලද පාඩු

------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පහත හේතූන් නිසා එකතුව රු.189,893,482 ක ඖෂධ හා ශල්‍ය පාරිභෝජන ද්‍රව්‍ය වෛද්‍ය සැපයීම් අංශය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි.

| විස්තරය | වටිනාකම<br>රු. |
|---|---|
| පිරිවිතර හා නොගැලපීම | 85,418,284 |
| තත්ත්වයෙන් අසමත් වීම | 28,966,714 |
| ඇසුරුම් පලුදුවීම්, ලැබීම් ප්‍රමාද වීම් හා පැමිණිලි මත ප්‍රතික්ෂේප වීම | 37,671,366 |
| කල් ඉකුත්වීම / කල් ඉකුත් වීමට ආසන්න වීම | 23,175,946 |
| ලේබල් අඩුපාඩු | 14,661,172 |
| | 189,893,482 |

(ආ) සංස්ථාවේ අලෙවිය සඳහා 1996 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ගෙන්වූ ඖෂධ වලින් රු. 80,563,867 ක ඖෂධ හා සමාලෝචිත වර්ෂය තුල ගෙන්වූ වටිනාකම රු.21,554,608 ක්වූ ඖෂධ විකිණිය නොහැකි තත්ත්වයට පත්වී තිබූ බැවින් සංස්ථාවට රු.102,118,475 ක පාඩුවක් සිදුවී තිබුණි. තවද, භෞතික තොග සත්‍යාපන වාර්තා අනුව එම තොගයේ වටිනාකම රු. 111,341,885 ක් වුයෙන් රු. 9,223,410 ක වෙනසට හේතු අනාවරණය නොවීණි.

3.3.8 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට සේවක පුරප්පාඩු විධායක ශ්‍රේණියේ 26 ක්ද, විධායක නොවන ශ්‍රේණියේ 66 ක්ද, සුළු සේවක 13 ක්ද වුයෙන් මුළු පුරප්පාඩු සංඛ්‍යාව 105ක් විය.

(ආ) 1997 ඔක්තෝබර් 24 දිනැති අංක 124 දරන මුදල් හා ක්‍රමසම්පාදන චක්‍රලේඛයට පටහැනිව සංස්ථාවේ නිළධාරීන් 06 දෙනෙකු වර්ෂ 01 සිට වර්ෂ 07 දක්වා කාල පරාසයක සිට වැඩ බැලීමට පත්කර තිබුණි. තවද, නිත්‍ය තනතුරුවලට පත්කළ නිළධාරීන් 03 දෙනෙකු පත්කිරීමට වර්ෂ 04 ක කාල ප්‍රමාදයක් ගතවී තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය
-----------------------------------------

4.1 සංයුක්ත සැලැස්ම
-------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව 2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා මුළු කාලයට සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබු නමුත් 2008, 2009, 2010, 2011 හා 2012 වර්ෂයන් සඳහා සංයුක්ත සැලසුම් පිළියෙල කර නොතිබුණි. මේ අනුව සංස්ථාවේ අරමුණු හා ඉලක්ක ඉටුකර ගැනීම සඳහා සංයුක්ත සැලැස්ම කළමනාකරණ උපාංගයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

4.2 ක්‍රියාකාරී සැලැස්ම
--------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු හා ඉලක්ක ඉටුකර ගැනීමේ වගකීම දරන කළමණාකරුවන් පැහැදිලිව දැක්විය යුතු වුවත් සංස්ථාව විසින් 2012 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් කිහිපයක් හැර අනෙකුත් ක්‍රියාකාරකම්වල වගකීම දරන කළමණාකරුවන් දක්වා නොතිබුණි.

(ආ) 2007 වර්ෂයේ සිට 2011දක්වා සංයුක්ත සැලැස්මේ දිගුවක් ලෙස 2012 වසර සඳහා පිලියෙල කළ ක්‍රියාකාර සැලැස්මේ ක්‍රියාකාරකම් 08 ක් 2012 වර්ෂය තුල සිදුකළ යුතු ක්‍රියාකාරකම් ලෙස දක්වා තිබුණද ඉන් ක්‍රියාකාරකම් 04ක් එනම් කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම, පර්යේෂණාගාර පහසුකම් ප්‍රවර්ධනය, ඔසුසල්වල තත්ත්වය වර්ධනය කිරීම සහ තෝරාගත් ප්‍රදේශ තුල රාජ්‍ය ඔසුසල් පිහිටුවීම යන අරමුණු ඉටුකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී අපොහොසත්ව තිබුණි.

## 4.3 අයවැය ලේඛනමය පාලනය

-----------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛණය සහ සත්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාර්යයක් ලෙස යොදාගෙන නොතිබුණි. අයිතම් 23 ක මෙම විචලනය සියයට 18 සිට සියයට 148 දක්වා පරාසයක විය.

## 5. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලනයේ අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන්හි දුර්වලතා කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය
(ආ) තොග පාලනය
(ඇ) ගණකාධිකරණ
(ඈ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
(ඉ) බදු
(ඊ) මානව සම්පත් කළමනාකරණය
(උ) නීතිරීති රෙගුලාසිවලට අනුකූල නොවීම.
(ඌ) ඔසුසල් ක්‍රියාකාරීත්වය
(එ) සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර සැලැස්ම
(ඒ) අයවැය

එච්.ඒ.එස් සමරවීර
විගණකාධිපති

2014 මැයි 08 දින

විගණකාධිපති තුමා,

විගණකාධිපති දෙපාර්තමේන්තුව,

නිදහස් චතුරශ්‍රය,

කොළඹ 7.

**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනත අනුව වන 14 (2)(සි) වගන්තිය ප්‍රකාර විගණන වාර්තාවේ කෙටුම්පත සම්බන්ධව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ පැහැදිලි කිරීම් පහත සඳහන් කරමි.**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම් ප්‍රතිපත්ති**

ඒ අනුව මූල්‍ය වත්කම්වල අගය අඩුවීම (Impairment of Financial Assets) නව ගණකාධිකරණ ප්‍රමිත LKAS 39 හා LKAS 32 ට අනුව සිදුකර ඇත.

මෙය ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 6.1.2.6 හා 6.1.2.7 යටතේ නිවැරදිව දක්වා ඇත.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

(අ) අදාල හරපත්‍ර ගිණුම් ගතකර 2013 වසරේ දි මෙම ගැටළුව නිරවුල්කර ඇත.

(ආ) සෞඛ්‍ය සේවා සපයන ලද ඖෂධ හා ශල්‍ය උපකරණ වෙනුවෙන් 2013 වසරේදී හරපත්‍ර යවා ගිණුම් ගතකර අදාල මාර්ගස්ථ තොගය නිරවුල් කර ඇත.

(ඇ) සඳහන් කර ඇති රු. 189,893,482 තොගය මතභේදයට ලක්ව ඇති තොගයන් වේ. මෙයින් අපට රජයේ බෙහෙත් ගබඩාව වෙත නැවත සැපයීම නොහැකි යැයි නිශ්චිතව හඳුනාගත හැකි තොග වෙනුවෙන් 100% ක වෙන්කිරීමක් සිදුකර ඇත.

**2,2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

අ) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව අලෙවි ප්‍රවර්ධන කටයුත්තක් ලෙස අප ආයතනය සමඟ විශ්වාසව ගනුදෙනු කරනු ලබන තෝරා ගත් බෙදාහරින්නන් හට දැනට පවතින ණය පහසුකමට වඩා 75% ක ණය පහසුකමක් වෙනුවෙන් 2012 දෙසැම්බර් මසට පමණක් සංස්ථාව විසින් ඖෂධ නිකුත් කර ඇත. ඔවුනට ලබා දෙන ණය කාලසීමාව තුලදී, එම ණය ශේෂය සම්පූර්ණයෙන්ම අය කර ගෙන ඇත.

ආ) 2.2.4 (අ) හි සඳහන් පරිදි නියෝජිත ආයතන සඳහා ද, එම පහසුකම ලබා දී තිබූ අතර එය ද නියමිත කාලසීමාව තුලදී අය කර ගෙන ඇත.

ඇ) ඔසුසල කළමණාකරුවන් හට අනුමත ණය සීමාව ඉක්මවා ණයට ඖෂධ නිකුත් නොකරන ලෙස විධි විධාන පනවා ඇත.

ඈ) ණයගැති ශේෂය තුල රාජ්‍ය ආයතන ණයගැති ශේෂය අන්තර්ගත වන්නේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකට කල සැපයීම්, රජයේ හමුදා සහ පොලිසිය රජයේ රෝහල් හා රාජ්‍ය ආයතන වන අතර එම ආයතන වලට ඖෂධ ලබා ගැනීමේ ප්‍රමුඛම ආයතනය වන්නේ ඖෂධ සංස්ථාවයි. එබැවින් ණය පදනම මත ඖෂධ ලබා දීම අඛණ්ඩව සිදු කිරීමට සංස්ථාවට සිදු වී ඇත. කලින් කලට රාජ්‍ය ආයතන වල පවතින මූල්‍ය තත්ත්වයක් මත නිසි කාලසීමාව තුල දී ණය පියවීමේ දුර්වලතා පවතී. එබැවින් එම ණයගැති ප්‍රතිශතය ඉහල ගොස් ඇත.

ඉ) අප ආයතනයේ මුළු මෙහෙයුම් ආදායමෙන් 76% ක් පමණ සැපයුම් කරනු ලබන්නේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකට වන අතර සෑම වර්ෂයකදීම ඔවුනට ණයට ලබා දෙන ශල්‍ය උපකරණ හා ඖෂධ සඳහා ගෙවීම් කරනු ලබන්නේ වටිනාකමට වඩා අඩු මුදලකි. එබැවින් වසරින් වසර මෙම ණයගැති ශේෂය ඉහල යාමක් දක්නට ඇත. එම නිසා මුළු ණයගැති ශේෂයෙන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙනුවෙන් ඇති ණයගැති ශේෂය ඉහල අගයක් ගනී.

ඊ) වසර 1 ට වඩා වැඩි පෞද්ගලික ණයගැතියන්ගෙන් රු. 9,670,225 ක මුදලක් වන්නේ සදර්න් ෆාමසියුටිකල්ස් හා ලොයිඩ් ෆාමසියුටිකල්ස් වන අතර එම මුදල පියවා ගැනීමට අවශ්‍ය නීතිමය පියවර ගැනීම සඳහා නීති අංශය වෙත යොමු කර ඇත. ඉතිරියෙන් රු.65,223.87 ක් අය කර ගෙන ඇති අතර රු.64,641.49 ක් 2013 වර්ෂයේදී ලියා හරින ලද අතර තවද රු.288,767.40 ක මුදලක් අගරු වෙක්පත් වේ. ඉතිරි මුදල වන රු.294,102.24 ක මුදල අය කර ගැනීම සඳහා ක්‍රියා මාර්ග ගනිමින් පවතී.

වසර 05 කට වඩා පෞද්ගලික ණයගැතියන්ගෙන් රු.769,826 වන්නේ එස්.ඒ.එස් ෆාමසියුටිකල්ස් වන අතර එම ණය මුදල අය කර ගැනීමට ඔහුට විරුද්ධව නඩු පවරා ඇති අතර එම නඩුව අධිකරණයේ විභාග වෙමින් පවතී. ඉතිරි මුදල වන රු.54,738 අය කර ගැනීම සඳහා අදාල ආයතන වලට එන්තරවාසි යවා ඇත.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම**

(අ) සියළු ණයගැතියන් සඳහා ශේෂය තහවුරු කරන ලෙස ඉල්ලා ලිපි යවා ඒවා යැවූ බව සහතික කරන විස්තර පත්‍රිකා ද විගණන අංශයට ලබා දී ඇත.

(ආ) අප විසින් ශේෂ තහවුරු කිරීම් ඉල්ලුම් කල ලිපි එකී සැපයුම් කරුවන්ට තැපැල් කලද බොහෝ ගනුදෙනු කරුවන් ශේෂය තහවුරු කර නොමැත.

2013 වසරේ සිට රජයේ විගණන අංශය හරහා ශේෂ තහවුරු කිරීමේ ලිපි සැපයුම් කරුවන් වෙත යැවීමට කටයුතු යොදා ඇත.

**2.2.5 නීති රීති රෙගුලාසි හා කලමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම**

**(අ ) සංස්ථාව විසින් උපයනවිට බදු ගෙවීම**

වෘත්තීය සමිති සමඟ සාකච්ඡාකර 2013 මැයි මස සිට උපයන විට බදු සේවකයන් ගෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත.

**(ආ ) 1. හා 11. ප්‍රසම්පාදන කමිටු සඳහා ගෙවීම් කිරීම**

සාමාන්‍ය රාජකාරි වේලාවෙන් පරිබාහිරව ප්‍රසම්පාදන කමිටු රැස්වීම් පැවැත් විය යුතුය යන අදාල නිරීක්ෂණ සමඟ එකඟ වේ. වැටුපෙන් සාමාන්‍ය ඉක්මවා ලබාගෙන තිබූ ප්‍රසම්පාදන කමිටු සඳහා වන දීමනාවල ප්‍රමාණය ගණනය කර අදාල නිලධාරීන්ගෙන් අයකර ගෙන ඇත. ප්‍රසම්පාදන කමිටු සභාපතිට හා සාමාජිකයන්ට දීමනා ගෙවීමේදී පැවරී ඇති කාර්යභාරය හා කාර්ය ප්‍රමාණය සලකා බලා ප්‍රසම්පාදන මග පෙන්වීම් වල ප්‍රතිපාදන අනුව රේඛීය අමාත්‍යංශයේ ලේකම්ගේ අනුමැතිය අනුව අදාල ගෙවීම් සිදුකර ඇත.

**(ඇ) මූල්‍ය වාර්තා දින 60 ක් තුල ඉදිරිපත් කිරීම**

පී.ඊ.ඩී 12 ජේද අංක 6.5.1

රාජ්‍ය ඖෂධ සංස්ථාවේ කෙටුම්පත් මූල්‍ය වාර්තාව මාර්තු 4 වන දින විගණකාධිපති තුමා වෙත ඉදිරිපත් කරන ලදි.

නමුත් 2012 වසරේ සිට ශ්‍රී ලංකාවේ සියලු ආයතන ජාත්‍යාන්තර ගිණුම් ප්‍රමිතයන්ට අනුව ගිණුම් පිළියල කළයුතු වූ බැවින්, සංස්ථාව මේ සඳහා ගිණුම් උපදේශක ආයතනයක් ලෙස E & Y විගණන ආයතනය සම්බන්ධ කරගත් අතර ඔවුන් විසින් අවසාන ගැලපීම් ඉදිරිපත් කල පසු අවසාන වාර්තාව 2013 ජුලි මස 11 වන දින විගණනයට ඉදිරිපත් කරන ලදි.

පී.ඊ.ඩී 12 ජේද අංක 6.5.3

2011 වසරේ වාර්ෂික වාර්තාව සෞඛ්‍ය අමාත්‍යංශය වෙත යවන ලද නමුත් වාර්ෂික වාර්තාව සමඟ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග සම්බන්ධ වාර්තාවක් ඉල්ලා තිබූ බැවින් එයද සකස්කර පාර්ලිමේන්තුවට ඉදිරිපත්කර 22.08.2012 දින පාර්ලිමේන්තුවේ සභාගතකර ඇත.

(ඈ) සමාලෝචිත වසර තුල සංස්ථාව විසින් සිදු කරන ලද සියලුම ප්‍රදානයන් හා අනුග්‍රාහකත්ව දීමනාවන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙහි සභාපතිවරයාගේ අනුමැතිය හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව සිදුකර ඇත.

**2.2.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

2013 වර්ෂයේදී ලියා හරින ලද රු.10,433,795 ක මුදලින් 92% ක් රාජ්‍ය ආයතන කරන ලද ණයට විකුණුම් වේ. එම ආයතන සමඟ වසර ගණනාවක සිටම ලිඛිතව හා වාචිකව රැස්වීම් වලදී මෙම ණයගැති ශේෂ පිළිබඳව දැනුවත් කර ඇති අතර ඔවුන් දිගින් දිගටම එම ණය ගෙවීම පැහැර හැරීම නිසා අවසානයේ දී ලියා හැරීමට සිදු ව ඇත. පෞද්ගලික අංශයේ ගණුදෙනුකරුවන් 38 ගෙන් අය විය යුතු ලියා හරින ලද රු.821,428 ක මුදලින් රු.245,141 ක මුදලක් එක් කළමණාකරුවකුගේ අත්තනෝමතික ලෙස ඖෂධ ණයට දීම මත සිදු වූවක් නිසා එය ඔහුගෙන් අය කර ගැනීම සඳහා කටයුතු කරමින් සිටියදී ඔහු මිය යාම නිසා අය කර ගැනීමට නොහැකි විය. මෙම ලියා හැරීම තුල පෞද්ගලික අංශයේ ගණුදෙනුකරුවන් 15 දෙනෙකු අන්තර්ගත වේ. ඉතිරි පෞද්ගලික අංශයේ 23 දෙනාගෙන් ආයතන 09 ගෙන් අය කර ගැනීමට නොහැකි වී ඇත්තේ එම ආයතන වසා දැමීම , කළමණාකාරිත්වය වෙනස් වීම , ඔසුසල වසා දැමීම හා ණයකරු මියයාම වැනි හේතූන්ය.

**3.3.2 ප්‍රසම්පාදන**

**(අ) Instrument set F/Lumber Disectomy නැමති ශල්‍ය උපකරණ මිළදීගැනීම.**

**(ඉන්ඩෙන්ටු අංකය : DHS/RSS/348/1290A/08)**

01.ටෙන්ඩරය සඳහා මිළගණන් ඉදිරිපත් කර තිබූ සැපයුම්කරුවන් අතරින් ලියාපදිංචිය ලබා තිබුනේ තෝරාගත් සැපයුම්කරු පමණි. මෙම ඇණවුම සඳහා අප විසින් ලියාපදිංචිය අලුත් කරන ලෙස දේශීය නියෝජිතයාට දැනුම් දී ඇති අතර ඔවුන් විසින් අප වෙත දන්වා එවා තිබුනේ එම ලියාපදිංචිය අලුත් කිරීම සඳහා අයදුම්පත් ඒ වනවිටදී CDDA වෙත භාරදී ඇති බවත් අලුත් ලියාපදිංචි සහතිකය බලාපොරොත්තුවෙන් සිටින බවත්ය.

ඒ අතරම ලියාපදිංචි සහතිකය කල් ඉකුත් වී ඇති බැවින් අදාල තත්ත්වය CDDA වෙත දැනුවත් කිරීමෙන් අනතුරුව අධ්‍යක්ෂ, වෛද්‍ය තාක්ෂණ හා සැපයුම් වෙතින් ලියාපදිංචි සහතිකය වෙනුවට No Objection Letter එකක් ලබාගෙ ඇත. එම නිසා ශල්‍ය උපකරණ කට්ටලය වරායෙන් නිදහස් කරගැනීම සඳහා භාවිතා කර ඇත්තේ විරෝධතාවයක් නැති බවට වෛද්‍ය තාක්ෂණ හා සැපයුම් ආයතනය විසින් නිකුත් කරන ලද ලිපියයි. ( No Objection Letter – NOL) 27.01.2011. මෙය මෙවැනි අවස්ථාවලදී වෙනත් විකල්පයක් නොමැති නිසා භාවිතා කරන සාමාන්‍ය ක්‍රමවේදයයි. මෙම කාර්යය සඳහා මෙම ලිපිය ලියාපදිංචිය තරමටම වලංගු වේ.

11. මෙහිදි සෘජු ගෙවීම් ලෙස දක්වා ඇති ක්‍රමයක් සංස්ථාව විසින් අනුගමනය නොකරන අතර සැපයුම්කරු විසින් එවන ලද ඉන්වොයිසිය සහ අදාල ලිපි පරීක්ෂා කිරීමෙන් අනතුරුව අදාල ගෙවීම් බැංකුව විසින් සිදුකර ඇත්තේ Documents Against Payment යන පිළිගත් ක්‍රමවේදය අනුවයි. මේ වනවිට එම මුළු තොගයම වෛද්‍ය සැපයුම් අංශයට භාරදී ඇති නිසා අයකර ගැනීමේ අවශ්‍යතාවයක් පැන නොනගී.
කාර්ය පටිපාටිමය ප්‍රමාදයන් හා ටෙන්ඩරය සම්බන්ධ මතු වූ ව්‍යාකූලතා නිසා මෙම ටෙන්ඩරය ප්‍රමාද වී ඇත. දක්වා ඇති අඩුපාඩු නිවැරදි කර මෙම තොගය වෛද්‍ය සැපයුම් අංශය වෙත නැවත භාරදී ඇත.

**(ආ) Ibuprofen 200mg ඖෂධයෙන් පෙති මිලියන 24 ක් මිළදීගැනීම.**

I. නිවැරදිය

11. 2012.02.13 දින තාක්ෂණ හා රසායනාගාරය විසින් මෙම අයිතමයේ කාණ්ඩ 10 ක පෙති වල දූර්වර්ණවීම, පාට වෙනස් වීම, අවිධිමත් පෙති මුහුණත් ආදිය සම්බන්ධව වාර්තා කර ඇත. ඒ අනුව ඉතිරි තොගය ලබාගැනීම සිදුකර නැත.

ඖෂධ තත්ත්වයෙන් අසමත් බව 2012 ජනවාරි මස 23 වන දින හඳුනාගන්නා ලද අතර එදිනම සභාපතිතුමාගේ අනුමැතිය අනුව මෙම අයිතමය වහාම 2012.01.25 දින භාවිතයෙන් ඉවත් කරන ලදි. ඒ අනුව එම බෙහෙත

අසම්මත වීමෙන් දින 02 ක් ඇතුලත භාවිතයෙන් ඉවත් කරන ලදි. මෙම අගයෙන් 10% ප්‍රමාණය මුදලින් ගෙවා

ඇති අතර ඉතිරිය නව තොගයකින් ලබාදීමට එකඟ වී ඇත.
iii. ආනයන කළමණාකරු මෙවන් සහතික කිරීමක් කර නොමැත. නමුත් තාක්ෂණ අංශය ලේඛණ අනුව පිරිවිතර ගැලපෙන බව සහතික කර ඇත. තත්ත්වය සම්බන්ධව පැන නැගි ඇති කරුණු ලේඛණවලින් හෙළිදරව් කරගත හැකි කරුණක් නොවේ.

iv. තත්ත්වය සම්බන්ධ කරුණු මතුවී දින දෙකක් තුල මෙම ඖෂධය නිකුත් කිරීම නවතා ඇත. ඒ අනුව ඔබගේ නිරීක්ෂණය සමඟ එකඟවිය නොහැක.
v. නැවත තොගය ලබාගැනීමේදි පූර්ව නැව්ගත කිරීමේ සාම්පල ලබාගෙන පරීක්ෂාකර තොග ලබාගැනීම සඳහා යම් කාලයක් ගතවන බැවින් ප්‍රමාදයක් සිදුවී ඇත. මේ වන විට අදාල කාර්ය පටිපාටිමය අවශ්‍යතා සම්පූර්ණකර එම තොගය සැපයීමට සැපයුම් කරුට දන්වා ඇත.

**(ඇ) රු. 1,347,696 ක් පිරිවැය වූ ශල්‍ය උපකරණ සංස්ථාවට අහිමිවීම**

**(ඉන්ඩෙන්ටු අංකය : DHS/SUS/19/361A/2009)**

එකඟ වේ.

සැපයුම්කරු වෙත ගෙවා ඇති මුදල් ඇමෙරිකානු ඩොලර් 11,654,20 වන අතර එය අයකර ගැනීම සඳහා ඇමෙරිකානු ඩොලර් 11,654,20 හරපතක් දේශීය නියෝජිතයාට යවා ඇත්තේ ඔහු විසින් දෙන ලද සහතිකය මත පදනම්ව සැපයුම්කරු වෙත මුදල් ගෙවන ලද බැවිනි. නමුත් මේ වනතුරු මෙම මුදල අප වෙත ගෙවා නොමැති නිසා දේශීය නියෝජිතයා වන CAB Enterprises විසින් LP/DHS/RSS/10/331A/2012 ඉන්ඩෙන්ටුව යටතේ සහ ඉන්වොයිස් අංක 9664 යටතේ සපයන ලද තොග සඳහා වන රු. 152,750 අයකර ගෙන ඇති අතර ඉතිරි මුදල අයකර ගැනීම සඳහා නිති අංශයට යොමුකර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දි ඇත්තේ ඒ වනවිට සංස්ථාව වෙත වාර්තා වී තිබූ තොරතුරු අනුවයි. එනම් 2011.8.15 දින වනවිට වාජ්පු කළමණාකරු වෙත නාවික ඒජන්ත වෙතින් ලැබී තිබූ තොරතුරු පදනම් කරගෙන අධ්‍යක්ෂ මණ්ඩලයට තොරතුරු ඉදිරිපත් කර ඇති අතර අපගේ ඉල්ලීම පරිදි දේශීය නියෝජිතයා විසින් භාණ්ඩ වෙන්දේසි කිරීම සඳහා නිකුත් කරන දැන්වීම් පත්‍රිකාව අප වෙත ඉදිරිපත් කර ඇත්තේ 2012 වර්ෂයේ අගෝස්තු මස වන නමුත් එම දැන්වීමේ දිනය වූයේ 2011.4.26 ය. එහි සඳහන් වී ඇති පරිදි දින 7 ක් ඇතුලත ඒ සඳහා ක්‍රියා මාර්ගයක් නොගතහොත් එම භාණ්ඩ තොගය විකිණීමට හෝ විනාශ කිරීමට කටයුතු කරන බව සඳහන් කර ඇත. ඒ අනුව 2011.12.31 දින අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලද පත්‍රිකාවෙන් ලබාදුන් තොරතුරු ඒ වනවිට සංස්ථාවට ලැබී තිබුණු තොරතුරු අනුව ලබාදුන් තොරතුරු වේ.

**(ඈ) Clarithromycin powder for reconstitution for intravenous infusion 500mg ඖෂධ වැල්ව 60000 ක් මිළදීගැනීම. (ඉන්ඩෙන්ටු අංක DHS/MG/177/11)**

i. මෙම අයිතමයේ මෙම ඕඩරය සඳහා ආනයනික පළමු තොගය වන වයල් 30000 ක තොගය වෛද්‍ය සැපයුම් අංශය වෙත භාරදීමෙන් අනතුරුව එම තොගය තුල බිඳුණු විදුරු Vial පවතින බව ඔවුන් (වෛද්‍ය සැපයුම් අංශය) විසින් නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව එම තත්ත්වය නිරීක්ෂණය කිරීමට කමිටුවක් පත් කරන ලෙස ඉල්ලා සිට ඇත. එම ලිපියෙන් දින 7 කට පසු එනම් 2011.5.30 දිනදි වෛද්‍ය සැපයුම් අංශය විසින් සංස්ථාවට දැනුම් දි ඇත්තේ සමස්ථ තොගය නිරීක්ෂණය කර පලුදු වී ඇති ප්‍රමාණය පමණක් නොමිලයේ ප්‍රතිසැපයුම් කරන ලෙස පමණි.

ii. මෙම තත්ත්වය අදාල ඖෂධය තත්ත්වයෙන් අසමත්වීමක් නොව ඖෂධය අඩංගු මූලික ඇසුරුම වන විදුරු වයල්වල බිඳියාමක් පමණක් වුණු අතර ණයවර ලිපිය සංශෝධනය කරන අවස්ථාව වනවිට (2011.5.31) මෙම ඖෂධයේ තත්ත්වයෙන් අසමත්වීමක් (Quality Failure) හෝ භාවිතයෙන් ඉවත් කිරීමක් වාර්තා වී නොතිබිණි. ඉතිරි තොග ලංකාවට ගෙන්වීම නැවැත්වීම සඳහා වන තරම් බරපතල (ඖෂධය තත්ත්වයෙන් අසමත්වීමක් හෝ භාවිතයෙන් ඉවත් කිරීමක්) තත්ත්වයක නොවූ බැවන් සහ

එසේ ඉදිරි තොග මෙම සැපයුම්කරුගෙන් ආනයනය කිරීම නවත්වාලන ලෙසට කිසිදු දැනුම් දීමක්ද වෛද්‍ය සැපයුම් අංශය හෝ වෙනත් අධිකාරියක් විසින් කර නොතිබීම නිසා ඉතිරි තොග ලංකාවට ගෙන්වන ලදි.

iii. මෙම සැපයුම්කරුගේ **Clarithromycin IV 500mg ඖෂධ** නික්ෂේපනයෙහි කාණ්ඩ අංක EB 02229 භාවිතයෙන් ඉවත් කරගත යුතු බවට NDQAL විසින් නිරීක්ෂණය කර ඇත්තේ 2011.6.30 දි වන අතර ඒ වනවිට වෛද්‍ය සැපයුම් අංශය විසින් දිගින් දිගටම සංස්ථාව වෙත දන්වා ඇත්තේ අදාල තොග වෙනුවට නව තොග නොමිලේ ලබාගැනීමට කටයුතු කරන ලෙසටය. මෙසේ දෙවන හා තෙවන තොග වෛද්‍ය සැපයුම් අංශය විසින් භාර නොගැනීම නිසා සංස්ථාවට යම් පාඩුවක් සිදුවී ඇති බව පෙනී ගියද මේ වනවිට හරපත් අංක 002/2013 මඟින් ඇමෙරිකානු ඩොලර් 84,182.81 හා හරපත් අංක 353/2012 (සංශෝධිත) මඟින් ඇමෙරිකානු ඩොලර් 13,883.,04 ගෙවීම සඳහා සැපයුම්කරු වෙත ඉදිරිපත් කර ඇත. ඒ අතරින් 002/2013 හරපත සම්පූර්ණයෙන්ම සැපයුම්කරු විසින් ගෙවා ඇති අතර 353/2012 (සංශෝධිත) හරපත සඳහා ඇමෙරිකානු ඩොලර් 7,518.96 ගෙවා දමන ලෙස සැපයුම්කරුට දැනුම් දි ඇත.

මෙයට අමතරව මෙම අයිතමයේ ඖෂධ සංඝටකවල තත්ත්වයෙන් අසමත්වීමක් වාර්තා නොවී ඇති අතර ඖෂධ භාවිතයෙන් ඉවත් කිරීමට හේතුව මූලික ඇසුරුමෙහි දුර්වලතාවයයි. ඒ අතර වෛද්‍ය සැපයුම් අංශය විසින් දිගින් දිගටම ප්‍රතික්ෂේපිත තොග වෙනුවට නව තොග ඉල්ලා සිටි නිසා සංස්ථාවට වී ඇති පාඩුවට මුදලින් පියවා ගැනීමට වඩා නව තොග නොමිලේ ලබා ගැනීමට වැදගත් වූ අතර එසේ කිරීමෙන් පසු සංස්ථාවට සිදු වූ මූල්‍යමය පාඩුවද ඒ සමඟම ස්වයංක්‍රියව පියවී යන බවද පැහැදිලි කරුණකි. නමුත් 2012.4.5 දින දි අධ්‍යක්ෂ වෛද්‍ය තාක්ෂණ රසායන හා සැපයුම්ගේ නිර්දේශය අනුව සැපයුම්කරුගෙන් මෙම අයිතමය නොමිලේ ප්‍රතිසැපයුම් කරගැනීම සිදු නොකලයුතු බව දන්වා සිටි නිසා සැපයුම්කරුගෙන් අයකර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ වූයේ ඉන්පසුවයි.

අධ්‍යක්ෂ වෛද්‍ය තාක්ෂණ හා සැපයීම්ගේ නිර්දේශය ප්‍රසම්පාදන කමිටුව වෙත දන්වා අදාල ප්‍රතික්ෂේපිත තොගවල වටිනාකම සැපයුම්කරුගෙන් අයකර ගැනීමේ කටයුතු සිදු කරන ලදි. මෙම ලිපිගොනුව විගණන කටයුතු සඳහා ලබාගෙන ඇත්තේ එම උපදෙස් ලබාදුන් විගසම වන හෙයින් එසේ මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම ප්‍රමාද වූ නමුත් අද දින වනවිට එම මුදලින් ඇමෙරිකානු ඩොලර් 90,546,89 ක් දැනට අය කරගෙන ඇති බව දන්වනු කැමැත්තෙමි. තවදුරටත් අයකර ගැනීමට ඇති මුදල ඇමෙරිකානු ඩොලර් 7518.96 ක් පමණි.

iv. 10% රඳවා ගැනීම නිසි පරිදි රඳවාගෙන ඇත. තත්ත්වයෙන් අසමත්වීම වාර්තා වනවිට රඳවාගත හැකි කාලය වන දින 60 ඉක්මවා ගොස් ඇති බැවින් ඒ මඟින් පියවාගත නොහැකි වී ඇත.

තවද මෙම ගැටළුවේ මූලික අවස්ථාවේ සිටම සංස්ථාව ක්‍රියාකරනු ලැබුවේ වෛද්‍ය සැපයුම් අංශය විසින් දිගින් දිගටම දන්වා ඇති පරිදි මෙම ඖෂධ අත්‍යාවශ්‍ය ඖෂධයක් වන හෙයින් එය නොමැතිකමින් රෝගී සුව සේවාව පවා අඩාල වියහැකි තත්ත්වයක් උද්ගත නොවීමට වගබලා ගැනීම බව දන්වනු කැමැත්තෙමි.

**(ඉ) Cannulated Screw ශල්‍ය උපකරණ මිළදී ගැනීම.**

**(ඉන්ඩෙන්ටු අංකය : DHS/SU/221/825B/08)**

i. මෙම සංකීර්ණ ඇණවුම අයිතම 129 ක් ගෙන්වීම සඳහා වූ ඇණවුමකි. මෙම ඇණවුම සඳහා සැපයුම්කරුවන් හතකට වැඩි ප්‍රමාණයක් මිළගණන් ඉදිරිපත් කර තිබූ අතර ලඝු ගත කිරීමේ කටයුතු සඳහා සාමාන්‍ය කාලයට වඩා වැඩි කාලයක් ගතවීම වැලැක්විය නොහැකි කරුණකි. තවද සැපයුම්කරු තිරණය වීමෙන් පසුවද වෛද්‍ය සැපයීම් අංශය විසින් 2009.7.20 දින ලිපියක් මඟින් අයිතම 129 න් අයිතම 33 ක් අවලංගු කර ඇත. අයිතම අවලංගු වූ පසු නැවත ප්‍රසම්පාදන කමිටුව වෙත දැන්විය යුතුය. ඒ සඳහාද කාලයක් ගතවී ඇත. ඉන්ඩෙන්ටුව 2009.9.11 වන දින නිකුත් කර ඇති නමුත් එම කාලයේ සංස්ථාව තුල තිබූ මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් රුපියල් මිලියන 5 ක් ඉක්ම වූ ඇණවුම් සඳහා මූල්‍ය තත්ත්වය සලකා බැලීමෙන් පසු 2009 නොවැම්බර් මස ණයවර ලිපිය නිකුත් කිරීම සිදුවිය. තවද ණයවර ලිපියේ ගෙවීම් කොන්දේසි සම්බන්ධව සැපයුම් කරු ආරවුල් කල නිසා එය විසඳාගැනීමටද යම් කාලයක් ගතවිය.

මෙම ටෙන්ඩරයේ මූලික ඇගයීම් කටයුතු විශේෂඥ විකලාංග ශල්‍ය වෛද්‍ය උපාලි බානගල මහතා විසින් සිදුකර ඇති අතර සැපයුම්කරුවන් තෝරාගැනීම සිදුකර ඇත්තේ අවම මිළගණන් හා ඖෂධ අධිකාරියේ ලියාපදිංචි සහතිකය ලබාගැනීම යන කරුණු පදනම් කරගෙනය. (ලියාපදිංචිය ලබාදීමේදී අදාල ක්ෂේත්‍රයේ විශේෂඥ වෛද්‍යවරයෙකු විසින් සාම්පල පරීක්ෂා කිරීමක් සිදු කෙරේ.) ඉහත ටෙන්ඩරයට අදාල සියලු අයිතමයන් සඳහා සාම්පල ලබාදී තිබුණේ වෙනත් සැපයුම්කරුවෙකු වන අතර ඔහුගේ මිළගණන් නිර්දේශිත සැපයුම්කරුගේ (GST Corporation-India) මිළගණන් හා සැසඳීමේදී ඉහල අගයන් ගෙන ඇති බැවින් ඉහත තෝරාගැනීම සඳහා සාම්පල පරීක්ෂාවක් සිදුකර නැත. අගැයුම්කරු ඔහුගේ අත්දැකීම් හා දැනීම මත මේ ආකාරයට නිර්දේශ ලබා දෙනු ලැබේ.

තවද ඉහත මූලික තෝරාගැනීමෙන් අනතුරුව නැවත සාම්පල පරීක්ෂා කිරීමක් සිදුකිරීම සඳහා නිර්දේශ වී නොමැති බැවින් එවැන්නක් සිදුවී නොමැත.

ii. මෙම අයිතමවල පීවකාලය වසර 3 ක් වන බැවින් අපගේ දැනුම්දීම මත සැපයුම්කරු ආනයන ලේඛණ නිවැරදි කරනු ඇතැයි අපේක්ෂාවෙන් භාණ්ඩ රඳවා තබාගෙන ඇත.

හිඟ ඒකක 16 ට අදාලව නිකුත් කර ලද අංක 00339/2012 දරණ හර පත්‍රයේ වටිනාකම වූ ඇමෙරිකානු ඩොලර් 13,284.04 යන්නෙන් 2013.2.15 වන දින ඇමෙරිකානු ඩොලර් 1.041.60 වටිනාකමින් සැපයුම්කරුගෙන් අය කරගෙන ඇත. එබැවින් ඉන් ඉතිරිව ඇති අයකර ගතයුතු වටිනාකම මේ වනවිට ඇමෙරිකානු ඩොලර් 12,242,44 වේ. මෙම මුදල නොගෙවන්නේ නම් "අසාධුගත සැපයුම්කරුවන්ගේ ලැයිස්තුවට" ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.

**(ඊ) Gentamicin Injection BP 80mg/2ml මිළට ගැනීම.**

**(ඉන්ඩෙන්ටු අංක SPC/PI/509/10)**

i. පළමු ටෙන්ඩරයට තෝරාගත් සැපයුම්කරුගේ පූර්ව නැව්ගත කිරීමේ සාම්පල ප්‍රතික්ෂේපවීම නිසා නැවතත් ටෙන්ඩර් කැඳවීමට සිදුවී ඇත.

ii. එකඟ වේ.

iii. ඖෂධයේ අවශ්‍යතාවය හා පවතින තොග තත්ත්වය හා අනෙකුත් කරුණු සැලකිල්ලට ගෙන පෙර නැව්ගත කිරීමේ සාම්පල පරීක්ෂාවකට යටත්ව ටෙන්ඩරය පිරිනැමීම ප්‍රසම්පාදන කමිටුව මඟින් සිදුකර ඇත.

දෙවතාවක් පෙර නැව්ගත සාම්පල පරීක්ෂා කිරීම එකම කාණ්ඩයෙන් සිදුකර ඇති බව දන්වා සිටින අතර, දෙවන වර පරීක්‍ෂා කිරීම සැපයුම්කරුගේ ඉල්ලීම මත සිදුකරන ලද්දකි. තවද ඒ සඳහා ගිය පිරිවැය සැපයුම්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත.

පළමු ඒකක 80,000 සඳහා ණයවර ලිපියක් නිකුත් කර තිබීම නිවැරදි වේ. එනම්, ණයවර ලිපියක් නොමැතිව සැපයුම්කරුවන් තම නිෂ්පාදන කටයුතු ආරම්භ නොකරන අතර, කොන්ත්‍රාත්තුව බලාත්මක කිරීම සඳහා ණයවර ලිපියක් නිකුත් කරන ලදි. එසේ වුවද, මෙම ණයවර ලිපිය පෙර නැව්ගත කිරීම් සාම්පල පරීක්ෂාව යන කොන්දේසියට යටත්ව ස්ථාපිත කර ඇත. භාණ්ඩ ලබානොගත් නිසා මෙම ණයවර ලිපිය ක්‍රියාත්මක වී නැත. අදාල ගාස්තුද සැපයුම්කරුගෙන් අය කරගෙන ඇත.

iv. දක්වා ඇති කරුණු නිවැරදියි. එම අවස්ථාවේදී වෙළෙඳපොලේ ඇතිව තිබූ දැඩි හිඟය මඟහැර වීමට මුල් තොගය වශයෙන් ඒකක ලක්ෂයක් ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත. ඉතිරි තොග ගෙන්වීමේ කාලවකවානුව ස්ථිරව තීරණය කිරීමට අපොහොසත්වීම මීට පෙර මෙම ඖෂධයේ සාම්පල අසමත් වී තිබීම හා යම් හෙයකින් මෙම පළමු තොගයේ තත්ත්ව අසමත් වීමක් සිදුවුවහොත් ඇති වියහැකි අපහසුතාවය හා පාඩුව වළක්වා ගැනීම සඳහාය.

v. ඉන්ඩෙන්ටුව නිකුත් කළ දින වන 2010.12.14 වන විට ඖෂධයේ ලියාපදිංචිය එතැන් සිට මාස 4 1/2 කට ආසන්න කාලයක් බලාත්මකව පැවති නමුත්, සැපයුම්කරු විසින් මෙම ඇනවුම ලබාදීම සිදුකර ඇත්තේ ලියාපදිංචි කාලය අවසන් වූ පසුවය. මෙම ඖෂධය මිල අඩු අත්‍යවශ්‍ය ප්‍රතිජීවක ඖෂධයක් වන නිසාත්, 2009 වසරේ සිට තොග හිඟයක් පැවති නිසාත්, යන කරුණු පදනම් කර ගෙන මෙම තොගය නිෂ්කාශනය කිරීමට ඖෂධ පාලන අධිකාරියෙන් විශේෂ අවසරයක් ලබාගන්නා ලදි.

vi. එම වකවානුව තුළ මෙම ඖෂධය වෙළෙඳපොලට සැපයූ සැපයුම්කරුවන් අතරින් ඒ බවර් සහ සමාගම එක කුප්පියක් ඇමරිකානු ඩොලර් 1.40 ක මිලට ආනයනය කර තිබූ අතර, අනෙක් සැපයුම්කරු වී තිබුණේ මීට පෙර ටෙන්ඩර් සාම්පල අසමත් වී ඇනවුම අවලංගු කරන ලද Vital Health Care, India සමාගමයි. තවද මුල් ටෙන්ඩරයේ අනෙක් සියලු ලංසු කරුවන් අවම සුදුසුකම් සපුරා නොතිබූ බැවින්, එම ටෙන්ඩරය අවලංගු කොට නැවත ටෙන්ඩර කැඳවීම තුළින් සුදුසු සැපයුම්කරුවෙකු සොයා ගැනීමට සිදු විය.

vii. එකඟ වේ.

viii. මෙම සැපයුම්කරුගේ ලියාපදිංචි කිරීම් සියල්ල ඖෂධ අධිකාරිය විසින් මේ වනවිට අවලංගු කර ඇත. හරපත් ගෙවීම මේ දක්වා පැහැර හැර ඇති බැවින් නිති මඟින් කටයුතු කිරීමට නිති අංශය වෙත යොමුකර ඇත.

**(උ) ලොරි රථ මිලට ගැනීම.**

i. ශිතකරණ සහිත ලොරි රථ 2 මිළදීගැනීම සඳහා ලැබුණු සියලුම ටෙන්ඩර් ලියවිලි අධ්‍යයනය කර අදාල ඇගයීම් හා නිර්දේශ සිදු කරන ලද්දේ මෙම වාහන පිළිබඳව විශේෂ දැනුමක් ඇති කොළඹ මහ නගර සභාවේ යාන්ත්‍රික ඉංජිනේරු මහතෙකු හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනෙකුත් සාමාජිකයන් විසිනි. ඔවුන් සියලු දෙනාගේම ඇගයීමෙන් පසු එළඹි එකඟතාවයකට අනුව මෙම ලොරි රථ දෙක තෙවන අවම මිල ඉදිරිපත් කල සතොස මෝටර්ස් ආයතනයෙන් මිලදීගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කර ඇත.

ii. සතොස මෝටර්ස් ආයතනයේ ටෙන්ඩර් ලියවිල්ලට අනුව වටිනාකමින් 50% ක මුදලක් ඇණවුම සමඟ ලබාදිය යුතුය. 2012.6.15 වන දින ලොරි රථ 2 මිලදීගැනීම සඳහා ඇණවුම භාරදුන් අතර ටෙන්ඩර් ලියවිල්ලට අනුව 50% ක වටිනාකමින් යුත් මුදලක් එම අවස්ථාවේ ලබානොදී එම වාහන අප ආයතනයට රැගෙන ඒමෙන් අනතුරුව 2013.7.26 දිනැති චෙක්පතකින් මුළු මුදල පියවන ලදි.

**3.3.3 ලාභාංශ මත ගෙවිය යුතු බදු**

සංස්ථාවේ මුල්‍ය ද්‍රවශීල තාවය හොඳ මට්ටමක නොපැවති බැවින් 2012 වසරේ ලාභාංශ ගෙවීමට නොහැකිවී ඇත. නමුත් 2013 වසරේ රු. මි 50 ක් ලාභාංශ ලෙස ගෙවන ලදි..

**3.3.4 කළමනාකරණ අකාර්යක්‍ෂමතා**

**(අ)** කොලඹ 7 රසායනාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කෙරෙමින් පවති. 2015 පෙබරවාරි වන විට වැඩ අවසන් කිරීමට නියමිතය.

**(ආ) Central Vanous Catheter**

වෛද්‍ය සැපයුම් අංශයෙහි ඇණවුම වන MSD/SC/003/08 හි SR 521454 යටතේ සඳහන් වන්නේ A Double Lumen Catheter with 14Gx18G Lumes and size 7Fx16cm length යනුවෙන් වන අතර සැපයුම්කරුගේ ලංසුවේ සඳහන් වනුයේ CV-702/167Fr Double Lumen Adult Set with Length 16cm (16G/16G) යන්නයි. මෙහිදී සංස්ථාවේ සැපයුම්කරු තෝරාගෙන ඇත්තේ මෙම තෝරාගත් සැපයුම්කරු මෙම අයිතමය සඳහා මිළගණන් ඉදිරිපත් කල බැවින් සැපයුම්කරුවන් අතරින් අවම මිල ඉදිරිපත් කල බැවින් හා පෙර සැපයුම්කරු වන බැවිනි.

I. සැපයුම්කරු හට ඉන්ඩෙන්ටුව **DHS/SWW/3/32L/08-09** නිකුත් කර ඇත්තේ 2007.8.14 වන දින වන අතර එහි ලැබීම් සඳහන් වන්නේ පහත පරිදිය.

| | | |
|---|---|---|
| අයිතම 5000 | - | 2008 ජනවාරි |
| අයිතම 4000 | - | 2008 මැයි |
| අයිතම 5000 | - | 2009 ජනවාරි |
| අයිතම 4000 | - | 2009 මැයි |

සාමාන්‍ය ක්‍රියා පටිපාටියට අනුව සැපයුම්කරුවෙකු හට ඉන්ඩෙන්ටුවක් ලැබුණු වහාම නිෂ්පාදනය ආරම්භ කරයි. ඉන්ඩෙන්ටුව 2007 දී ලබා දුන්නත් පළමු තොගය වන අයිතම 5000 ක් සඳහා ණයවර ලිපියක් ලබාදීමට හැකිවුයේ 2008 ජනවාරි මස වන අතර එම තොගය සැපයීමට අපේක්ෂා කර සිටියේත් 2008 ජනවාරි වන විටයි. නමුත් ඒ වනවිට ගෙන්වූ පලමු තොගය වන අයිතම 5000 හි කල් ඉකුත්වන දිනය ලෙස සඳහන් වූයේ 2010.10.31 ලෙස වන අතර එය වෛද්‍ය සැපයීම් අංශය වෙත ලබාදීම 2008 පෙබරවාරි මාසයේදී සිදුවිය. වසර 3 ක ආයු කාලයක් සහිත ඖෂධ වෛද්‍ය සැපයීම් අංශය මඟින් ඉල්ලා සිටියද. ඒ වනවිටද එම තොගයේ අයිතම 5000 අවුරුදු 2 ක් මාස 8 ක ආයු කාලයක් සහිත විය. ආයු කාලයේ අඩුව වූයේ මාස 4 කි. ණයවර ලිපිය ප්‍රමාදවීම නිසා මේ තත්ත්වය ඇතිවිය. එය නොවැලැක්විය හැකි හේතුවක්ව තිබුණි.

ii. අලාභය වන රුපියල් මිලියන 6,977,816.38 වන මුදල සැපයුම්කරු විසින් ගෙවීම ප්‍රතික්ෂේප කර ඇත. එයට හේතුව මෙම තොගයට පෙර පළමු හා දෙවන තොගයන්ද අඩු ආයු කාලයක් (මාස 36 ට අඩු) සහිතව සපයන ලද විට වෛද්‍ය සැපයීම් අංශය විසින් භාරගන්නා ලද බැවිනි.

නමුත් සංස්ථාව විසින් "ප්‍රතික්ෂේපිත ඖෂධ නැවත භාරගැනීම." සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හා වෛද්‍ය සැපයීම් අංශය යන ආයතන සමඟ 2013.8.7 වන දින නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (රසායනාගාර සේවා) සමඟ පැවති රැස්වීමේදී පවා සාකච්ඡාවට භාජනය කෙරුණු නමුත් එහිදී ලැබුණු නිර්දේශය වූයේ එම තොගය කල් ඉකුත් වී ඇති බැවින් සැපයුම්කරුගෙන් අයකර ගන්නා ලෙසය.

සැපයුම්කරු ගෙවීම් පැහැර හරින බැවින් නීති මඟින් කටයුතු කිරීමට නීති අංශයට යොමුකර ඇත.

**(ඇ)** සඳහන් කර ඇත්තේ වර්ෂය අවසානයේ පැවති බහලුම් තැන්පතු ගිණුමේ ශේෂයයි. මේ වන විට

රු. මි 3.0 කට ආසන්න ප්‍රමාණයක් නැවත අයකරගෙන ඇති අතර ඉතිරි තැන්පතු අයකර ගැනීමට කටයුතු

කරමින් පවතී.

**(ඈ)** අදාල ලියවිලි මඟහැරීම, නැවී ඒජන්ත සමාගම්වල ලිපිනයන් වෙනස් වීම හා නැවී ඒජන්ත සමාගම්වල කාර්යයන් නැවැත් වීම වැනි හේතුන් නිසා අය කර ගත නොහැකි වු බහලුම් තැන්පතු අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ඇතිව ලියා හැර ඇත.

**(ඉ) රක්ෂණ වන්දි ලබාගැනීම**

i. විවිධ හේතුන් නිසා මෙතෙක් නිරවුල් නොවූ ලැබිය යුතු රක්ෂණ වන්දි ලබා ගැනීමට කටයුතු කරන අතර ඉතිරිය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ලියා හැරීමට කටයුතු කරමි.

11. හා 111. මෙම අංශ දෙකෙහි ඇති එකිනෙක වෙනස් අවශ්‍යතා සඳහා වාර්තා තබා ගන්නා බැවින්, මෙම අංශ දෙකෙහි වටිනාකම් අතර වෙනස්කම් තිබිය හැකිය. එම වෙනස්කම් සැමවිටම නොපවතින අතර ගිණුම් අංශය විසින් විටින් විට සසඳා බලා අදාල ගැළපිලි සිදුකරයි.

**3.3.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**අ. භෞතික ආරක්ෂාව.**

ආරක්ෂක දැල් ආවරණය මේ වනවිට නැවත සකසා ඇත.

**ආ. තත්ත්වය පිළිබඳ ආරක්ෂාව**

වෛද්‍ය සැපයීම් අංශය විවිධ හේතුන් වන ප්‍රතික්ෂේප කරන ලද ඖෂධ හා ශල්‍ය උපකරණ තාවකාලිකව හෝ ගබඩා කිරීමට සිදුවී ඇත්තේ මෙම ගබඩාවේය. තවද ප්‍රතික්ෂේපිත ඖෂධ බොහෝ කාලයක් ගබඩාවල රඳවා තබාගැනීමෙන් තොරව ඉතාමත් ඉක්මණින් නැවත පිලිසකර කර වෛද්‍ය සැපයීම් අංශයට නැවත යවයි. නමුත් යම් යම් ප්‍රායෝගික හේතුන් මත මෙම කාරණාවේදී ප්‍රමාදවීම් ඇති වේ. මේ තත්ත්වය මඟහරවා ගැනීම සඳහා සෞඛ්‍ය ලේකම්තුමාගේ මැදිහත්වීමෙන් නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (රසායනාගාර සේවා) ගේ ප්‍රධානත්වයෙන්, අප සංස්ථාවේ හා වෛද්‍ය සැපයුම් අංශයේ නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවක් පත්කර ඇත. සතියකට වරක් එම කමිටුව රැස්වන අතර එහිදී තාවකාලිකව ප්‍රතික්ෂේප වන අයිතම සම්බන්ධව සියලු පාර්ශවයන්ගේ එකඟත්වය ඇතිව ඉක්මන් තීරණ ගැනීම සිදු කරනු ලැබේ. තවදුරටත් ලේබල් නොගැලපීම සම්බන්ධයෙන් ඇතිවන ගැටලුකාරී තත්ත්වයන් මඟහැර ගැනීම සඳහා ආනයනයට පෙර අදාල ලේබල්වල සාම්පල් ගෙන්වාගෙන අනුමැතිය ලබාදීමෙන් පසුව පමණක් තොග ගෙන්වා ගැනීමේ ක්‍රමයක් හඳුන්වා දී ඇත.

වඩාත් හොඳ ගබඩා පහසුකම් ලබාගැනීම සඳහා නව ගබඩා සංකීර්ණයක ඉදිකිරීම් ආරම්භ කර ඇති අතර තාවකාලික පිළියමක් ලෙස ගබඩා කිහිපයක් කුලියට ගැනීමටද කටයුතු කර ඇත.

### 3.3.6 ආර්ථික නොවූ ගනුදෙනු

ප්‍රකාශය සමඟ එකඟවේ.

### 3.3.7 හඳුනා ගන්නා ලද පාඩු

**(අ) විකිණිය නොහැකි ඖෂධ**

i. වෛද්‍ය සැපයුම් අංශයට කල සැපයුම් වල සමහරක් අයිතමවල හා ඒවායේ බහාලුම් වල ඇති අඩුපාඩු නිසා ඒවා ප්‍රතික්ශේප කරනු ලබයි. එම තොග සංස්ථාව භාරයට ගෙන සැපයුම් කරු හෝ ඔහුගේ නියෝජිතවරයා ලවා නිවැරදි කල හැකි අයිතම නිවැරදි කර නැවත වෛද්‍ය සැපයුම් අංශය වෙත භාර දෙනු ලබයි. එසේ නිවැරදි කරගත නොහැකි අයිතම සැපයුම් කරුගෙන් අයකරගනු ලබයි. අදාල ක්‍රියාවලිය නිම වෙන තුරු මෙම තොග අප සන්තකයේ තබාගත යුතුය.

**ii. විකිණිය නොහැකි ඖෂධ**

**තොග සත්‍යාපන වාර්තාවට අනුව**

| **විකිණිය නොහැකි අයිතම-ප්‍රධාන ගබඩාව** | **වටිනාකම (රු)** |
|---|---|
| විගණන වාර්තාවට අනුව මළු එකතුව | 111,341,885.00 |
| විකිණිය නොහැකි අයිතම - (2012 වසර සඳහා) | (21,554,608.00) |
| ජර්නල වවුචර් අංක 485 - (2012 වසර) | 6,654,317.00 |
| එකතුව | 96,441,594.00 |
| නැවත පිටපත්වූ අයිතම | (3,325,212.00) |
| වෙන්කිරීම් තුල අන්තර්ගත නොවූ අයිතම | (419,080.00) |
| විනාශ කරනලද එහෙත් ලැයිස්තුවෙහි අන්තර්ගත අයිතම | (3,126,745.02) |
| 2013 වසරේදී ලැයිස්තුවෙන් ඉවත් කල එහෙත් ගිණුම්වල | |
| අන්තර්ගත අයිතම | 2,454,583.68 |
| | 92,025,140.66 |
| මෙම වටිනාකම වසර 2011 ලැයිස්තුව තුලින් අඩුකර ඇත | |
| අවසන් ගිණුම්වලට අනුව | |
| ලෙජර් ශේෂය (2012 වසර හැර) | 102,118,475.00 |
| දේශිය මිලදී ගැනුම් ඔසුසල (විනාශ නොකරන ලද වටිනාකම) | 1,897,750.69 |
| එකතුව | 100,220,724.31 |
| 2008 වසර තුල විනාශ කල අයිතම | (5,241,768.10) |
| | **94,978,956.21** |

මෙම වටිනාකම වෙන්කිරීම් තුල අන්තර්ගතදැයි හඳුනාගත නොහැකි නිසා ලෙජර් වටිනාකමින් අඩුකර නොමැත.

මේ අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අගය හා තොග සත්‍යාපන වාර්තාවල දක්වා තිබූ අගය අතර වෙනස රු 2,953,815.55 ක් වේ. විකිණිය නොහැකි ඖෂධ අතරින් රු 62,591.00 ක වටිනාකමින් යුත් අයිතම හානියට ලක්ව තිබූ බවට එකඟ වන අතර එය එසේ සිදුව ඇත්තේ එදිනෙදා සිදුකෙරෙන අභ්‍යන්තර මෙහෙයුම් කටයුතු හේතුවෙනි

එමෙන්ම රු 6,092,800.00ක වටිනාකමෙන් යුත් අයිතම කල් ඉකුත්ව තිබූ අතර ඉන් රු 3,4J3,985.48 ක වටිනාකමක් පියවා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත

තත්වයෙන් බාල ඖෂධ වෙනුවෙන් වන්දි අයකර ගැනීම සඳහා ආනයන අංශය අවශ්‍ය පියවර ගනිමින් පවති.

### 3.3.8 මානව සම්පත් කළමණාකරනය.

අ. ප්‍රායෝගික කරුණු මත පුරප්පාඩු පිරවීම ප්‍රමාද වී ඇත. ඒවායින් වැඩි ප්‍රමාණයක් 2013 වසර තුලදී පුරවා ඇත.

ආ. පුරප්පාඩු පිරවීම සම්බන්ධව මතු වූ ප්‍රායෝගික අපහසුතා නිසා ආයතනයේ කටයුතු පවත්වාගෙන යාමට වෙනත් විකල්පයක් නොවූ බැවින් මෙම තත්ත්වය ඇතිවී තිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය.

### 4.1 සංයුක්ත සැලැස්ම

2007 - 2011 වර්ෂයන් සඳහා සංයුක්ත සැලැස්මක් සහ 2008,2009,2010,2011 වර්ෂ වලට එක් එක් වර්ෂය සඳහා වෙන වෙනම ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කර ඇත.

තවද 2012 වර්ෂය සඳහාද 2007- 2011 දිගුවක් ලෙස වෙනමම ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ප්‍රගති සමාලෝචනයට භාජනය කර ඇත.

### 4.2 ක්‍රියාකාරී සැලැස්ම

**(අ)** 2012 වර්ෂය සඳහා පිළියෙල කල ක්‍රියාකාරී සැලැස්මේ පැහැදිලිව අදාල වගකීම් දරණ කලමණාකරුවන් සඳහන් කර ඇත. තවද එම කටයුතුවල සමස්ථ වගකීම පැවරෙන දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ නම්ද ඇතුලත් කර ඇත.

**(ආ)** කොලඹ 7 රසායනාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කෙරෙමින් පවතී. 2015 පෙබරවාරි වන විට වැඩ අවසන් කිරීමට නියමිතය.

කළමණාකරන තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමේදී ඊට අවශ්‍යකරන මානව සම්පත් සම්බන්ධයෙන් ගැටළු පැනනැගී තිබුණි. මේ වන විට ඒ සඳහා විශේෂ අනුමැතියක් යටතේ ව්‍යාපෘති කලමණාකාර වරියක් බඳවාගෙන එම කටයුත්ත කඩිනම් කර ඇත.

ක්‍රියාකාරී සැලැස්ම හඳුනා ගෙන තිබූ ස්ථානවලට අමතරව පසු අවස්ථාවලදී වෙනත් ප්‍රමුඛතා මතු වූ බැවින් ඒ අනුව 2011 වර්ෂය තුළ දී යාපනය, පොලොන්නරුව හා තංගල්ල යන ස්ථාන හඳුනා ගන්නා ලදී මේ අනුව දක්වා ඇති ස්ථාන වල නොවූව ද ප්‍රමුඛතා අනුව හඳුනා ගත් වෙනත් ස්ථාන තුනකට අදාලව ඔසුසල් 3 ක් සම්බන්ධයෙන් පියවර ගෙන ඇත.

### 4.3 අයවැය ලේඛණමය පාලනය

2011 වසර තුල වෙළඳ හා ආර්ථික තත්ත්වයන් හේතුවෙන් අයවැයගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර වෙනස් කම් පැවතිනි. නමුත් මාසික ගිණුම් වාර්තා මඟින් අයවැය ගත වියදම් හා තථ්‍ය වියදම් විශ්ලේෂණයක් සිදුකරන අතර අදාල විචලනයන්ට හේතු විමර්ශනය කර අදාල නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලබයි.



සභාපති

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව.

**රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව**
**මානව සම්පත් විශ්ලේෂණය**















## රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
## වසර දහයක සංඛ්‍යාත්මක තොරතුරු

| විස්තරය | 2012 රු.'000' | 2011 රු.'000' | 2010 රු.'000' | 2009 රු.'000' | 2008 රු.'000' | 2007 රු.'000' | 2006 රු.'000' | 2005 රු.'000' | 2004 රු.'000' | 2003 රු.'000' |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පිරිවැටුම - රා.ඖ.ස | 5,001,673 | 4,806,170 | 4,197,759 | 4,015,962 | 3,547,367 | 3,092,189 | 2,923,148 | 2,666,453 | 2,717,888 | 2,455,950 |
| පිරිවැටුම - රා.බෙ.ග | 16,608,492 | 12,569,290 | 10,968,571 | 9,990,429 | 9,306,330 | 8,815,971 | 5,616,899 | 5,360,046 | 4,067,138 | 4,770,693 |
| **මුළු පිරිවැටුම** | **21,610,165** | **17,375,460** | **15,166,330** | **14,006,391** | **12,853,697** | **11,908,160** | **8,540,047** | **8,026,499** | **6,785,026** | **7,226,643** |
| දළ වෙළඳ ලාභය - රා.ඖ.ස | 991,541 | 1,043,453 | 995,371 | 894,232 | 822,024 | 699,794 | 682,256 | 576,728 | 455,574 | 354,216 |
| දළ අතිරික්තය - රා.බෙ.ග | 1,193,214 | 780,735 | 688,145 | 622,071 | 576,308 | 578,091 | 389,533 | 407,187 | 281,257 | 405,943 |
| **අතිරික්තය** | **2,184,755** | **1,824,188** | **1,683,516** | **1,516,303** | **1,398,332** | **1,277,885** | **1,071,789** | **983,915** | **736,831** | **760,159** |
| වෙනත් ආදායම් | 15,105 | 23,231 | 20,414 | 18,107 | 22,638 | 14,177 | 10,025 | 12,264 | 5,807 | 10,381 |
| පොදුකාර්ය පිරිවැය | (654,910) | (614,019) | (605,475) | (573,322) | (535,428) | (483,452) | (434,075) | (348,910) | (295,837) | (242,214) |
| වෙනත් මෙහෙයුම් වියදම් | (745,230) | (492,631) | (285,777) | (203,520) | (218,987) | (111,390) | (56,397) | (92,470) | (36,099) | (81,463) |
| අයකර නොගත් සේවා ගාස්තු | | | | | | | (78,638) | | | |
| **මෙහෙයුම් ලාභය** | **799,720** | **740,769** | **812,678** | **757,568** | **666,555** | **697,220** | **512,704** | **554,799** | **410,702** | **446,863** |
| මූල්‍ය පිරිවැය | (17) | (3,661) | (17,734) | (8,841) | (7,982) | (7,480) | (6,397) | (5,390) | (5,893) | (6,526) |
| බැංකු අයිරා මත පොළී | (339,035) | (419,235) | (315,070) | (350,841) | (212,285) | (273,273) | (121,876) | (119,311) | (57,851) | (110,454) |
| **මුළු පොදුකාර්ය පිරිවැය** | **(1,739,192)** | **(1,529,546)** | **(1,224,056)** | **(1,136,524)** | **(974,682)** | **(875,595)** | **(618,745)** | **(566,081)** | **(395,680)** | **(440,657)** |
| මූල්‍ය ආදායම් | 3,944 | 4,102 | 3,900 | 3,302 | 2,856 | 2,127 | 1,432 | 1,285 | 1,385 | 1,287 |
| **බදු පෙර ලාභය** | **464,612** | **321,975** | **483,774** | **401,188** | **449,144** | **418,594** | **385,863** | **431,383** | **348,343** | **331,170** |
| ආදායම් බදු | 205,282 | 228,473 | 243,907 | 144,883 | 209,487 | 232,013 | 206,427 | 218,168 | 165,000 | 160,000 |
| අමතර විශේෂ අයිතම | | | | | | | (25) | | | |
| **වර්ෂය සඳහා ශුද්ධ ලාභය** | **259,330** | **93,502** | **239,867** | **256,305** | **239,657** | **186,581** | **179,411** | **213,215** | **183,343** | **171,170** |
| භාණ්ඩාගාර අයබදු | | (15,000) | (60,000) | (25,000) | (25,000) | | | | | |
| විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව | (14,281) | 11,325 | | | | | | | | |
| **එකතු විස්තිරණ ආදායම** | **245,049** | **89,827** | **179,867** | **231,305** | **214,657** | **186,581** | **179,411** | **213,215** | **183,343** | **171,170** |
| **දායක ප්‍රාග්ධනය හා සංචිත** | **3,747,656** | **3,502,607** | **3,412,780** | **2,418,452** | **2,217,690** | **1,960,458** | **1,744,855** | **1,591,225** | **1,136,262** | **929,838** |
| **ජංගම වත්කම්** | | | | | | | | | | |
| තොගය - රා.ඖ.ස | 1,079,939 | 887,456 | 874,018 | 652,167 | 833,303 | 726,578 | 603,455 | 486,592 | 418,393 | 420,418 |
| මාර්ගස්ථ තොගය -රෞ.බෙ.ග | 734,963 | 1,985,991 | 2,755,465 | 1,105,247 | 1,780,891 | 710,240 | | | | |
| - රා.ඖ.ස | 151,918 | 100,277 | 105,297 | 125,515 | 170,905 | 23,596 | 57127 | 31776 | 34472 | 18608 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු | 11,062,837 | 5,123,702 | 3,453,354 | 2,139,755 | 2,036,168 | 1,991,061 | 2,764,958 | 2,586,782 | 1,681,518 | 2,444,615 |
| තැන්පතු හා පෙර ගෙවීම් | 23,579 | 24,479 | 22,369 | 11,564 | 12,367 | 6,928 | 7,512 | 8,341 | 7,613 | 16,485 |
| අතැති මුදල් හා බංකු මුදල් | 216,359 | 600,807 | 671,104 | 263,769 | 250,660 | 480,787 | 192,511 | 349,191 | 145,023 | 73,082 |
| **මුළු ජංගම වත්කම්** | **13,269,595** | **8,722,712** | **7,881,607** | **4,298,017** | **5,084,294** | **3,939,190** | **3,625,563** | **3,462,682** | **2,287,019** | **2,973,208** |
| **ජංගම වගකීම්** | | | | | | | | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු | 3,016,959 | 1,784,156 | 1,551,401 | 739,514 | 544,979 | 645,448 | 667,851 | 456,014 | 383,839 | 647,897 |
| ගෙවිය යුතු ආදායම් බදු | 191,440 | 219,332 | 232,469 | 200,169 | 225,239 | 252,090 | 211,415 | 163,569 | 119,958 | 131,363 |
| විලම්බිත ආදායම් | 1,292 | 318 | 1,559 | | | | | | | |
| ජංගම මූල්‍ය වගකීම් | 7,896,709 | 4,716,655 | 4,131,544 | 1,458,538 | 2,596,234 | 1,588,509 | 1,476,648 | 1,756,156 | 844,561 | 1,467,289 |
| **සමස්ථ මූල්‍ය වගකීම** | **11,106,400** | **6,720,461** | **5,916,973** | **2,398,221** | **3,366,452** | **2,486,047** | **2,355,914** | **2,375,739** | **1,348,358** | **2,246,549** |
| ජංගම නොවන වත්කම් | 1,709,018 | 1,605,438 | 1,561,496 | 639,231 | 595,014 | 593,907 | 554,604 | 556,363 | 247,424 | 234,417 |
| ජංගම නොවන වගකීම් | 124,558 | 105,082 | 113,350 | 120,575 | 95,166 | 86,592 | 79,398 | 52,081 | 49,823 | 31,238 |
| **ශුද්ධ වත්කම්** | **3,747,655** | **3,502,607** | **3,412,780** | **2,418,452** | **2,217,690** | **1,960,458** | **1,744,855** | **1,591,225** | **1,136,262** | **929,838** |
| **මූලික අනුපාත** | | | | | | | | | | |
| දළ ලාභ අනුපාතය - රා.ඖ.ෂ (%) | 19.8 | 21.7 | 23.7 | 22.3 | 23.2 | 22.6 | 23.3 | 21.6 | 16.8 | 14.4 |
| දළ ලාභ අනුපාතය - රෞ.බෙ.ග (%) | 7.2 | 6.2 | 6.3 | 6.2 | 6.2 | 6.6 | 6.9 | 7.6 | 6.9 | 8.5 |
| දළ අතිරික්තයට විකුණුම් (%) | 10.1 | 10.5 | 11.1 | 10.8 | 10.9 | 10.7 | 12.6 | 12.3 | 10.9 | 10.5 |
| වත්කම් පිරිවැටුම් අනුපාතය (වාර) | 1:1.4 | 1:1.7 | 1:1.6 | 1:2.8 | 1:2.2 | 1:2.6 | 1:2.0 | 1:2.0 | 1:2.6 | 1:2.2 |
| වාර්ෂික විකුණුම් වර්ධනය (%) | 24.37 | 14.57 | 8.28 | 8.97 | 7.94 | 39.44 | 6.40 | 18.30 | -6.11 | 7.19 |
| ජංගම් අනුපාතය (වාර) | 1.19:1 | 1.31:1 | 1.33:1 | 1.79:1 | 1.51:1 | 1.58:1 | 1.54:1 | 1.46:1 | 1.7:1 | 1.32:1 |
| ද්‍රවශීලතා අනුපාතය (වාර) | 1.02:1 | 0.86:1 | 0.7:1 | 1:1 | 0.68:1 | 0.99:1 | 1.26:1 | 1.24:1 | 1.36:1 | 1.13:1 |
| පොලි ආවරණය (වාර) | 2.4 | 1.8 | 2.4 | 2.1 | 3.0 | 2.5 | 4.0 | 4.4 | 6.4 | 3.8 |
| තොගපිරිවැටුම් අනුපාතය (වාර) රා.ඖ.ෂ | 3.57 | 3.83 | 2.4 | 3.5 | 3.11 | 3.39 | 3.92 | 4.45 | 5.07 | 5.11 |

# විකුණුම් ජාලය

## ප්‍රධාන කාර්යාලය

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
75, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 01. ශ්‍රී ලංකාව.
දුරකථන: 2320356 – 9 ෆැක්ස්: 2447118 වෙබ් අඩවිය: www.spc.lk විද්‍යුත් තැපැල්: spc@spc.lk

**විකුණුම් අංශය**
109 කඳවල වත්ත
රත්මලාන.
දු.ක.2632288
ෆැක්ස්:2632962

**ගබඩාව**
109 කඳවල වත්ත
රත්මලාන.
දු.ක.2634318
ෆැක්ස්:2636715

**පිවිනි අංශය**
109 කඳවල වත්ත
රත්මලාන.
දු.ක.2634318

**මහනුවර ගබඩාව**
10/B/1, හේවාහැට පාර,
තැන්නේකුඹුර, මහනුවර.
දු.ක. 081-2240274

## රාජ්‍ය ඔසුසල්

**ඔසුසල කොළඹ 07**
255, ධර්මපාල මාවත,
කොළඹ 7.
දු.ක.2694716, 2672293

**ඔසුසල නුගේගොඩ**
145A/1,එස්.ද.එස්. ජයසිංහ
මාවත නුගේගොඩ
දු.ක.2856641

**ඔසුසල පානදුර**
159, MPCS ගොඩනැගිල්ල,
ගාලුපාර, පානදුර.
දු.ක.038-2234767

**නව ඔසුසල බදුල්ල**
සතොස ගොඩනැගිල්ල
බණ්ඩාරවෙල පාර,
බදුල්ල
දු.ක.055 2229837

**ඔසුසල කොළඹ 04**
85 ගාලු පාර,
කොළඹ 04.
දු.ක.2587128

**ඔසුසල හම්බන්තොට**
නො 3 බැරැක්ක විදිය,
හම්බන්තොට.
දු.ක.047-2222163

**ඔසුසල අම්පාර**
පන්සල් හන්දිය,
ඩී.එස්. සේනානායක මාවත,:
අම්පාර දු.ක.063-2223088

**ඔසුසල මාතර**
23බී වාරිකාරාමය
අනගාරික ධර්මපාල මාවත,
මාතර
දු.ක.041-2231871

**ඔසුසල කොළඹ 01**
75 ශ්‍රීමත් බාරොන් ජයතිලක
මාවත
කොළඹ 01.
දු.ක.2328046

**ඔසුසල අවිස්සාවේල්ල**
G 33/34/35,
මධ්‍යම වෙළඳපළ,
අවිස්සාවේල්ල
දු.ක.036-2222501

**ඔසුසල ගාල්ල**
61ඒ වක්වැල්ල පාර
ගාල්ල
දු.ක.091-2234726

**ඔසුසල මහනුවර**
14ඒ, ළමාගාර මාවත,
මහනුවර
දු.ක.081-2225175

**ඔසුසල රත්නපුර**
32 නන්ද එල්ලාවල මාවත,
රත්නපුර
දු.ක.045-2223014

**ඔසුසල මිනුවන්ගොඩ**
24. පරණ නගරසභා
ගොඩනැගිල්ල
කොළඹ පාර,
මිනුවන්ගොඩ. දු.ක.2295120

**ඔසුසල මීගොඩ**
ආර්ථික මධ්‍යස්ථානය,
මීගොඩ
දු.ක.2831920

**ඔසුසල කුරුණෑගල**
28,වීරතුංග ගොඩනැගිල්ල,
බෞද්ධාලෝක මාවත,
කුරුණෑගල
දු.ක.037-2230840

**ඔසුසල අනුරාධපුර**
බැංකු විදිය
අනුරාධපුර
දු.ක.025-2222181

**ඔසුසල මහරගම**
71/9 අල්විස් ගොඩනැගිල්ල
පරණ පාර, මහරගම.
දු.ක.2745640

**ඔසුසල ජයවර්ධනපුර**
ශ්‍රී ජයවර්ධනපුර රෝහල,
ශ්‍රී ජයවර්ධනපුර
දු.ක.2779414

**ඔසුසල කරාපිටිය**
132, පිළිකා රෝහල පාර,
මාඉටිපේ, පළමු විදිය,
කරාපිටිය
දු.ක.091 2226947

**ඔසුසල දියතලාව**
කෙලින් විදිය
දියතලාව
දු.ක.055- 3551624

**ඔසුසල මීගමුව**
නො. 134, කොළඹ පාර,
මීගමුව
දු.ක.031- 2228599

**ඔසුසල යාපනය**
149A, කේ.කේ.එස්.පාර,
යාපනය
දු.ක. 021- 2219262

**ඔසුසල පොළොන්නරුව**
රෝහල හන්දිය,
කදුරුවෙළ පාර,
පොළොන්නරුව
දු.ක.027 2225465

**ඔසුසල තංගල්ල**
උංක 8 ඉදිපොකුණුගොඩ
පාර, තංගල්ල
දු.ක.047 2241221

**ඔසුසල රාගම**
අංක 61ඒ, මහබාගෙ පාර,
රාගම
දු.ක. 2955219

# අලෙවි හා විකුණුම් අංශය

නො 75, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01. දුරකථන : 2430778,2328507,2320356 - 9